FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

# රංගිරි ශ්‍රී ලංකා

RANGIRI SRI LANKA NEWSPAPER



FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු



ශ්‍රී.බු.ව. 2565- ක්‍රි.ව. 2021
ජූලි (ඇසළ)

මාසික බෞද්ධ සාර සංග්‍රහය - අන්තර්ජාල කලාපය

32






රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය

UHF CH 60
PEO TV CH 22
Dialog Tv 21
Dish Tv 2532

RSL TELEVISION

රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය
දේශයේ රන් හඬ

RSL RADIO

FM 104.4 - 105.7

වෙබ් : www.rangirisrilanka.lk



රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ ප්‍රකාශනයකි.

රංගිරි ශ්‍රී ලංකා
RSL NEWSPAPER





# ඇසළ පෝය වර්ණනාව

ශාසන ඉතිහාසයට සම්බන්ධ වැදගත් කරුණු බෞද්ධ ජනතාවට වැදගත් දිනයක් ලෙස සැළකේ. එනම්, බුද්ධාංතුරයෙකු වශයෙන් (බෝධිසත්වයෙකු) තුසිත දෙව්ලොව වාසයකළ බෝසතාණෝ මහා බ්‍රහ්මයාගේ ආරාධනාවෙන් මනුලොවට පැමිණ ''මහාමායා දේවියගේ කුස පිළිසිඳ ගැනීම පළමුවන කරුණ ලෙස සැළකේ.වෙසක් පොහෝදින උපත ලැබූ බෝසතාණෝ ''සිදුහත්'' යන විශේෂ නාමයෙන් හැඳින්විනි.ළමා කාලයත්, තරුණ කාලයත් සතුටින් ගෙවා සතර පෙර නිමිති හා නාටිකාවන්ගේ විප්‍රකාර දැක සිටි අවස්ථාවේ ''රාහුල'' පුතුගේ උපත සිදුවිය. මෙම සිද්ධීන් නිසා ජීවිතය කෙරෙහි කළකිරී ඇසළ පොහෝ දින ගිහි ගෙයින් පිටත් විය. මෙය දෙවන කරුණ ලෙස සැළකේ. වනගත වූ බෝසතාණන් සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කොට එයින් පසු මධ්‍යම ප්‍රතිපදාව අනුගමනයෙන් පසු සත්‍ය අවබෝධය ලබාගෙන බුද්ධත්වයට පත්ව තමන් වහන්සේ අවබෝධ කරගත් ධර්මය පළමුව උදව් උපකාරීව සිටි පස්වග තවුසන් වෙතට ඉසිපතනාරාමයට වැඩම කළ බුදුරජාණන් වහන්සේ ''දම්සක්'' පැවතුම් සූත්‍රයෙන් පස්වග තවුසන්ට දහම් දෙසුවේ ද ඇසළ පොහෝ දිනකය.මෙම පළමුවන ධර්ම දේශනාව බුදු දහමෙහි හරය ලෙස සැළකේ.

මෙයින් පසු ආරම්භ වූ ''භික්ෂු සමාජය'' පළමුවරට වස් විසීම ආරම්භ වූයේ ද ඇසළ පොහෝ දිනකය. මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩමවීමෙන් පසු ආරම්භවන භික්ෂු සමාජය වස් සමාදන්වීමත් අරිට්ඨ ඇමැති ඇතුළු රාජකීය පිරිස පැවිදි වන්නේද ඇසළ පොහොය දිනකය. මිහිඳු මහරහතන් වහන්සේගේ අනුශාසනා පරිදි භික්ෂූන්ගේ වාසය පිණිස දෙවනපෑතිස් රජතුමා මිහින්තලාව අවට පිහිටි ලෙන් සකස් කොට භික්ෂූන්ට පූජා කරන්නේද ඇසළ පොහෝ දිනකය. සිරිලක එක්සේසත් කළ දුටුගැමුණු රජතුමා රුවන්වැලි මහාසෑයට මුල්ගල් තබන්නේද කිතිසිරිමෙවන් රජතුමා දවස මෙරටට වැඩම කරන ලද දන්තධාතූන් වහන්සේ වෙනුවෙන් ''දළදා පෙරහරක්'' ආරම්භ වන්නේද ඇසළ පොහෝ දිනකවීම ඉතා වැදගත් සිදුවීමකි. ජයවර්ධනපුර පෙරහැර, අළුත්ගම, නවගමුව, දෙවුන්දර, රත්නපුර සමන්දේවාලය යන පූජනීය ස්ථානයන්හි පෙරහැර රැසක් ආරම්භ වූයේද ඇසළ පොහොය මූලික කරගෙනය.කන්ද උඩරට රාජ්‍ය කළ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා අයෝධ්‍යාපුරයේ ධාර්මික නම් රජු වෙතට රාජකීය දූතයන් යවා උපාලි අරියමුණි තෙරුන් ප්‍රධාන වහන්සේලා මගින් මෙරට සංඝ සමාජය යළි සංශෝධනය කර නිර්මල බුදුදහම චිරස්ථායි කරන ලද්දේද ඇසළ පොහෝ දිනකය.ලංකාවාසී බෞද්ධ ජනතාව මෙම උතුම් පොහොය දින විහාරස්ථාන කරාගොස් ආමිස මෙන්ම ප්‍රතිපත්ති පූජාවල යෙදෙමින් කුසල් දහම් රැස්කර ගනිති.

**ඇම්.ඩී.විජයවර්ධන**

## පුදබිමක අසිරිය

# දුවේගල රජමහා විහාරය

මෙම ඓතිහාසික පුදබිම තමන්කඩුව පලාතට අයත් දිඹුලාගල යක්කුරේ ග්‍රාම සීමාවේ පිහිටා තිබේ.මහවැලි ගඟ සහ මාදුරුඔය යන ගංගාවන් අතරට අයත්ව තිබීම විශේෂත්වයකි. ජලය ඉතා හොඳින් පවතින බැවින් සරුසාර භූමි භාගයකට නෑකම් කියයි.ක්‍රි.පූ.5වන සියවස දක්වා විහිදුන ඉතිහාසගත තොරතුරු මෙම ප්‍රදේශයේ පවතී.පණ්ඩුකාභය කුමරා මෙම ප්‍රදේශයේ ජීවත් වූ බවට සාධක තිබේ. දොළුගල හා දිඹුලාගල අතර විවිධ අවස්ථාවලදී පණ්ඩුකාභය කුමරු හා එහි සිටි ජනතාව අතර සටන් පැවැති බවට තොරතුරු මහාවංශයේ සඳහන් වේ. මහින්ද්‍රගමනයට පෙර සිටම ජනාවාස වූ ප්‍රදේශයක් වන අතර විහාරයක් ගැනද තොරතුරු මෙහි ඇති ලෙන් ලිපියකින් අනාවරණය වෙයි. මෙම ස්ථානයට සිදුකරන ලද ප්‍රදානයක් ගැන  ලිපියක තොරතුරු සඳහන් වේ. ලජ්ජතිස්ස රජු දවස මෙම පුදබිම දියුණු තත්වයක පැවැති බවට කරුණු සඳහන්ව තිබේ.

මෙම විහාරයට වැව් හතරක් හා ඇලක්ද පූජාකර එම ආදායම විහාරයේ දියුණුවට යෙද වූ බව ඉතිහාසගත තොරතුරුවල දැක්වේ. මහාපැරකුම්බා රජු දවස මෙම ප්‍රදේශය සංවර්ධනය කර තිබූ බවට ඉතිහාසයෙහි සඳහන්ව ඇත.වර්තමානය වනවිට මෙම ස්ථානය නටඹුන් සහිත පිං බිමකි. මෙම නටඹුන් අතර ස්ථූපයක්ද එක පේළියට සිටවා ගල්කණු සමූහයක් ද ශෛලමය ආසන සිරිපතුල්ද පධානඝරයකට අයත් නටඹුන් සමූහයක්ද හමු වී තිබේ. නෙළුම් පෙති වලින් අලංකාර වූ ආසනඝරයක් ද ඒ අසල හිටි පිළිමයක් පැවැති බවට සාධක හමු වී තිබේ. ආසන්නයේ පිහිටි පර්වතයෙහි ලෙන් කිහිපයක් ද හමු වී ඇති අතර එහි බ්‍රාහ්මී අක්ෂර සහිත ලිපිද කොටා තිබේ. මෙම ස්ථානය ක්‍රි.පූ. මුල් යුගයේ සිටම ක්ෂේම භූමියක් වශයෙන් පැවැති බවයි. විවිධ සතුරු උවදුරුවලට භාජනය වී ඇති මෙම ස්ථානය පෞරාණික වටිනාකමක් ගෙනහැර දක්වයි. වර්තමානයේ මෙම පුදබිම නැරඹීමට පැමිණෙන බෞද්ධ ජනතාව මෙහි ඇති පෞරාණිකත්වය ආරක්ෂා කළ යුතු වන්නේය. එය අප රටේ අනාගත පරපුර සඳහා සිදුකරන වගකීම් සහිත ක්‍රියාවකි.

**විජය තලවත්තේගෙදර**



## ඇසල පොහොය දින වැදගත්කම

1. බෝසත් කුමරු මව්කුස පිළිසිඳ ගැනීම.
2. අභිනිෂ්ක්‍රමණය සිදුවීම.
3. පළමු මංගල ධර්ම දේශනය පැවැත්වීම.
4. පළමු ධර්ම සංගායනාව පැවැත්වීම.
5. කොණ්ඩඤ්ඤ තවුසා සෝවාන් වීම.
6. භික්ෂූන් වහන්සේලා පෙර වස් විසීම.
7. රාහුල කුමරුගේ උපත සිදුවීම.
8. ගන්ධබ්බ රුක්ඛ මූලයේදී යමාමහ පෙළහැර පෑම.
9. කීර්ති ශ්‍රී රාජසිංහ රජු සියම් දේශයෙන් උපසම්පදාව ගෙන ඒම.

# ලෝ සත දුකින් එතෙර කිරීමට සියල් සම්පත් හැර දමූ මහා වීරයාණෝ



පින්සර ඇසළ මාසයේ නිලබර ඇසළ සඳ නැගෙන විට සිසිල් මදනල ගත දවටෙන විට ලෝසත වෙනුවෙන් තම සියල් සම්පත් අතහැර දමූ මහා වීරයාණ කෙනෙකුන්ගේ ජීවිතයේ සුවිශේෂී අවස්ථාවන් රැසක් අපේ මතකයට නැගී එයි. ඒ වීරයාණන් අන් කිසිවෙකුත් නොව මේ ලොවට උතුම් වූ සත්‍ය පහදා දුන් තිලෝගුරු බුදුරජාණන් වහන්සේ'ය. සරා සැකි කප් කෙළක් නොවිඳිනා දුක් විඳ සියලු සත්ත්වයන්ගේ යහපත වෙනුවෙන් උන් වහන්සේ දස පාරමිතාවන් සම්පූර්ණ කරමින් උතුම් බුදු පදවිය ලබා ගැනිමට සසර සැරි සැරූ බව ශාසන ඉතිහාසයේ සඳහන් වෙයි.

එදා දීපංකර පාද මූලයේදී තමා අතට පත් වූ නිවන් සැපත හැරදමා තමන් පමණක් නොව සියලු සත්ත්වයන්ට ඒ උතුම් නිවීම ලබාදෙන්නට නියත විවරණ ලබාගෙන සෝර සංසාරයේ බොහෝ ජාතිවල ඉපිද ඇස්, ඉස්, මස්, ලේ, අඹු දරුවන් දන් දෙමින් උතුම් බුදු බව පතා බෝසත් දම් පිරූ මහා බෝධිසත්ත්වයෝ අවසන වෙසතුරු අත් බැවින් මිදී තව්තිසා දෙව්ලොව උපන්හ. දෙව් ලොව දිව සැපත් විඳ ඉන් චුතව මිනිස් ලොව උපදින්නට දෙව් බඹුන්ගේ ආරාධනා ලැබූහ.

**" කාලෝ යං තෙ මහා වීර**
**උපපජ්ජ මාතු කුච්චියං**
**සදෙවකං තාරයංතෝ**
**බුජ්ඣස්සු අමතං පදං"**

"මහා වීරයාණෙනි, මිනිස් ලොව මව් කුස ඉපිද දෙවියන් සහිත මිනිසුන් සසර දුකින් එතෙර කරනු පිණිස නිවන අවබෝධ කර ගැනීමට මේ සුදුසු කාලයයි."

මෙසේ ඒ ආරාධනාව පිළිගෙන මනු ලොව උපදින්නට කාලය, දීපය, දේශය, කුලය සහ මව යන පස් මහ බැලුම් බලා දඹදිව කිඹුල්වත් පුර ශාක්‍ය වංශයේ සුද්ධෝදන රජුගේ පින්වත් බිසව මහා මායා දේවියගේ කුස පිළිසිඳ ගත්හ. ඒ මේ උතුම් ඇසළ පෝය දිනයේය. මහාමායා දේවියට එය සුදු නෙකලුමක් සොඬින් ගත් ඇත් පැටවකුගේ විලාශයකින් එය සිහිනයෙන් පෙන්නුම් කළේය. සිහිනයේ පලාපල විමසූ විට දන ගැනීමට ලැබුණේ පින්වත් කුමරෙකු කුස පිළිසිඳගෙන ඇති බවයි.

කාලය සපිරීමෙන් වෙසක් පුන් පොහෝ දිනක බෝසත් පුතු උපත ලදහ. "මෙය මාගේ අවසන් උපත" බව සඳහන් කරමින් සත් පියුම් මත බෝසතුන් මෙලොව එළිය දුටහ. ඉන්පසු දෙදොවුන් රජ තම පුතුට උගත් බමුණු පඬිවරුන් ගෙන්වා බෝසත් කුමරුගේ දේහ ලක්ෂණ බලා "ලොවට අර්ථයක් සිදු කරන්නා" යන අර්ථයෙන් "සිද්ධාර්ථ" යැයි නම් තැබූහ. මේ සිද්ධාර්ථයන් ඉපදී දින හතකින් මහාමායා දේවි තොමෝ කලුරිය කළහ. ඉන් අනතුරුව දේවියගේ නැගණිය වූ ගෝතමී දේවියගේ මව් සෙනෙහස යටතේ හැදුන වැඩුණ සිදුහත් කුමරු නිසි වයස් පැමිණ ශිල්ප උගත්තේය. වයස අවුරුදු 16 දී සුප්‍රබුද්ධ රජුගේ රූමත් යශෝධරා දියණිය සමඟ විවාහ විය.

ගිහිව සිටියහොත් සක්විති රජ වන බවට හා පැවිදි වුවහොත් බුදු බව ලබන බවට බමුණන් පැවසූ අනාවැකය පියරජුගේ එකම බලාපොරොත්තුව වූයේ තම පුතු සක්විති රජකු වනු දැකීමටය. ඒ නිසාම ගිහි ජීවිතය අතිශයින් සැපවත් ජීවිතයක් බවට පත් කිරීමටත් සිත කළ කිරීමට පත්වන කිසිවක් නොදැකීමටත්, කිසිඳු අඩුපාඩුවක් නොදැනීමටත් මංපෙත් විවර කරදීමට සුදොවුන් රජුට හැකිවිය. රම්‍ය, සුරම්‍ය, සුභ යනුවෙන් කාලත්‍රයටම සුදුසු මාළිගා තුනක් විය. දෙවඟනක් වැනි රූසිරෙන් යුත් යශෝදරා නම් බිරිදක විය.

මේ සැප සම්පත් විඳිමින් ගෙවන ඒකාකාරී ජීවිතයට කුමරු ප්‍රිය නොකළේය. දිනක් ඔහු ඡන්න ඇමති ද සමඟින් උයන් කෙළි පිණිස මාළිගයෙන් නික්ම ගියේය. ඒ ගමන අතරමගදී කුමරුට කිසිදා නොදුටු රුවක් හමුවිය. සැරයටියක් අතින් ගෙන වක ගැසුණු සිරුරින් ඉතා සෙමින් ගමන් කරන මහල්ලෙකුගේ දසුනකි. කුමරු එය රථාචාර්යාගෙන් විමසූ විට ලැබුණ පිළිතුර වූයේ අප සේම ඉපිද දූන් මහලු වියට පත් පුද්ගලයෙක් බවයි.

එය මිනිස් ලොව උපන් සැම කෙනෙකුට ම පොදු වූ ධර්මතාවයක් බවද දැනගන්නට ලැබිණි. මෙය දැනගත් සිද්ධාර්ත කුමරුට තවත් ටික දුරක් ගමන් කරන විට ඉතා අමාරුවෙන්, වේදනාවෙන් සිටින ලෙඩෙකු හමුවිය. එය ද කන්නගෙන් විමසූ විට අසන්නට ලැබුණේ එයද සැම කෙනෙකුටම පොදු ධර්මතාවක් බවය. එමෙන් ම මළමිණියක් ගෙනයමින් හඬා වැලපෙන පිරිසක් දුටු කුමරුට එයද සැමට පොදු ධර්මතාවයක් බවටත් ඉන් මිදීමට කිසි අයෙකුටත් නොහැකි බවටත් පිළිතුරු ලැබිණි. කල්පනාවේ නිමග්නව මේ දුකින් මිදීමට නිදහස් වීමට මඟ කෙසේ දැයි යන්නට පිළිතුරු සොයන්නට කුමරු වෙහෙසුණේය. සිත නිවන සන්සුන් ගමනින් වඩින උතුමකුගේ පැවිදි රුවක් දුටුකුමරුගේ සිත පැහැදුණේය. සැනසුණේය. මේ සියල්ල බලා කුමරු නැවත මාළිගයට ගියේය. ඒ මේ මහලුවීමට, ලෙඩවීමට, මරණයට පත් නොවී ඉන් මිදෙන මඟක් සොයන්නේ කෙසේදැයි කල්පනා කරමිනි.

තවත් දිනෙක උයන් කෙළි පිණිස ගොස් සිටින කුමරුට දූතයෙකු පිණිවිඩයක් රැගෙන ආවේය. ඒ යශෝධරාවෝ පුතකු බිහිකළ බවට ගෙන ආ පණිවිඩයයි. සිදුහතුන්ට එය ඇසූ විගස

"රාහුලෝ ජාතෝ බන්දනංජාතං"

(රාහුලයෙක් උපන්නා. බැඳීමක් ඇති වුණා) යනුවෙන් කියවුණහ. උයන් කෙළි නවතා තම මාළිගයට යන අතරමගදී කිසා ගොතමියගේ නිබ්බුත පද අසා කලකිරුණු සිත මඳක් සැනසුණත් තමාගේ බිරිඳ, දරුවා, දෙමාපියන් තමාගේ කරදරකාරී බැඳීම් බවට පත්විය.

එදින සවස් කාලයේ දීත් පුරුදු ලෙසින් ම නාටිකාංගනාවෝ කුමරු සතුටු කිරිමට නැටුම් ගැයුම් වැයුම්හි නිරත වූහ. ඉන් ද කුමරුට කිසිඳු සතුටක් ඇති නොවීය. කුමරු මැදියම් රැයේදී නෙතු හැර බලන විට නලඟනන් සිටි තැන්වලම අපිළිවෙලට නින්දට ගොස් සිටියේය. මන්ද අතිශයින් කළකිරීමට පත් සිදුහත් කුමරු ගිහි ගෙයින් නික්ම යෑමට සිතා ගත්හ.

එදා ඇසළ පුන් පොහෝ දිනකි. සඳ රැස් රැස ආලෝක කරමින් තිබිණ. ඡන්න ඇමති අමතා කන්ථක අසු සූදානම් කරන ලෙස ඉල්ලා සිටියහ. ගමනට සූදානම්ව යශෝදරාවගේ යහන් ගැබට එබී බලා සුරතල් රාහුල පුතු මව් තුරුලේ නිදා සිටින අයුරු දැක සිප ගන්නට සතක් ආවත් එයද මැඩගෙන මේ දරුවාටත්, යශෝදරාවටත් මෙන් ම සියලු ම සත්ත්වයන්ගේ යහපත වෙනුවෙන් උතුම් බුදු බව ලබාගෙන දුකින් එතෙර කරවමියි' යන අදහසින් මාළිගයෙන් පිටවිය. අනෝමා ගංතෙරට පැමිණි සිද්ධාර්ථයෝ තම ආභරණ හා සළුපිළි සියල්ල ඡන්න ඇමතියන්ට ලබාදී පිය රජු ඇතුළු පිරිසට තමා මෙහි පැමිණි බව දන්වා සිටින මෙන් ඉල්ලා සිටියහ.

යස ඉසුරින් පිරි සියල් රජ සැප හැර දමා සියලු සත්ත්වයන්ට සංසාර දුකින් එතෙර කරන්නෙමියි යන අදහස කැටි කරගත් මහ බෝසත් උතුමන් ඒ දුකින් මිදෙන මඟ, ඒ සත්‍යය සොයා ආලාර කාලාම, උද්දකරාම පුත්ත වැනි ගුරුවරුන් සොයා ගිය මුත් තමා සොයන සත්‍යය එහි නොවී ය. තමාම ඒ සුවය දුකින් මිදීමේ මඟ සොයා ගන්නෙමි යි සිතූ බෝසතාණෝ දැඩි සැප අතහැර දමා තම සිරුරට අධික ලෙස දුක් දෙමින් සත්‍ය සොයා වෙහෙසුණේය. ශරීරයට අධික දුක් දීමත් අධික සැප දීමත් මගින් විමුක්තිය සොයා ගත නොහැකි බව අවබෝධ කරගත් බෝසතුන් අධික දුකත් නොදී අධික සැපත් නොදී මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කරන්නට විය. එයින් උන් වහන්සේට උතුම් සුවය, ලොව්තුරා බුදුබව ලබාගැනිමට හැකිවිය. එක් වෙසක් පෝ දිනක පෙර විසූ කඳ පිළිවෙල දන්නා පුබ්බේ නිවාසානුස්මෘති ඥාණයත්, චුති හා උප්පත්ති දක්නා චුතුපපාත ඥාණයත් ආශ්‍රව ක්ෂය කිරීමේ ආසවක්ඛ්‍ය ඥාණයත් යන ත්‍රිවිද්‍යා උපදවාගෙන උතුම් වූ බුද්ධත්වයට පත් වූහ.

දුකත්, දුකට හේතුවත්, නිවීමත් ඉන් මිදීමේ මඟත් යන උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරගන්නේ සියල් සැප සම්පත් අතහැර දමා පැමිණි නිසාය. එක් ඇසළ පොහෝ දිනක තමා පළමුවෙන්ම මේ සත්‍යය ධර්මය දේශනා කරන්නේ කා හටද යන්න සිහිපත් කරන විට තමා පළමුවෙන්ම සොයා ගිය ආලාර කාලාම, උද්දකරාම පුත්ත ආදී ගුරුවරුන් කොහේදැයි බැලූවිට මේ ලොව ජීවතුන් අතර ඔවුන් නොමැති බව දැනගත්හ. පසුව තමා දුෂ්කර ක්‍රියා කරන සමයෙහි උවටැන් කළ කොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය, මහානාම, අස්සජී යන පස්වග තවුසන් සිහිපත් විය. ඔවුන් බරණැස ඉසිපතන මිගදායේ සිටින බව දැන එහි ගොස් ඔවුන්ට උතුම් වූ දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කළහ. ඉන් ලොව ප්‍රථම වතාවට සත්‍ය ලොවට දේශනා විය.

ඉපදීම,ලෙඩවීම, මහලුවීම, මරණය, අප්‍රියයන් හා එක්වීම, ප්‍රියයන්ගෙන් වෙන්වීම, කැමති දෑ නොලැබීම, ශෝකය, පරිදේව, දෝමනස්ස, උපායාස ආදී පංචස්කන්ධයම දුකක් බවත් ඒ දුකට හේතුව ඉපදීමත්, ඉපදීම නැති කිරීමේ මඟ ආර්ය අෂ්ඨාංගික මාර්ගය බවත්, ඉන් නිවන් සුවය අවබෝධ කරගත හැකි බවයි. ඇසළ පුන් පොහෝ දිනයේදී බුදු රජාණන් වහන්සේ ලොවට දේශනා කළහ.


ඒ දෙසූ දහම් මඟ, ගමන් කරමින් යහපත් දැක්මෙන්, යහපත් වූ කල්පනාවෙන්, වදනයෙන්, ක්‍රියාවෙන්, ජීවිතයෙන් උත්සාහයෙන්, සිහියෙන්, සිතෙහි එකඟතාවයෙන් යුතුව ඒ මහා වීරයාණන් දෙසූ ලෙෂ යහපත්ව ජීවත් වියයුතුය. ඉන් මොලොව හා පරලොව ජීවිතයේ යහපත අපට සාදාගත හැකිය.

මේ ආකාරයට ඇසළ පුන් පොහෝ දින සිදු වූ වැදගත්ම සිදුවීම් ලෙසට බෝධිසත්ත්වයන් වහන්සේගේ මව්කුස පිළිසිඳ ගැනීමත්, අභිනිෂ්ක්‍රමණයත්, ප්‍රථම ධර්ම දේශනාව පැවැත්වීමත් යන සිදුවීම් හඳුනාගත හැකිය.

එසේ නම් ලොවට උතුම් වූ සත්‍ය පහළ වූ මේ ඇසළ පුන් පොහෝ දිනයේදී ත්‍රිවිද්‍යා පුණ්‍ය ක්‍රියාවන්හි යෙදෙමින් දහම් මඟ යමින් අපගේ ජීවිත යහපත්ව හා නිවැරදිව ගත කිරීම ඒ මහා වීරයාණන් වූ බුදුන් වහන්සේට කරන ඉමහත් ගෞරවයක් බව පැවසිය යුතුමය. එසේ නිවැරදි පිළිවෙතකට ගමන් කිරීමට මේ පුන් පොහෝ දිනයේ බෞද්ධයන් වන අපි අදිටන් කර ගනිමු.

එස්. දිල්රුක්ෂි අබේකෝන්

# අතහැරීම



මධ්‍යම ප්‍රතිපදාව නම් වු ආර්ය අෂ්ඨාංගික මාර්ගය තෝරාගත් භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා සිවුවනක් පිරිස අන්ත දෙකක් අත්හල යුතුය. එනම් අත්තකිල මථානුයෝගය සහ කාමසුබල්ලිකානු යෝගයයි. එයම සම්බෝධි සඳහා නිර්වාණය සඳහා පාදක වේ. හේතු වේ. අපේක්ෂිත චිත්ත පාරිශුද්ධි භාවය ඇතිකර ගැනීම සඳහා ඉහත අන්තයන්ගෙන් දුෂ්කර වූත් අතහැරිමත් අනිත් අන්තය වු කාමභෝගී ජීවිතයක් අත් හැරීම කල යුතුය.

එහෙත් සාමාන්‍ය ජනයාට කාමභෝගී ජීවිතය අතහැරීම දුෂ්කරය. පැවිදි ජීවිතය ගත කිරීම අපහසුය. ඒ කෙසේ වෙතත් අත්හැරීම තුළින්මය සැනසීම උදාවන්නේ. (චාගෝ, පටිනිස්සග්ගො, මුත්ති, අනාලයෝ) ''සම්භාධෝ ඝරාවාසො රජාපථො අබ්භොකාසෝ පබ්බජ්ජා......'' කෙලෙස් දූවිලි වලින් වැසී ගිය මහ මගක් බඳු ගිහිගෙය සම්බාධක බහුලයි. පියාපත් බර පමණක් ඇති අහසේ සැරිසරන කුරුල්ලෙක් හා සමානයි පැවිද්ද.

සම්බෝධි පරායණ - සග්ග පරායණ නම් වු මාර්ග දෙකක් දහමේ සඳහන් වේ. ලාභ සත්කාර භවභෝග ලැබීමේ මාර්ගය එකකි. නිවන් ලැබීමේ මාර්ගය තව එකකි.

සත්වයා සසරට ඇද දමන මේ අල්ප ආශ්වාද ඇති මහත් ආදීනව ඇති ඉන්ද්‍රියන්ගේ ස්වභාවය ඇත්ත ඇති සැටියෙන් නොදකින නිසා අනිටු අනුසෝතය හෙවත් අසද්ධර්ම ප්‍රවාහය මෙසේ විස්තර කරති.

''ඉති භවා පනෙතං ආනන්ද

1.වේදනං පටිච්ච තණ්හා - වේදනාව නිසා තණ්හාව

2.තණ්හා විටිච්ච පරියේසනා - තණ්හාව නිසා සෙවීම

3.පරියෙසනං පටිච්ච ලාභො - සෙවීම නිසා ලැබීම

4.ලාභං පටිච්ච විනිච්ඡාසො - ලැබීම නිසා විමසීම

5.විනිච්ඡයං පටිච්ච චංදරාගො - විමසීම නිසා ඇලීම

6.චන්ද රාගං පටිච්ච අජ්ඣෝසානං - ඇලීම නිසා බැඳීම

7.අජ්ඣෙඩාසානං පටිච්ච පරිග්ගහො - බැඳීම නිසා අත්පත් කර ගැනීම

8.පරිග්ගහං පටිච්ච මච්ඡරියං - අත්පත් කොට ගැනීම නිසා මසුරුකම

9.මච්ඡරියං පටිච්ච ආරක්ඛො - මසුරු කම නිසා රැකීම

10.ආරක්ඛාධිකරණං පටිච්ච දණ්ඩා දාන - රැකීම නිසා දඬු මුගුරුවලින් ගැසීම

11.කලහ - කලහ කිරීම

12.නිග්ගහ - නිගහු කිරීම

13.විවාද - වාද කිරීම

14.කුවංතුවං - අනුම් බැනුම්

15.පේසුඤ්ඤ මුසාවාදා - හිස් වචන, බොරුව

16.අනෙක පාපකා - අකුසල් දහම් වැඩෙති

තණ්හාව නිසා සත්වයා සසර සැඩ පහරට හසු වී දුකට පත්වන බව බුද්ධිමත් ශ්‍රාවකයා වටහා ගෙන ශාන්තිනායකාණන් වහන්සේ පෙන්ව වදාළ මැදුම් පිළිවෙතට ඇතුලු විය යුතුය. ශ්‍රාවකයාගේ ප්‍රධාන පරමාර්ථය එකම ඉලක්කය මෙසේ භග්‍යවතුන් වහන්සේ පැහැදිළි කරති. මහණෙනි, ඔබගෙන් අන්‍යආගමික පරිබ්‍රාජක, කීර්තක ශ්‍රමණයෙක්, ඔබ ශ්‍රමණ භවත් ගෞතමයාණන් වහන්සේ වෙතගොස් කුමක් සඳහා බ්‍රහ්ම චාරීව වාසය කරන්නේ දැයි විමසු විට මෙසේ පිළිතුරු දෙන්න.

..ඇවැත්නි, රාග විරාගය සඳහාම භාග්‍යවතුන් වහන්සේ වෙත බ්‍රහ්මචාරීව වසමු.

..සංයෝජන බහාලීම සඳහා ප්‍රහාණය සඳහා භාගවතුන් වහන්සේ වෙත බ්‍රහ්මචාරීව වසමු.

..සාත්වල අප්‍රකටව පවත්නා රාගාදි කෙලෙස් මුලින් උපුටා දැමීම සඳහා භාග්‍යවතුන් වහන්සේ වෙත බ්‍රහ්මචාරීව වසමු.

..ඒ පිවිතුරු මාර්ගය දැන ගැනීම සඳහා භාග්‍යවතුන් වහන්සේ වෙත බ්‍රහ්මචාරීව වසමු.

..ඤාණ දර්ශනය සඳහා භාග්‍යවතුන් වහන්සේ වෙත බ්‍රහ්මචාරීව වසමු.

ඉතාමත්ම පැහැදිළිවම නිරවුල්ව ශාසනික පරමාර්ථ ශ්‍රාවකයාට ඉහත දැක්වු භාග්‍යවත් දර්ශනයෙන් වටහා ගත හැක.

ඉහතාත්මයෙහිම, මෙලොවදීම, දිට්ඨ ධම්මවේදනීය ප්‍රතිලාභ ලබාගත හැක. සත්‍ය පසක්කර ගත හැක ශාසන ගත වීම ජීවිතයෙන් ලායාමක් නොව සදාකාලික තණ්හා දාසත්වයෙන් මිදිමයි. මේ උත්මර්ථය සඳහා ''ධම්මදායාදා මේ භික්ඛවේ භවථ'' යනුවෙන් දහමම දායාද කරගන්නයි අනුදැන වදාළහ.

**''සබ්බ දුක්ඛ නිස්සරණ - නිබ්බාණ සච්ඡි කරනත්ථාය..........''**

යනුවෙන් අදිටන්කර ශාසනයට ඇතුලු වන ශ්‍රාවකයා ලාභාපෙක්ෂාවෙන් තොරව කීර්ති ප්‍රසංසාවෙන් තොරව ධර්ම ගරුකව, විනය ගරුකව ජීවත් විය යුතුය. ආමිසයට නැඹුරුවීමෙන් වන හානිය නිසා ''මා ආමිස දායාදා'' ආමිසය නොගත යුතුයි වදාලහ. එසේ වනුයේ ලෝකොත්තර ආර්ය ඵල කෙසේ වෙතත් සාමාන්‍ය මිනිස් ගුණ ධර්ම පවා තමා තුළින් පලායන බැවිනි.

ලාභ සත්කාර මිතුරු වෙසින් පැමිණෙන හතුරෙකි.

**''දාරුණො භික්ඛවේ ලාභාසක්කාර සිලොකො ලාභ සත්කාර සිලොකො භික්ඛවේ ඡවිං ඡින්දති. ඡවිං ඡෙත්වා චම්මං ඡින්දති. චම්මං චෙත්වා මංසං ඡින්දති. මංසං ඡෙත්වා නහාරුං ඡින්දති. නහාරුං ඡෙත්වා අට්ඨිං ඡින්දති. අට්ඨිං ඡෙත්වා අට්ඨිමිඤ්ජං ආහච්ච තිට්ඨති''**

මහණෙනි, ලාභ සත්කාර සිවිය කාගෙන යයි. සිඳලයි. සිවිය සිඳ සම කාගෙන යයි. සිඳලයි. සම සිඳ මස් කාගෙන යයි. සිඳලයි. මස් සිද නහර කාගෙන යයි. සිඳලයි. නහර සිදගෙන ඇට කාගෙන යයි. සිඳලයි. ඇට සිඳ ඇට මිදුලු විනිවිද ගොස් නවතී. මහණෙනි, ලාභසත්කාර කීර්ති ප්‍රසංශා, දරුණුය. නපුරුය.

අල්පේච්ඡ සරල ජීවිතයේ වටිනාකම වඩාත් පැහැදිළි කරන ඉහත දේශනා පාඨය මගින් සාමාන්‍ය ජනතාවට නොපෙනෙන පැත්ත පෙන්වා දෙති. මේ බුද්ධ අනුශාසනාව සත්‍යාවබෝධය සඳහා කදිම මග පෙන්වීමකි.

පූජ්‍ය පණ්ඩිත ගම්පහ සිරි සීවලී හිමි



# ඇසළ පොහොයෙන් සඳහම් මඟට

**සමස්ථ ලෝකවාසී බෞද්ධ ජන හද මඩල බුද්ධාලම්බන ප්‍රීතියෙන් ඔදවැඩී යන දිනයකි ඇසල පුන්පොහෝදා බෞද්ධ සාහිත්‍ය තුල විශේෂ සිදුවීම් රැසක් සිදු වූ දිනයක් බැවිනි. එනම්,**

01. ලොව්තුරා සම්මා සම්බුද්ධ රාජ්‍ය ප්‍රාර්ථනයෙන් සාරා සංඛ්‍ය කල්ප ලක්‍ෂයක් දානාදි සමතිංශත් පාරමී දම් සපුරා සුදුසු කාලය පැමිණෙන තුරු තව්තිසා දෙව් භවනේ දෙව් සැප වලදමින් සිටි බෝසත් දෙව්රජ කාලෝ යං තෙ මහාවීර...ආදී වශයෙන් බෝසත් දෙව්වරුනි මනුලොව ඉපිද ලොව්තුරා සම්බුදුව දෙව්මිනිසුන් සසරින් එතර කරවීමට මේ කාළයයි" යනුවෙන් දෙවියන් කළ ආරාධනය ඇතිවපංච මහා විලෝකනය (පස්මහ බැලුම්) කොට සුදෝවුන් මහරජුට දාව මහමායා දේවියගේ කුස පිළිසිද ගන්නේ ඇසළ පුන් පොහෝ දිනයි.

02. සකළ ශිල්පයේ කෙළ පැමිණ දහසය විය සපිරුන සිදුහත් කුමරු යසෝදරාවන් හා විවාහ වී රජ සැපත් ලැබ වසර 13 කින් රාහුල පුතුන් ඉපදීමෙන් පසු සතර පෙර නිවිති දැක, ජීවිතයේ නියම තතු වටහාගෙන ජරා, මරණ, දුක්, දොම්නස් දුරලීමට ඉපදීම නැතිකළ යුතු යැයි නුවණින් දැන , ලැබගෙන තිබුණ රජ සැපත් ලැබෙන්නට තිබූ සක්විති රජ සැපත් එදිනම ලැබුණු දරු සම්පතත් ඇතුලු සියළු දේ අලුයම ලූ කෙළ පිඩක් සේ අතැර මහා අභිණිෂ්ක්‍රමණය කළෙද ඇසළ පුන් පොහෝ දිනයකය.

03. වෙසක් පුන් පොහෝ දින ලොව්තුරා සම්මා සම්බුද්ධත්වය ලැබ සති හතක් පුරාවට නැවත ඒ අවබෝධ කලා වූ ධර්මය ප්‍රතීත්‍ය සමුත්පාද වශයෙන් මෙනෙහි කර මින් සත්‍ය, කෘත්‍ය, කෘත වශයෙන් දොළොස් ආකාරයකින්ම ප්‍රත්‍යක්‍ෂ කිරීමෙන් අනතුරුව සහම්පතී මහා බ්‍රහ්මයාගේ ආරාධනයක් ඇතිව බරණැස ඉසිපත මිගදායේදී පස්වග මහණුන් අරඹයා සමස්ථ බුදු දහමේ සාරය වූ ධම්ම චක්කප්පවත්තන සූත්‍රය " නම් මංගල දම් දෙසුම දේශනා කළේද ඇසල පුන් පොහෝ දිනකය.

04. දම්සක් දෙසුම ශ්‍රවනය කළ පිරිස අතුරෙහි කොණ්ඩඤ්ඤ තාපස තුමා සක්කාය දිට්ඨිය, විචිකිච්ඡාව, සීලබ්බත පරාමාස යන භවගාමී සංයෝජනයන් තුනක් ප්‍රහීන කොට සම්බුදු දහමේ සිසිල හඳමඩලට එකතු කර ගනිමින් සෝවාන් ඵලය ලැබීම ද මේ පොහොය දින සිදු වූ සුවිශේෂී සිද්ධියකි.

05. වෙසක් පුන් පොහෝ දින ලොව්තුරා සම්මා සම්බුද්ධත්වය ලැබ අනෙක ජාතී සංසාරං......" ආදී වශයෙන් සසර ඇවිදිමින් අනේක විධ විදි දුක් අවසන් කළ බව ප්‍රකාශ කරමින් ප්‍රථම ප්‍රීති වාක්‍ය දේශනා කළ බව සම්බුදු පියාණෝ කොණ්ඩඤ්ඤ තවුස්තුමා ධර්මය අවබෝධ කර සොවාන් මාගීඵල නුවණ ලැබීමෙන් ද ලැබුවේ ඉමහත් සතුටකි. මා ඉතා අමාරුවෙන් අවබෝධ කරගත් මේ නිවන් මාගීයට කොණ්ඩඤ්ඤද පැමිණියේය. යනුවෙන්

**"අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤො අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤොති ඉතිහිදං ආයසමතො කොණ්ඩඤ්ඤ අඤ්ඤා කොණ්ඩඤ්ඤොත්වෙව නාමං අහොසි"**

යනුවෙන් සම්බුදු දහම අවබෝධකළ ඔබට මම ප්‍රඥාවෙන් යුක්ත වූ (අඤ්ඤා) කොණ්ඩඤ්ඤ යනුවෙන් නම් කරනවා යැයි ප්‍රීති වාක්‍ය දේශනා කිරීමත් ඇසළ පුන් පොහෝ දින සිදු වූ වටිනා සිද්ධියකි.

06. ලාභ සත්කාර ලැබීම වස් තම තමන් ශ්‍රේෂ්ඨ ශාස්තෘවරුයැයි පවසමින් ලොව මුලාවට පත් කරමින් සිටි, බුදුපියාණන් වහන්සේගේ සමකාලීන ශාස්තෘවරු වූ පූර්ණ කාශ්‍යප, මක්ඛලීකෝසල, අජිත කේෂකම්බල, පකුධ කත්‍යායන, සංජය බෙල්ලට්ඨී පුත්ත, නිඝන්ඨනාථ පුත්ත යන තීර්ථකයන් හයදෙනාගේ මානයන් බිදලමින් තේජෝ කසිනයට සමවැද යමාමහ පෙළහර පා මොවුන් හය දෙනා දමනය කොට නිවැරදි මග ගෙනහැර පා වදාළේද ඇසළ පුන්පෝහෝ දිනකය.

07. බුදුබව ලබන බෝසත්වරයකු ලොවට දායාද කිරීමේ මහා භාග්‍ය හිමිකරගත් මහාමායා දේවීතොමෝ බෝසත් කුමරු ඉපදී දින 7 කින් මියගොස් තව්තිසා දෙව්භවනේ මාතෘ" නමින් දෙව්රජව ඉපදි සිටි කල්හී දෙමවුපිය ගුණ සම්බුදු ගුණයෙහිලා දෙසූ බුදුපියාණෝ මාතෘ දිව්‍යරාජයාට සම්බුදු දහමින් උවටැන් කිරීම් වස් තව්තිසා දෙව්බවනට වැඩ තෙමසක් පුරා විජම්බණ (අභිධර්මය) දෙසුම ආරම්භ කළේද ඇසළ පුන් පොහෝ දිනකය.

08. ලොව්තුරා සම්මා සම්බුදු පියාණන් වහන්සේ 45 වසක් පුරාවට දම් දෙසා ඒ බුදුපියාණන් වහන්සේ සමීපයේ ශ්‍රීමුඛ දේශනාව අසා අමාමහ නිවන් දැකීමට පාරමීදම් පිරූ සිව්වනක් පිරිස අමා නිවනට පමුණුවා සියළු සංස්කාර ධර්මයෝ අනිත්‍ය යැයි දෙසූ දහම සනාථ කරමින් වෙසක් පුන් පොහෝ දිනක මා විසින් දේශනා කොට වදාළ ශ්‍රී සද් දහම මගේ ඇවෑමෙන් ඔබලාට ශාස්තෘ වන්නේයැයි" වදාරමින් පිරිනිවන් පා වදාළ බැවින් අපට ශාස්තෘ වූ නවලෝකෝත්තර ශ්‍රී සද්ධර්මයේ පිරිසිදු බව, නිරවුල් බව, ආරක්ෂාව පිණිස තෘතීය මහා ශ්‍රාවක කාශ්‍යප මහ රහතන් වහන්සේ විසින් මහ රහතන් වහන්සේලා 500ක් සමඟ අජාසත් රජුගේ පූර්ණ අනුග්‍රහය ඇතිව රජගහනුවර වෝහාර පර්වත ප්‍රාන්තයේ සප්තපර්ණි ගුවද්වාරයේ මණ්ඩපයක් ඉදිකොට වස් සමාදන්ව ප්‍රථම ධර්ම සංගායනාව සිදුකිරීමෙහිලා මූලික කටයුතු සංවිධානය කළේත් ඇසළ පුන් පොහෝ දිනකය.

09. ක්‍රි.පූ. 236 වැන්නේ පොසොන් පුන් පොහෝ දින මිහිදු මහරහතන් වහන්සේ වැඩමවා නව ලොව්තුරා ශ්‍රී සද්ධර්මය දේශනා කොට බුදු දහම අවබෝධ කරවා භණ්ඩුක උපාසක තුමන් පැවදි උපසපන් කරවා සුමන සාමණේරයන් වහන්සේ උපසම්පදා කරවා සියළු දෙනා වහන්සේ මේ ලක් ධරණී තලයේදී ප්‍රථම වස් එළඹීම සිදු වන්නේ ක්‍රි:පූ: 236 වැන්නේ ඇසළ පුන් පොහෝ දිනකය.

10. යම් රටක ධර්මය ස්ථාපිත වීමට නම් එම රටේ උපන් කෙනෙකු එම රටේදීම පැවිදිව ත්‍රිපිටකය මැනවින් හදාරා දහම් දෙසා උපසපන් විය යුතුය. එම සත් ක්‍රියාව සඳහා අරිට්ඨ කුමරු ඇතුළු සිංහලයන් 56 දෙනා මහණ උපසම්පදාව ලබන්නේ ක්‍රි:පූ:237 වැන්නේ ඇසළ පුන් පොහෝ දින වේ.

11. ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ දානය වැළඳූ පාත්‍ර ධාතුව (බුදු පියාණන් වහන්සේගේ පාරිභෝගික වස්තුවක් වූ පාත්‍රා ධාතුව) අප රටට වැඩමකර වන්නේද ඇසළ පුන් පොහෝ දිනක් වීම වැදගත් කරුණකි.

12. දුටුගැමුණු රජතුමාණන් කළ පුණ්‍ය කර්ම අතර සුවිශේෂීම පිංකම වන්නේ බුදුරජාණන් වහන්සේගේ ද්‍රෝණයක් පමණ ධාතුන් වහන්සේලා තැන්පත්කෙට ඉදිකරනු ලැබූ මහාස්ථූපය" යනුවෙන් ගෞරව නාමයෙන් හඳුන්වනුලබන රුවන්වැලි මහා චෛත්‍ය රාජයාණන් වහන්සේ" ගේ නිර්මානයයි. මෙම නිර්මාණය සඳහා මංගල ශිලාව ස්ථාපිත වන්නේද ඇසළ පුන් පොහෝ දිනකය.

13. ලොව්තුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ ශාරීරික, පාරිභෝගික, උද්දේශික චෛත්‍ය අතර ශ්‍රේෂ්ඨම ස්ථානයේ පවතින්නේ ශාරීරික චෛත්‍ය හෙවත් ශ්‍රී බුද්ධ ශරීරයේ ධාතුන් වහන්සේලාය. මෙම ධාතුන් වහන්සේලා අතර අප පරම පූජනීය වස්තුව ලෙස වඳින්නේ පුදන්නේ ගරු සත්කාර සම්මාන කරන්නේ මහනුවර උත්තරීතර මාළිගයේ වැඩ වෙසෙන ශ්‍රී දළදා වහන්සේය. හේමමාලා දන්ත කුමරුන් විසින් දළදා වහන්සේ වැඩම වීමෙන් අනතුරුව කිත්සිරි මෙවන් රජු විසින් දළදා වහන්සේ පෙරටු කරගත් පෙරහැර ආරම්භ වන්නේද ඇසළ පුන් පොහෝ දිනකය.

14. අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ වැඩමවා අරිට්ඨ කුමරු ඇතුළු පිරිස පැවිදි උපසම්පදා කරවා මෙරට මහණ උපසම්පදාව, සම්බුදු සසුන ස්ථාපිත කරීමත් විවිධ ආක්‍රමණ, ව්‍යසන හේතුවෙන් පොළොන්නරු යුගයේ අග භාගය වන විට උපසපන් කිසිඳු භික්ෂුවක් හෝ භික්ෂුණියක් නොමැති තරමට සංඝ සමාජය පරිහානියට පත් විය. එම පරිහානි යුගය මහනුවර රාජධානිය දක්වාම දීර්ඝව පැවතුණි.


එම යුගය නිමාවට පත් වන්නේ අසරණ සරණ සරණංකර සංඝරාජයාණන් වහන්සේගේ අප්‍රතිහත ධෛර්‍ය හා කැප කිරීමත්, ප්‍රඥවත් මතයි. සියම් දේශයෙන් උපසම්පදාව ලැබ ක්‍රි:ව 1753 ඇසළ පුන් පොහො දින මල්වතු මහා විහාරයේදී නැවත උපසම්පදාව ඇති කිරීමෙන් අප රටේ නැවත මහා සංඝ රත්නය ස්ථාපිත විය.

ඉහත කරුණු හා සිද්ධීන් අධ්‍යනය කිරීමෙන් වෙසක්, පොසොන් පොහොය දවසට ඇසළ පොහොයද අද්විතීය ස්ථානයක් ගන්නා බව අපට වැටහේ.

මේ උතුම් පුන් පොහොය සම්බන්ධයෙන් පින්වත් ඔබ හිතට ගත යුතු දෙයක් වේ. එනම් සරාසකි කප්කෙළක් පෙරුම් දම් පුරා ලොව්තුරා සම්මා සම්බුදු බවට තමන් වහන්සේගේම ඥානයෙන් පත්ව ඇසළ පොහෝ දිනක දෙසූ දහමේ සාරය දිවියට එකතු කර ගැනීමයි. එනම් බ්‍රහ්මයෙක් හෝ දෙවියෙක් හෝ මිනිසෙක්ව ඉපදීම දුකකි.

මේ දුක නැති කිරීමට නම් කෙලෙස් උපදවන සියල්ලක් අතහැර හිස ගිනිගත්තෙකු සේ ඒ ගින්න නිවා ගැනීමට උත්සුක වන්න. ශීල, සමාධි, ප්‍රඥා වඩා මඟ ඵල අවබෝධ කර ගැනීමයි. ඒ උතුම් දහම් මඟ අනුගමනයට ඔබට ශක්තිය ධෛර්ය ලැබේවා.

ශාස්ත්‍රවේදී වත්තේගම
කුසලධම්මා මෙහෙණින් වහන්සේ



# පින්පව් ඵලදීම

බුද්ධ දේශනයට අනුව ඔබගේ පෙර ආත්මය ගැන දන ගැනීමට අවශ්‍ය නම් මේ ජීවිත කාලය ඔබ ගත කරන ආකාරය බලන්න.

ඔබගේ මතු ආත්මය දන ගැනීමට අවශ්‍ය නම් ඔබ එදිනෙදා ජීවිත කාලය ගත කරන ආකාරය සිතා බලන්න.

ඒ අනුව ඔබගේ පෙර ආත්මයත් පසු ආත්මයත් කෙසේද යන්න ඔබටම දකගත හැක.

යහපත් ජීවිතයකට ඔබ කරන ඕනෑම හොඳ නරක පසුපස හඹා එයි.

ඔබ වපුරන දේ මත අස්වැන්න නෙළා ගත හැක.

සංවර ඇඳුමින් සැරසී ගෞරවාන්විතව විහාරස්ථානයට යන්න.

බුදු පිළිම නිර්මාණය කිරීම ඔබේ චරිතය නිර්මාණය කිරීම වැනිය.

ධර්මය සුළු කොට නොසිතන්න. බුද්ධ ධර්මය සදාකාලික සත්‍යයි. එය සුළු කොට නොසිතන්න.

ධර්මානුකූලව ජීවත්වීමට උත්සාහ ගන්න.

ඵලය

1. ඔබ මේ ජීවිත කාලයෙහි සමාජයේ පිළිගත් වැදගත් පුද්ගලයෙකු වීමට හේතුව කුමක්ද?

**හේතුව :-**

ඉහත ආත්මයෙහි ඔබ බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීමේ කුසලය එයට හේතුවයි.

2. ඔබ මේ ජීවිත කාලයෙහි ගමන් පහසුව සඳහා විවිධ වාහන ලැබීමට හේතුව කුමක්ද?

**හේතුව :-**

ඔබ ඉහත ආත්මයෙහි අන් අයගේ පහසුව සඳහා පාරවල්, පාලම්, සාදාදීම් පිළිසකර කරදීම් එයට හේතුවයි.

3. ඔබ මේ ආත්මයෙහි හොඳ ඇඳුම් ලැබීමට හේතුව කුමක්ද?

**හේතුව :-**

ඉහත ආත්මයේ ඔබ ගුණ යහපත් පැවිදි උතුමන් හට සිවුරු පිරිකර පිරිනැමීම එයට හේතුවයි.

4. ඔබ ජීවිත කාලයෙහි රසවත් කෑම ලැබීමට හේතුව කුමක්ද?

හේතුව :-

ඉහත ආත්මයේ ඔබ දුප්පතුන්ට රස ආහාර පිළිගන්වා තිබීම එයට හේතුවයි.

5. ඔබ කෑම බීම නැතිව දුක් විඳින්නේ ඇයි?

**හේතුව :-**

ඉහත ආත්මයේ දී පරිත්‍යාග නොකර තද මසුරුව ජීවත් වීම එයට හේතුවයි.

6. ඔබ මේ ජීවිත කාලයෙහි හොඳ නිවාස හා ගොඩනැගිලි ලැබීමට හේතුව කුමක්ද?**හේතුව :-**

ඉහත ආත්මයෙහි ඔබ සිල්වත් ගුණවත් පැවිදි උතුමන්ට දානය පිළිගන්වා තිබීම එයට හේතුවයි.

7. ඔබ මේ ජීවිත කාලයෙහි දියුණුවක් ඇති වීමට හේතුව කුමක්ද?

**හේතුව :-**

ඉහත ආත්මයේ දී ඔබ පන්සල්, ආරාම සමාජයේ කාටත් පරිහරණය කළ හැකි පොදු ස්ථාන සාදා තිබීම එයට හේතුවයි.

8. ඔබ මේ ආත්මයේ උගත් ගුණවත් ලැබීමට හේතුව කුමක්ද?

**හේතුව :-**

ඉහත ආත්මයේ දී ඔබ සැදැහැවත් බෞද්ධයෙකු වීමත්, මත්ද්‍රව්‍ය මස්මාංශ වලින් වැලකී එළවළු පමණක් ආහාරයට ගැනීම එයට හේතුවයි.

9. ඔබ මේ ජීවිත කාලයේ දී අන් අයට ප්‍රිය මනාප පුද්ගලයෙකු වීමට හේතුව කුමක්ද?

**හේතුව :-**

ඉහත ආත්මයේ දී ඔබ හොඳින් නෑදෑ සබඳකම් පවත්වා තිබීම එයට හේතුවයි.

10. ඔබට මේ ජීවිත කාලයේ දී මවු පියන් දෙදෙනාම සිටීමට හේතුව කුමක්ද?

**හේතුව :-**

ඉහත ආත්මෙයේ දී ඔබ තනිව අසර අයට ගෞරවාන්විතව උදව් උපකාර කර තිබීම එයට හේතුවයි.

11. ඔබ මේ ජීවිත කාලයේ දී කවුරුත් නැති අනාථයෙක් වීමට හේතුව කුමක්තද?

**හේතුව :-**

ඉහත ආත්මයේ දී සතුන්ට හිරිහැර කිරීම, කුරුල්ලන්ට කැටපොල්වලින් විදීම එයට හේතුවයි.

12. ඔබට මේ ජීවිත කාලයේදී පවුලේ සාමාජිකයින් බොහෝ ලැබී ඇත්තේ ඇයි?

**හේතුව :-**

ඉහත ආත්මයේ දී ඔබ ගුණ යහපත් පැවිදි උතුමන්ට සිවුපසයෙන් ඇප උපකස්ථාන කිරීමයි.

13. ඔබගේ මේ ජීවිත කාලයේ දී තරුණ දරුවන් මරණයට පත් වන්නේ ඇයි?

**හේතුව :-**

ඉහත ආත්මයේ දී දරුවන් පවුලට කරදරයක් සේ සිතා විනාශ කර දැමීම එයට හේතුවයි.

14. ඔබ ජීවිත කාලයේ දී ඉතා හොඳ ශරීර ශක්තියක් ඇතිව ඉතාමත් විනෝදයෙන් දීර්ගසායුෂ ලබන්නේ ඇයි?

**හේතුව :-**

ඔබ ඉහත ආත්මයේ දී කුඩු වී සිටි සතුන්ට නිදහස ලබා දී තිබීම එයට හේතුවයි.

15. ඔබ මේ ජීවිත කාලයේ දී සුවනොවන රෝගයකින් පෙළෙන්නේ ඇයි?

**හේතුව :-**

ඔබ ඉහත ආත්මයේ දී සිල්වත් භික්ෂූන්ට මස් මාංශ පිළිගන්වා තිබීම එයට හේතුවයි.

16. ඔබ මේ ජීවිත කාලයේ දී හොඳ ශරීර සෞඛ්‍යයෙන් යුක්ත වීමට හේතුව කුමක්ද?

**හේතුව :-**

ඔබ ඉහත ආත්මයේ දී රෝගීන් සුවවීම සඳහා බෙහෙත් පිළිගන්වා තිබීම එයට හේතුවයි.

17. ඔබ මේ ජීවිතයේ දී මිටි වී ඉපදීමට හේතුව කුමක්ද?

**හේතුව :-**

ඔබ ඉහත ආත්මයේ දී පොළොවේ දිගාවී දහම් පොත් ලිවීම් හා කියවීම් කර තිබීම එයට හේතුවයි.

18. ඔබ මේ ආත්මයේ දී රෝග පීඩාවන්ට ගොදුරුවන්නේ සහ අල්පායුෂ ලබන්නේ ඇයි?

**හේතුව :-**

ඔබ ඉහත ආත්මයේ දී බුදු පිළිම ඉදිරියේ දී මස් මාංශ පූජා කිරීම එයට හේතුවයි.

19. ඔබ මේ ජීවිත කාලයේ දී ඔබගේ දේපළ ගින්නෙන් හෝ විදුලියෙන් විනාශ වීමට හේතුව කුමක්ද?

**හේතුව :-**

ඔබ ඉහත ආත්මයේ දී වංචනික ලෙස වෙළඳම් කර තිබීම එයට හේතුවයි.

20. ඔබ මේ ජීවිත කාලයේ දී බිහිරි වී සිටින්නේ ඇයි?

**හේතුව :-**

ඔබ ඉහත ආත්මයේ දී ධර්මය දේශනා කරන විට එය නිසි ලෙස ශ්‍රවණය නොකිරීම එයට හේතුවයි.

ඔබ මේ හේතුඵල සූත්‍රය විශ්වාස කර ඒ අනුව කටයුතු කරන්නේ නම් ඔබ ඊළඟ ආත්මයේ දී පිළිගත් උසස් පුද්ගලයෙකු වේ.

ඔබ මේ ජීවිත කාලයේ දී දහම් කරුණු මුද්‍රණය කර බෙදා හැරියහොත් ඊළඟ ජීවිත කාලයෙහි ඔබ සමාජයේ පිළිගත් නායකයකු වේ.

ඔබ තුණුරුවන් කෙරෙහි විශ්වාසය ඇතිව ඒ සඳහා අධාර කිරීමට පුරුදු වීම හොඳයි. ඔබ ධර්මය අනුව ක්‍රියා කරයි නම් ඊළඟ ආත්මයේ දී සවාභාවික විපත් අනතුරු වලින් බේරීමට හැකි වේවි.

15 පිටුවට....

මෛත්තානි අසේකා සිල්මාතාව

# සැබෑ සහෘදයකුගේ ඇති වන චර්යාමය වෙනස



අප ජීවිතයේ හැමදාමත් විවිධ පුද්ගලයින් ඇසුරු කරනු ඇත. නමුදු ඒ අතරින් අපට අපගේ ජීවිතය හදා ගැනීම උදෙසා සැබෑ ලෙසම අවංකව ආදරයෙන් අවවාද, අනුශාසනා දෙනු ලබන්නේ කීයෙන් කී දෙනෙක් ද? බොහෝ දෙනෙක් අපව නිවැරදි කිරීමට උත්සාහ කරන්නේ ඔවුන්ගේ කැමැත්ත උදෙසාය. හතලිස් වසරක මගේ ජීවිතය තුළ මට සැබෑ මිතුරන් හමු වී ඇත්තේ දෙතුන් දෙනෙක් පමණි. අන් සියලු මිතුරන් තම තමන්ගේ පටු පරමාර්ථ ඔස්සේ ඔවුන්ගේ ආත්ම ලාභය උදෙසාම කටයුතු කළ අයයි.

මිනිස් ලෝකය කාම ලෝකයට අයිති වන්නකි. එම කාම ලෝකයේ උච්චතම අවස්ථාවට අද යුගය පත් වී ඇත. මිනිසුන් තම තමන්ගේ කාම සිතුවිලි ඔස්සේම සිත, කය, වචනය වෙහෙසවනු ඇත. එවැනි වටපිටාවක් තුළ තව කෙනෙකුන් සුමගට ගැනීමට තබා සිතන්නේවත් නැත. ඇස, කණ, නාසය, දිව, ශරීරය සඳහාම සටන් කරති. එයට ප්‍රතිවිරුද්ධ බලවේග මතුවීමේ දී ඒවා ඉවත් කිරීමට විවිධ දේවල් සිදු කරති.

මෙය බුදුන් කළද පැවතුන සිද්ධාන්තයකි. බුදුන් ලෝක සත්වයා හමුවේ සම්‍යක් දෘෂ්ඨියෙන් යුත් මානව දයාවෙන් පිරී හඬක් නැගීමේ දී හයට විරුද්ධ පිරිස් විවිධ උපක්‍රම ඔස්සේ බුද්ධ චරිතය විනාශ කිරීමට ක්‍රමෝපායන් යෙදූහ. එයට හේතුව කාම ලෝකයේ කිරුළ පලඳවන්ට එම කාම සිතුවිලි නිසියාකාරව පවත්වාගෙන යාමට නොහැකි වීමය. ඔවුන් මෛතික ගැන නොසිතන අද මතව එළව එලවා කාම ලෝකයෙ තව තවත් මන්දිර බඳිනු ඇත. ඔවුන් එම කාම සිතුවිලි දියත් ඉදිරියෙහි සිල් රකින බණ, භාවනා කරන වංචාකාරී චරිත ලක්‍ෂණ මවා පාමින් හැසිරීමට පෙළඹී ඇත. ඒ සියල්ල සිදු කරන්නේ ඔවුන් සංතර්පනය කරන පංච ඉන්ද්‍රියන් තව තවත් සූක්‍ෂම අයුරින් පවත්වාගෙන යෑමටය.

අද ලෝකයේ විවිධ චරිත ලක්‍ෂණයන් ඉස්මතු වී ඇත. හොඳ මිතුරන් නරක මිතුරන් හඳුනා ගැනීමට බැරි තරමට සමාජය සංකීර්න වී ඇත. බාහිර වශයෙන් දකින පිළිරූ තුළින් උම්මාදවීමට තරම් මිනිසුන් අඥාන වී ඇත. නිකන්ම නිකන් හිස් පඹයන් ධන බල තුළින් අවිහිංසාවාදී සත්‍ය ගරුක මිනිසුන් පෙළාගෙන ඇත. හිස් පඹයන් හඬ නගන්නේ තම හදවතට වංකවය. එසේ ඔවුන් හඬ නගන්නේ ඔවුන් මෙතෙක් ජීවිතයේ කළ අපරාධ, දූෂණ යටපත් කර ගැනීමටය. නමුදු ස්වභාව ධර්මයෙන් එයට කවදාවත් ඉඩක් නෙදෙනු ඇත.

හොඳ මිනිසුන් කුණු කාණුවල වැටී සිටියද ස්වභාව ධර්මය විසින් ඔවුන් ආරක්‍ෂා කොට රකිනු ඇත. එයට හේතුව වන්නේ හුදකලා වශයේන ගත් කල්හි තම තමන් කරන ක්‍රියා සන්තතිය තම තමන්ම පමණක් දන්නා බැවිනි. එහිදී ජීවිතයේ දහසක් බාධක තුළින් චරිත සංවර්ධනයක් ඇති කර ගත්තවුන් විලසට හිස් පඹයන් ද චරිත සංවර්ධනයක් පෙන්වනු ඇත. එහි දී සමාජ සමතුලිතතාවය මැනීමට කිසිදු මිම්මක් නැත. සමාජය තීරණය කරන්නේ බාහිරින් ගෝචර වන දේ තුළින් ය. එහිදී ලබු කබල් යට ගොස් ගල් බොරලු පාවෙනු ඇත. එසේනම් එම සියලුම සාධක සමතුලිත අයුරින් නිර්ණය කරන මිම්ම ඇත්තේ ස්වභාව ධර්මයාට පමණි. ස්වභාව ධර්මය විසින් ඒ ඒ චරිත හඳුනාගෙන ඒ ඒ චරිතයට අදාළ අයුරින් විනිශ්චයක් දෙනු නිසැක ය.

දුෂ්ඨ දුර්ජන ලෝකයක් තුළ ජීවත්වන අපට සත්වයා හඳුනා ගැනීමට කිසිදු මිම්මක් නොමැත.තිරිසන් සත්වයින් තුළ ඒ ඒ ලක්‍ෂණ ඇති බැවින් ඔවුන් හඳුනා ගැනිමටත් ඔවුන්ගෙන් ආරක්‍ෂා වීමටත් යම් තරමක ක්‍රමවේදයන් ඇත. නමුදු මිනිසා නැමති සත්වයා හඳුනා ගැනීමටත් කිසිදු ලක්‍ෂණයක් නැති අතර, සමස්ථ තිරිසන් සත්ව සමූහයා තුළම පවතින ලක්‍ෂණ උසස් මනසක් ඇතැයි පැවසෙන දෙපා සතා තුළ ඇත.

**කුරිරු ගොර සපුන්ගේ**
**දළගෙහි විෂය**
**මදුරු මැසි කැලන්ගේ**
**තුඩගෙහි විෂය**
**රුදුරු නුහුසුවන්ගේ වල ගෙහි විෂය**
**නමුදු දුදනන් ගෙ සියොලගෙහි ම විෂය**

යන සුභාෂිත කාව්‍ය තුළින් ඒ ඒ සත්වයාට විෂ සහිත ශරීර කඩ ඉමක් තිබුණද මිනිසා නැමති සතාට සීමාවක්, මිම්මක් නැත. පංචේන්ද්‍රිය පුරාම විෂ තවරාගෙන අනුන් නසන විෂ ආයුධයක් සේ ගත සිත මෙහයෙවනු ඇත. විෂවලට විෂ එක් වන්නා සේ එම රුදුරු මිනිසුන්ට රුදුරු මිනිසුන්ම කල්‍යාණ මිත්‍රයෝ වන්නාහ.

කාම ලෝකයෙ කිරුලු දරන්නට ඔවුන්ගෙ අවවාද අනුශාසනාම ලබන්නාහ. අසූචි වලට අසූචි පැහෙනවා සේ දුෂ්ඨ, දුර්ජන මිනිසුන්ට එවැනි අයගෙම ඇසුර සැපතක් වනු ඇත. ඔවුන් බාහිර වශයෙන් සිලි රකින කොකුන්ගේ චරිතයක් මවා පෑමට උපදෙස් දී අභ්‍යන්තර වශයෙන් සමස්ථ චිත්ත පරම්පරාවම රාග,ද්වේෂ, මෝහ දී එකොළොස් ගින්නට ඇද දමනු ඇත. කැම ලෝකයේ රජකිරුළ දැරීමේ දී එම යථාර්ථය දැකීමට තරම් බුද්ධි ගෝචර නොවන්නාහ. නමුදු යථාර්ථය එයයි. අපාය සහාය මිත්‍රත්වයක් කාමුක මනෝභාවයන් තුළ ලැබීම මොන තරම් සෝචනීයද? මගේ ප්‍රාර්ථනය වන්නේ ඒ දුෂ්ඨ දුර්ජන මිනිසුන්ගෙන් මිදීම හා එම ඇසුර නොපැතීමය.

**ඉමිනා පුඤ්ඤකම්මේන මා මේ බාලසමාගමෝ**
**සතං සමාගමෝ හෝතු යාව නිබ්බාන පත්තියා**


මා කරන හැම පින්කමක් හරහාම මා සිතන්නේ මා පතන්නේ මා හට අසත්පුරුෂ ආශ්‍රයක් නොවේවා. නිවන් දකින තුරු සත්පුරුෂයන්ගේම ආශ්‍රය ලැබේවා යන්නයි.

කලුනික සොයනවාටත් වඩා සැබෑ අවංක සහෘදයෙකුගේ අවවාද ලැබීම අසීරු වන්නකි. නමුදු මුළු ජීවිත කාලයටම එවැනි දෙතුන් දෙනෙකු හෝ හමුවීම ජීවිතය ලස්සන කරගැනීමට පිටුවහලක් වූවෙහිය.එවැනි අය දෙවිවරු වන්නාහ. එවැනි අය ඇදහීම මිනිස්කමට මදිකමක් නොවේ. එබැවින් සෑම කෙනෙකුටම ජීවිතයේ වැරදිලා ඇති වුවද එයින් කම්පා නොවී සැබෑ මිත්‍රාශ්‍රයක් ලබා අටලෝ දහමින් කම්පා නොවී නැවත ජීවිතය අලුත් තැනකින් අරඹන්ට උත්සාවත් වන්න.

**මග හොඳට තිබේ නම්**
**යන්න දැසත් පෙනේ නම්**
**කිම බැඳිවල යන්නේ මං මුලා වූ එකකු සේ**

මහව,උඩගම ශ්‍රී ඉන්ද්‍රසුමන මහ පිරිවෙන්හි
ප්‍රවීණාචාර්ය,ප්‍රවචන කීර්ති ශ්‍රී ලේඛණ ශාස්ත්‍රී,
ගලගෙදර රතනවංශ ස්ථවිර

# හොඳ නොහොඳ පිළිබඳ දහම් කරුණු



ඇසළ සඳ නිල් අඹරට නැගී සුදු සඳ රැස් විහිදුවන්නේ එදා ඉසිපතන මිගදායෙන් ඇසුන දම්සක් සූත්‍රය මද පවන් දිගේ අප දෙසවන් වෙත යා කරමිනි. ප්‍රඥාවේ ඇස පහළ වූ දිනය සමරන්නේ අප ඇසළ පොහෝ දිනයේදීය. දුක, දුකට හේතුව ඉන් මිදෙන මඟ, එය නැති කිරීමට යන චතු සත් දම් දෙසුවේ ඇසළ පුන් පොහෝ දිනයක බව බොඳු හදවත් තුළ අදත් නොමැකෙන මතකයකි. ඒ පිළිබඳව මා පළමුවෙන්ම සිහිපත් කළේ මේ ඇසළ මාසය නිසාය. වෙසක් දිනයේ බුදු තෙමඟුලත්, පොසොන් දිනයේ අනුබුදු හිමියනුත් සැමරූ අපි දැන් සැරසෙන්නේ උතුම් වූ ශ්‍රී සද්ධර්මය තුන් ලෝ තලයටම දෙසා වදාළ ඇසළ පොහොය මංගල්‍යය සැමරීමටයි.

ලොව හොඳ නරක මිනිසත් කමේ අගය පළමුවෙන්ම ලොවට දේශනා කළේ ලොව්තුරු බුදු පියාණන් වහන්සේය. මේ ලිපියේ මාතෘකාව ලෙස මා තෝරා ගත්තේ අලගියවන්න මුකවැටි කිවිඳුන් විසින් රචිත සුභාෂිතය" නම් ග්‍රන්ථයෙන් තෝරාගත් මාහැඟි ඉතා වැදගත් වදනකි. එහි සඳහන් අන්දමට මිනිසුන් තුළ හොඳ හා නරක යන දෙකම තිබේ. මේ පිළිබඳව අප මඳක් විමසා බැලීම වටී. හරි හැටි අවබෝධ කරගෙන තිබෙනවාද? යන්න ප්‍රශ්නයකි. නමුත් මෙය වත්මනෙහි ඉතා හොඳින් අවබෝධ කර ගත යුත්තකි. මේ ලෝ තලයෙහි උපන් සැම කෙනෙක් තුළම හොඳ හා නරක යනුවෙන් දෙකොටසක් ඇත. මා මාතෘකා කළ සුභාෂිත වදන එය උදාහරණ සහිතව පෙන්වා දෙයි. එයින් දැක්වෙන පරිදි

**මිනිස් හට සොඳුරු ගුණ සහ නුගුණ ඇත**
**නිදොස් කෙනෙක් මේ දියත උපදින්නේ නැත**
**වෙසෙස් සිනිඳු මුවරද බර සහස් පත**
**කොරොස් නලින් යුතුවෙයි කටු පෙළිනි යුත**

**(සුභාෂිතය)**

යන අන්දමට මිනිසා තුළ යහපත් ගුණ සහ නුගුණ යන දෙකම තිබේ. මේ ලෝකයෙහි නිර්දෝෂී පුද්ගලයෙක් උපත ලබා නැත. එය හරියට ලස්සන නෙළුම් මලක නටුව ඉතා ගොරෝසු කටුක බවින් යුක්ත වන්නා සේය. මෙය පැරණි සංස්කෘත ග්‍රන්ථයක් වන ව්‍යාසකාරය" නම් ග්‍රන්ථය පෙන්වා දෙන්නේ මෙසේය.

**දෝ ෂෝ ප්‍යස්ති ගුණෝ ප්‍යස්ති**
**නිර්දෝෂෝ නෛව ජායතෙ**
**සුකුමාලස්‍ය පද්මස්‍ය**
**නාලෝ භවති කර්කෂඃ**

**(ව්‍යාසකාරය)**

මෙයින්ද දෝෂයන් හා නිර්දෝෂයන් සහිත පුද්ගලයන් ලොව සිටින බවත්, එය සුකුමාර වූ පද්මයක් සුකුමාල එහි නටුව කර්කෂ බවින් යුක්ත වන බව පෙන්වා දෙයි.

වත්මන් සමාජය තුළ අප ජීවත් වන විට අපට විවිධ තරාතිරම්වල පුද්ගලයන් ඇසුරට හා ඔවුන් හා කටයුතු කිරීමට සිදු වෙයි. නමුත් ඔවුන් හා ජීවත් වීමේ දී හා වැඩ කටයුතු කිරීමේ දී අප අතර ගැටුම් ඇති වන්නේ බොහෝ දෙනෙක් මෙය තේරුම් නොගැනීම නිසාය. වෙසෙසින්ම අප නිවෙස් තුළ පවා මෙය නොදන්නා නිසාවෙන් බොහෝ ගැටළු ඇති වීමට බෙහෙවින් ඉඩ තිබේ. මහනෙල් මල පිපෙන විලේ දුගඳ හමන කුඩා මසුන් ජීවත් වෙයි. නමුත් ඒ කුඩා මසුන්ටත් සුගන්ධවත් මහනෙල් මලටත් එකම කාරණය වූයේ ජලයයි. එම ජලයේම පිපෙන මහනෙල් මල සුවඳවත් වූවද එහිද ඇති නටුව ඉතා ගොරෝසු බවින් යුක්තය. කෙසේ වුවත් එහි නටුවට වඩා වැඩි දෙනෙක් ප්‍රිය කරන්නේ මල වෙතය. ඒ එහි ඇති සුගන්ධවත් බව, සොඳුරු බව, අලංකාර බව පමණක් බොහෝ දෙනෙක් දකින නිසා මය.

මේ අන්දමින් සොබා දහම අපට කියා දෙන්නේ ඉතා උතුම් පාඩමකි. අද අප ඇසුරු කරන හා අපහා සමඟ ජීවත් වන බොහෝ දෙනෙක් පුද්ගලයෙකු වෙතින් යම් වරදක් වූ විට එය ඉස්මතු කරමින් එම පුද්ගලයා සමාජයේ ඉතා අපහාසයට උපහාසයට ලක් කරයි. නමුත් ඒ පුද්ගලයා තුළ නිවැරදි උතුම් ගුණ ධර්මයන් එකක් හෝ තිබිය හැකිය. අප ලැබූ මිනිසත් බව මිනිසත් බවින් පුරවාලන්නට නම් සැම පුද්ගලයෙක් දෙසම වැරදි දෘෂ්ඨියකින් නොබැලිය යුතුය. අප කෙරෙහි අභිනවත් පුද්ගලයෙකු සතුව වූවද ඉතා හොඳ යහපත් ගතිගුණයක් හෝ තිබිය හැකිය. පුද්ගලයෙකුගේ එක් වරදක් දෙස බලමින් ඔහු අවඥාවට ලක් කරනු වෙනුවට ඔහු තුළ ඇති එකඳු හෝ යහපත් ලක්ෂණයක් දැක එය අගය කිරීමට පෙළඹෙන්නේ නම් එබඳු පවිටු පුද්ගලයන් වුවද යහපත් මඟට ගත හැකිය. මෙය අප බුදුන් වහන්සේ ඉතා හොඳින් ලොවට පෙන්වා දුන් සේක. ඒ අංගුලිමාල දමනයෙනි. ඔහු කළ පවිටු වැඩ වලට වඩා බුදුන් වහන්සේ අගය කළේ ඔහු එක් දිනක් හෝ කළ යහපත් දෙය ගැනය. එවිට බොහෝ කළ අකුසල් යටපත් කරගැනීමටත් කරන කුසල වර්ධනය කරගැනීමටත් බුදු සසුනේ උතුම් තෙරුන් වහන්සේ කෙනෙකු වීමටත් අඟුල්මල් නම් පුද්ගලයාට හැකි විය. වළාකුලකින් මිදුන පුන් සඳක් මෙන් පවිටු දෙය සෝදා හැර තම ප්‍රඥාවේ ආලෝකය ලොවට විහිදුවන්නට අප සැම කෙනෙකුටම හැකියාවක් ලැබෙයි.

මෙය තේරුම් ගැනීමට අද කාලය එළඹ තිබුණත් බොහෝ දෙනා පුරුදු වී සිටින්නේ කෙනෙකුගේ සුළු වරදක් හෝ දුටුවහොත් එයම මතුකර දක්වන්නටය. මේ තත්වය නිසා සමාජයේ කුඩාම ඒකකය වන පවුල් සංස්ථාව තුළද බොහෝ ගැටළු වලට මූලික හේතුව බවට මෙය පත්ව තිබේ. අඹු සැමි දූදරුවන් අතර එකිනෙකා අතර පවා සහයෝගය බිඳී යාමට මෙය හේතුවක් වී තිබේ. දෙමාපියන් වුව ද දරුවන්ගේ කුඩා වරදක් දුටු විට එඉම ස්මතු කරමින් එම දරුවා පීඩනයට ලක් කරයි. එයට වඩා වටින්නේ එම දරුවාගේ හොඳ ලක්ෂණයක් අගය කිරීමයි. එය පෙන්වා දුන් විට ඔහු යහපත් මඟකට යොමු වීම නොඅනුමානය. ගුණ ඥාන බෙලෙන් යුතු පිරිසක් බිහි කිරීමට මේ වටිනා උපදේශය පිළිපැදීමෙන් හැකිවනු ඇත. එසේම අප සැම කෙනෙක්ම සිතට ගත යුත්තක් නම් තමන්ගේ වරද වරදක් ලෙස තමන් පිළිගැනීමත් නිවැරුද්ද නිවැරුද්ද ලෙසත් පිළිගැනීමත් යහපත සාදා ගැනීමයි. එමෙන්ම තම මිතුරාට හිතවතුන්ට ඉතා යහපත් කළණ මිතුරෙකු වීමට නම් ඔහුගේ වරද වරදක් ලෙස පෙන්වා

**" අද අප ඇසුරු කරන හා අපහා සමඟ ජීවත් වන බොහෝ දෙනෙක් පුද්ගලයෙකු වෙතින් යම් වරදක් වූ විට එය ඉස්මතු කරමින් එම පුද්ගලයා සමාජයේ ඉතා අපහාසයට උපහාසයට ලක් කරයි. "**

දී යහපත් දෙය ඔහුට පෙන්වා අගය කිරීමෙන් ඉතා අයහපත් මඟට පිළිපන්නවුන් පවා යහමඟට ගත හැකිය. බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථය වන ධම්ම පදයද මෙයට දී ඇති ඔවදනක් මට සිහිපත් වෙයි. එනම්,

**නිධීනංව පවත්තාරං**
**යං පස්සේ වජ්ජ දස්සිනං**
**නිග්ගය්හවාදිං මේධාවිං**
**තාදිසං පණ්ඩිතං භජේ**
**තාදිසං භජමානස්ස**
**සෙය්‍යෝ හෝතින පාපියෝ"**

**(ධම්ම පදය පණ්ඩිත වර්ගය)**

යනුවෙනි. මෙයින් කියවෙන්නේ තමාගේ වරදක් පෙන්වීම නිධානයක් ඇති තැනක් පෙන්වා දෙන යහපත් පණ්ඩිතයන් ඇසුරු කළ යුතු බවයි. එම වරද පෙන්වා දී එම පුද්ගලයා තුළ ඇති යහපත් දෙය අගය කරන්නේ නම් මේ සමාජය ඉතා යහපත් වන බවට කිසිම සැකයක් නැත. එම නිසා මේ ලොව සැම කෙනෙකු තුළම වරද හා නිවැරැද්ද යන දෙකම තිබෙන බව අවබෝධ කරගෙන තම තමන්ගේ ඥාන පමණින් එකිනෙකා තේරුම් ගෙන සමාජය යහපත් කිරීමට සැම කෙනෙකුම ඉටා ගන්නේ නම් ඉතා වටිනා බව සඳහන් කළ යුතුය. යහපත අගය කර අයහපත බැහැර කිරීමෙන් යහපත් සමාජයක් කරා යන ගමන සාර්ථක කරගැනීමට අපට හැකියාව ලැබෙනු ඇත.

දිල්රුක්ෂි අබේකෝන්

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER
රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.

දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 5361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: rangirinewspapers@gmail.com
වෙබ් අඩවිය: www.rangirisrilanka.lk

# සසුන රැකුමට - ගනිමු පියවර

ශ්‍රී ලාංකීය සංස්කෘතියේ පදනම බෞද්ධාගම තුළින් සුපෝෂිත වූයේ සියවස් ගණනාවක් සිටය. භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිස මූලික කොටගත් සමාජ සහ සම්බන්ධතාවක් ගොඩ නැගී තිබීම එහි ප්‍රධාන ලක්ෂණයකි. එනිසාම ලාංකීය ශිෂ්ඨාචාරයේ පැවැත්මට මෙකී සිව්වනක් පිරිසම අවශ්‍යය.

භික්ෂු, භික්ෂුණී, ශාසනයකින් තොරව ශ්‍රී ලාංකීය සමාජ ක්‍රමයට පැවතිය නොහැකිය. ලොව අන් බොහෝ රටවල් ආගම මුල් කොටගත් දේශපාලනික ක්‍රමවේදයක් වෙත තල්ලු වෙමින් සිටියි. මැද පෙරදිග කලාපයේ එය ආගමික අන්තවාදයක් දක්වා දුර දිග යනු පෙනේ.

ලංකාවේ ඇති වන සියලු මත භේදයන් ජාතිවාදය හෝ ආගම්වාදය මුල් කොටගත් විදේශීය කෝණයකින් අර්ථ දැක්විමට කටයුතු කිරීමේ ප්‍රවණතාවයක් මතුව ඇති බව පෙනේ. රිය අනතුරක් සිදුවුව ද එයට ද ජාති හෝ ආගම් භේද පටලැවීමට උත්සුක වනු දැකිය හැකිය. ඒ සඳහාම දතකට මැදගෙන සිටින දේශපාලඥයින් පිරිසක්ද මෙරට සිටී.

අන්‍යාගමිකයින් පමණක් නොව සිංහලයින් තමන්ම බෞද්ධකම දරන්නන් ද ඒ කණ්ඩායම අතර වෙති. බටහිරකරණය වූ ජනප්‍රිය මාධ්‍ය දහරාව එකී අසත්පුරුෂයින්ට වේදිකා සහ ඉඩකඩ ද නොමසුරුව ලබාදෙති.

මෙහි වඩාත්ම හානිය සිදුව ඇත්තේ සිංහල කමටය. බෞද්ධ කමටය. ඒ හැර සසුනට එරෙහි තවත් බලවේග රැසකි. ඒ එක එකක් ගැන කීමට අපි උත්සාහ නොකරමු. ඒ අපට ජාතික, ආගමික, මාධ්‍ය වගකීමක් ඇති හෙයිණි.

අන්‍යාගමිකරණයට මේ රට සීග්‍රයෙන් ගොදුරු වී සිටියි. බුදු දහමේ ජනප්‍රිය ප්‍රවීණතාව තව තවත් ඉස්මතු වෙමින් පිරිසිදු ථේරවාදී චාරිත්‍ර වාරිත්‍ර උඩුයටිකුරු කරමින් සිටියි.

ඒ සියල්ලටම වඩා ජන මාධ්‍යයේ දි භික්ෂු සමාජයේ අවිචාරයන් ඉස්මතු කෙරෙයි. බණ දහම් භාවනා හෝ ආගමික වැඩ සටහනක් අභිබවා සමාජගත වන්නේ ප්‍රවෘත්ති මගින් ලබාදෙන එවැනි සිද්ධීන්ය. මේ ඔස්සේ ජන සමාජය තුළ භික්ෂූන් එයට තිබූ ගෞරවය හා භක්තිය හීන කරවයි. මේ සියල්ලේ අවසන් ප්‍රතිඵලය මෙරට ගොඩනැගුණු සිංහල බෞද්ධ පදනම විනාශ කිරීමය. ඒ සාධකය බිඳ දැමූ පසු මේ රට කඩා බිඳ දැමීමද ඉතා පහසුය.

ධර්ම විනයම මාගේ ඇවෑමෙන් ශාස්තෘවරයා වන්නේ යැයි බුදුරජාණන් වහන්සේ මනාකොට දේශනා කරන ලද සේක. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී සර්වඥ ධාතුන් වහන්සේලා අපමණක් ද බුද්ධත්වයට උපකාර කළ ජය ශ්‍රී මහා බෝධියද උතුම් සිරිපතුල ද ප්‍රමුඛව මෙරට ගම් නියම් ගම් පාසා ඇත්තේ බුදු දහමේ උත්තරීතර දායාදයන්ය. පෙර රජ දරුවන් ඉදිකළ විශිෂ්ඨ බෞද්ධ කලා ශිල්පයන්ය. අහස සිඹින චෛත්‍යයන්ය. නැතහොත් මෑත භාගයේ ඉදි වූ ශ්‍රේෂ්ඨ බෞද්ධ නිර්මාණයන්ය. වෙහෙර විහාර, පිළිම සහ වෙනත් බෞද්ධ සිද්ධස්ථානයන්ය. ආසියාවේ නැතහොත් ලෝකයේම විසල් අපූර්ව සහ උත්කෘෂ්ඨ නිමැවුම් ඒ අතර වෙති.

නමුත් ඒ සියල්ල සංචාරක මධ්‍යස්ථාන බවට පත්වෙමින් පන්සල් වෙනුවට දන්සැල් වඳින සමාජයක් දූන් දූන් බිහිවන බවද අප අමතක නොකළ යුතුය. බුදු සසුන බේරා ගැනීමට තම දිවියම කැපකළ ශ්‍රේෂ්ඨයෙකු ද අපට මේ මොහොතෙහි සිහිවෙයි. ඒ ධර්මපාලතුමන්ය. ඔහුගේ තවත් විශේෂ සංවත්සරයක් ළඟදී එළඹෙයි.

මේ හැර මෙරට සසුන බබළවන අතිපූජනීය සංඝ පීතෘන් වහන්සේලා අපමණක් මෙරට වෙසෙති. දිවා රෑ නොබලමින් උන් වහන්සේලා මෙරට ශාසනයේ චිරස්ථිතිය සඳහාත් බෞද්ධ සමාජයේ යහපත උදෙසාත් කැපවෙති. එවැනිම වූ බෞද්ධ ජන නායකයින් රැසක්ද මෙරට අදත් සිටිති. එබැවින් පැන නැගෙමින් පවතින සහ ඇතැම් පිරිස් ගොඩ නඟන්නට තැත් දරන ශාසනික විනාශයන් අවම කිරීම හෝ සම්පූර්ණයෙන්ම වළකාලීම කළ නොහැකි දෙයක් නොවන්නේය.

පළමු බුද්ධ වචනයේ සිට අවසන් බුද්ධ වචනය දක්වා වූ ශ්‍රී සම්බුද්ධ භාෂිතය ත්‍රිපිටකය ලෙසින් අප සතුය. අප කළ යුත්තේ ඒ ඔස්සේ අපේ ජන සමාජයට යළිත් සද්ධර්මයේ ජීව වායුව එක් කිරීමය. එවිට අප පතන, අප සිත බෞද්ධ ජන සමාජය යළිත් වරක් නැවුම් ආකෘතියකින් තනාගැනීමට අපට හැකිවනු ඇත.

අප කළ යුත්තේ ගැටලුව හැඳින ඊට විසඳුම් ලබාදීමය. චතුරාර්ය්‍ය සත්‍යය ලෙසින් බුදුරජාණන් වහන්සේ මුල් බුද්ධ දේශනාවේදීම අපට කියා දුන්නේ ඒ සඳහා වූ ඒකායන මාර්ගයයි.

නිමල් කන්නංගර ආරච්චි

# ආරෝග්‍ය පරමා ලාභා

තුන් ලොවක් සනහා වදාළ ශාන්ති නායක අමාමෑණී තිලෝගුරු බුදුරජාණන් වහන්සේගේ බුදු බණ අනුව මෙලොව උතුම්ම ලාභය නිරෝගී බවයි. ඒ බව බුදුරදුන් ධම්ම පදයේ 15 වන වර්ගය වන සුඛ වර්ගයේදී පෙන්වා දී ඇත. මෙලොව උපන් පෘථග්ජන සියල්ලෝම උම්මත්තකයන් ලෙසින් (පිස්සන්)වරෙක බුදුරදුන් හඳුන්වා දී ඇත. එනිසාම බුදු දහම නිරෝගී බව ඉතා ඉහළින් අගය කොට ඇත.

සකල සත්වයා සසර දුකින් මුදවමින් සැනසීමෙන් ජීවත් වීම සඳහා බුදුරදුන් අපට වටිනා ඖෂධයක් පෙන්වා දුන්හ. එය අන් කිසිවක් නොව. ධර්මය නම් වූ ඖෂධයයි.

**"යේ කේචි ඕසදා ලෝකේ**
**විජ්ජති විවිධාපුථු**
**ධම්මෝසධ සමං නත්ථි**
**එවං පිබථ භික්ඛවො"**

ලෝකයේ කොපමණ ඖෂධ වර්ග ඇතත් ධර්මය හා සමාන ඖෂධයක් නැත. එම උතුම් ඖෂධය පානය කරන්න යනුවෙන් දේශිතය.

අංගුත්තර නිකායේ චතුත්ත නිපාතයේ රෝග සූත්‍රයේදී බුදුරදුන් පෙන්වා දෙන්නේ මෙලොව කායික රෝග වලින් නොපෙලී දස වසරක්, විසි වසරක්, තිස් වසරක්, හතලිස් වසරක්, පනස් වසරක් පමණක් නොවෙයි සියක් වසරක් නිරෝගිව සිටිය ද එක මොහොතක් මානසික රෝගවලින් (හිතේ ලෙඩින්) නොපෙලී පීඩා නොවිඳ සිටින රහතන් වහන්සේලා හැර වෙන කිසිවෙක් සොයා ගත නොහැකි බවයි.

**"තෙ භික්ඛවේ සත්තා දුල්ලභා ලොකස්මිං යෙ චේතසිකේන රෝගේන මුහුත්තංපි ආරෝගය්‍යං පාටිජානාති අඤ්ඤත්‍ර ඛිණාසවෙති"**

මේ අනුව නිරෝගී සුවයයෙහි අවස්ථා දෙකක් අපට හඳුනා ගත හැක.

1 .කායික නිරෝගී බව
2 .මානසික නිරෝගී බව

පුද්ගල නිරෝගී බව සඳහා බුදුරදුන් ක්‍රම තුනකට ප්‍රතිකාර කොට ඇත.

**කායික ඖෂධ ප්‍රතිකාර, මානසික ප්‍රතිකාර, ධර්ම යාග ප්‍රතිකාර**

කායික ඖෂධ ප්‍රතිකාර හා මානසික ඖෂධ ප්‍රතිකාර පිළිබඳ ඉදිරි කලාප වලින් ඔබට තොරතුරු ගෙනහැර දැක්වීමට අපේක්ෂා කරමි. ධර්ම යාග ප්‍රතිකාරය යනු පරිත්‍රාණ ධර්ම දේශනයයි.

පිරුවානා පොත් වහන්සේ තුළ ඇතුළත් මහා කස්සප ථෙර බොජ්ඣංගය මහා මොග්ගල්ලානත්ථෙර බොජ්ඣංගය මහා චුන්දථෙර බොජ්ඣංගය යන සූත්‍ර දේශනා කළේ බුදුරදුන්, මහා කාශ්‍යප හා මුගලන් මහ තෙරුන් වහන්සේලා රෝගී වු විට සුවපත් කිරීම සඳහාය.

"උට්ඨාහි චායස්මා මහා කස්සපො තම්භා ආබාධා තථා පහිනො චායස්මතො මහා කස්සපස්ස සෝ ආබාධො අහොසි"

**"තම්හා ආබාධා තථා පහිනොච භගවතො සෝ ආබාධො අහෝසි"** යන්නෙන් ඒ බව පැහැදිළි වේ.

බුදුදහමේ ඉගැන්වෙන අවම ශීල ශික්ෂණය ගේහසිත නිත්‍ය වු පංච ශිලයයි. එහි ඇතුළත් තෙවන හා පස්වන ශික්ෂා පද පුද්ගල කායික හා මානසික නිරෝගී භාවය සඳහා පාදක වේ. කාම මිච්ඡාචාරය අනේකාකාර වූ රෝගාබාධයන්ට ගොදුරු වීමට ප්‍රධාන කරුණක් වී හමාරය. එය නූතන ලෝකය දෙස විමසිලිමත් වීමේදී ප්‍රත්‍යක්ෂ වේ. එය දරුණු මාරාන්තික රෝග දක්වාම ව්‍යාප්ත වී තිබේ. එමෙන්ම මත් දියර හා මත් ද්‍රව්‍ය භාවිතය ද අද වන විට විවිධාකාර වූ මාරාන්තික රෝග වැළදීම දක්වා ද ව්‍යාප්ත වී හමාරය. එබැවින් මෙබදු දැඩි සේ අතුරු ආන්තරා ඇති වීමට මූල බීජයන්ගෙන් කායික මානසික නිරෝගී භාවය උදාකර ගැනීමට උපදෙස් බුදුදහමෙන් පෙන්වා දෙයි.

එනිසාම බුදුරදුන් "වෙජ්ජුපටො පිනවරෝ" යනුවෙන් වෛද්‍යවරයෙකුට උපමා කොට ඇත. ලෝවැඩ සඟරා කතුවර වීදාගම මහා මෛත්‍රෙය හිමි බුදුරදුන් "සත්හට වන බව දුකට වෙදාණන්" යනුවෙන් ද හඳුන්වා ඇත.

කායික නිරෝගී බව සඳහා ප්‍රධාන වශයෙන්

1.පරිසරය පවිත්‍රව තබා ගැනීම
2.පිරිසිදු ජලය පරිහරණය
3.පමණ දැන ආහාර ගැනීම

යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය.බුදුරදුන් අනුදැන වදාරා ඇත. එමෙන්ම මානසික සෞඛ්‍ය උදා කරන එකම බෞද්ධ පිළිවෙත භාවනාවයි.

පෙර කී ලෙස පෘථග්ජන අපි හැම රෝගීන්ය. කායික මෙන්ම මානසික රෝග වලින් නිරතුරුවම පෙලේ. එබැවින් එබඳු රෝගීන් පිළිබඳව බුදුහු අමතක නො කළහ. යමෙක් රෝගීන්ට උපස්ථාන කරයිද ඔහු තමාට (බුදුරදුන්ට) උපස්ථාන කරන්නාක් වැනිය. යනුවෙන් උන් වහන්සේ දේශනා කළහ. "යෝ ගිලානං උපට්ඨෙය්‍ය සො මං උපට්ඨෙය්‍ය"

එමෙන්ම ගිලනුන්ට උපස්ථාන කිරීමෙහි යෙදෙන තැනැත්තා තුළ තිබිය යුතු ගුණාංග පහක් ද දේශනා කොට ඇත.

1 බෙහෙත් සංවිධානය කරගැනීමට සමත් විය යුතුය.
2 ලෙඩාට හිත අහිත දේ දැනගත යුතුය.
3 ලාභ ප්‍රයෝජන අපේක්ෂා නො කළ යුතුය.
4 රෝගියාගේ මළ මූත්‍ර අතපත ගෑමට පිළිකුල් නොකළ යුතුය.
5 රෝගියෙකුගේ සිතෙහි ධෛර්ය සැනසීම සතුට උපදින කතාවෙහි සමත් විය යුතුය.

එමෙන්ම රෝගියෙකු තුළ තිබිය යුතු ගුණාංග පහක් ද පෙන්වා දුන්හ.

1 රෝගියා තමාට හිතකර දේ පමණක් ගත යුතුය.
2 එම හිතකර දේවල්හි පමණ දැනගත යුතුය.

15 පිටුවට....

ශාස්ත්‍රපති පූජ්‍ය බුදුගල සෝමරතන හිමි
බුදුගල රජමහ විහාරය
බළන්ගොඩ

රංගිරි ශ්‍රී ලංකා
RSL NEWSPAPER

# සඳ සිසිල

සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.




## ඇසළ පොහොය දා...

බරණැස මිගදායේ ඇසළ පොහෝදා
දම්සක් සතුරින් ලොවට දහම් දෙසූදා
පස්වග මහණුන් නැණයෙන් මොක්පුර ගියදා
දහම් එළිය ඒකාලෝකය ඇතිකල දා

සව්සත සසරින් එතෙර කරන්නට
දම් දෙසුවේ ලොව ඇති තතු පහදාලන්නට
සදහම් ගුණයෙන් ලෝ සත සනසාලන්නට
තෙරුවන් ගුණ නිති සිහිකර සිරසා නමදින්නට

දහම් සිසලසක් ගෙන දෙයි වෙහෙරෙන්
කරුණා ගුණයෙන් සත්වග පෑ කුළුණින්
ලෝසත සනසන බුදුගුණ ගගුලැල්ලෙන්
සැමදා වඳිනෙමි මේ ලෙස බැතියෙන්

අජන්තා ශිරෝමණී දිසානායක

## ලැබූ මිනිස් ජීවිතය සහ බුදු ගුණ සිතා කුසලයට යොමු වන්න.

මිනිසුන් අතර මිනිසා තිරිසන් වන්නේ
සදාචාර ගතිගුණයෙන් පිරි හෙන්නේ
සදහම් දිවයිනම පිරිහීමට යන්නේ
පන්සිල් රැක්කොතින් මිනිසුන් බබලන්නේ

මුලු සිරිලක්දිවෙහි තෙරුවන් බබලනවා
ගුණදම් වඩන මිනිසුන් ජීවත් වෙන්වා
සසර වසන තුරු පව්කම් නොකරනවා

බුදුගුණ භාවනාවට හිත යොදමු අපි
අනන්ත වූ බුදුගුණ සිහිකරනු අපි
කල් මර මරා කාලය ගත නොකර අපි
සසරින් මිදෙන්නට බුදුගුණ කියමු අපි

රණතුංග රන්දෙණිය

## ඇසළ සඳ නැගෙයි

සසල සිතක නිසසල බුදු නුවණ කරා
විදුල එළිය විහිදා විදුරසුන් දරා
පතල මහා කරුණා බුදු ගුණය පෙරා
ඇසළ සඳ නැගෙයි පුර පස ගුවන අරා

සව් සත වෙත පතළ කරුණා ගුණ සමුදා
පව් මළ නසා සිත්මල දහමින් පුබුදා
සිව් සත් දහම දෙසුමට වනයට මිගදා
ලොව් තුරු සුවය ගෙන වැඩියා බුදු සම්දා

ගුමු ගුමු නදින් බිඟු වනමල් මත පුබුදු
සමු ගෙන අවර ගිර තවමත් ඇත තරිඳු
යොමු වී සසල නෙතකට නිසසල ගිජිඳු
හමු විය උපක ආජීවක හට මුනිඳු

බබලනු පෙනේ සුදු මුදු සඳ සදිසි වත
සරසනු දැනේ නිසසල ගුණ බරිනි නෙත
ඉවසනු නොහැක හඳුනාගත යුතුව ඇත
පවසනු මැනවි ඔබ කවුරුද "කළණ මිත"

නිම නැති සසර නොදුටිමි බිඳකදු සැපක
කුම කට ගැලෙනු සැප යයි රැවටී පවෙක
දමනය කළෙමි ඉඳුරන් සිව්සස් මගක
මම සම්බුදු පදවි ලත් මිනිසෙකි උපක

සුභ ගමනක්ය යන්නේ මිහි අසම සම
පබ සර වත කමල දිදුලයි නිබද වම
ලැබ ගත් බැවින් බුදු පදවිය නියත වම
ඔබ ජින කෙනෙකු ලෙස සලකම් සම්ද මම

ජීවන ගමන මඟ ලොව්තුරු මඟට ගෙන
නෑවෙන කෙනෙක් මා තරමට සතුටු වන
ඒ ගැන සිතා ඔබ හඳුනන කරුණු දැන
මාවැනි අයට කිව හැකිවෙයි අනත ජින

නිමා නොවන සසරේ බැම් හැඳින ගමී
අමා බෙරය වැයුමට බරණැසට යමී
පමා නොවී ලෝ සතහට සරණ වෙමී
මෙමා ලැබූ සැනසුම දී සනස වමී

කුළුණෙන් ලතෙන් තිත් ගණදුරු දුරු කරන
අලු කළ සියලු ලෝ තුන්ලෝ මිණි පහන
මුලු හදවතින් වඳිනෙමි ඔබ යුග සරණ
ගිලුනා මසිත ඔබ ගුණ සයුරේ දිලෙන

විහගුන් ගයන කල වන මැද බැති ගීත
සුරඹුන් වඳිති හිඳ මුනිඳුන් දුර ඇත
හරසුන් දිව්මගට නිසි මග දෙන දෑත
මුණිදුන් වඩිති මිගදායට සුව් නීත

ඒ.එම්.වික්‍රමසිංහ අතපත්තු

# ඇසළ සඳට ගැයුනු



# ග්‍රැමෆෝන් ගී



## ඇසළ පෙරහැර

සිංහල ජන සංගීත මැවුනා
හේවිසි ගැට බෙර නාද ඇසුනා
දළඳා පෙරහැර මේ

සිරියා පා සුර ලෝකේ වාගේ
දූන් පෙරහැර එනවා
දළඳා පෙරහැර මේ

වන්නම් කියවෙනවා
නැටුවන් රඟදෙනවා
කස හඬ මැද්දේ - ඇත්පෙළ ඇද්දේ
තව ගොන්නක් එන්නේ

සාදු සාදු හඬදේ
මල් සුවඳින් සැනහේ
එක එක තාලෙට - කියවෙන් වන්නම්
තාලෙට මුසුවන්නේ

ලොවම මහා පුදුමේ
හෙළ නැටුමේ මහිමේ
සැමදෙන දුටුවේ - පෙරහැර දාටයි
සිංහලයේ උරුමේ

මල්වැල් හිනැහෙනවා - සඳ රැස්
බැබලෙනවා
පෙරහැර කාලේ - වන්නම් තාළේ
සිහලේ ජය පැතිරේ

**පද රචනය - ධර්මසිරි ගමගේ**
**ගායනය/ සංගීතය - සුසිල් ප්‍රේමරත්න**

## ඇසළ සඳට ඉඬදීලා

ඇසළ සඳට ඉඬදීලා
කන්ථක අසු සරසාලා
මහ රෑ ඇයි ඔබ අමතන්නේ
යසෝදරා මව් අරණේ - රහල් පුතා නිදියන්නේ
මහ රෑ ඔබ කොයිබද යන්නේ

හෙට අලුයම හිරු එළියේ
ආපසු මැඳුරට එයිදෝ
සුද්ධෝදන මහ නිරිඳුන් - ඒ පිළිබඳ විමසයිදෝ
කුමක් කියම්දෝ කුමරුනි - කුමක් කියම්දෝ

මේ යන ගමන තුන් ලොවටම
සෙතක් වෙතැයි ඔබ පවසයි
ඒ ලෙස ඒ සෙත ඉටුවුණු පසු
හෙට එළිවෙන්නට කලියෙන්
යළිත් එනවදෝ කුමරුනි - යළිත් එනවදෝ

තනුව හා සංගීතය - සෝමදාස ඇල්විටිගල
ගායනය - මිල්ටන් මල්ලව ආරච්චි
පද මාලාව - ප්‍රේමකීර්ති ද අල්විස්

**ඉදිරිපත් කරන්නේ**
**දඹුල්ල ඩිපෝවේ හිටපු අධිකාරී, සංගීතඥ**
**හේමාල් යසනාථ විජේසිංහ**


## ප්‍රඥා ප්‍රදීප දල්වා

ප්‍රඥා ප්‍රදීප දල්වා
මෝහාන්ධකාර වනසා
ලෝකාලෝක සදාලා - වජ්‍රාසනාරූඪවූ
ශ්‍රී ඝන මෛත්‍රී මූර්ති
ශ්‍රී පද පද්ම නමාමි

කරුණා සීතල හදිනි
වස්වා සද්ධර්ම වර්ෂා
ජනතා විමුක්ති සලසා
පෑ ලෝකානුකම්පා
ශ්‍රී ඝන මෛත්‍රී මූර්ති
ශ්‍රී පද පද්ම නමාමි
පාරමිතා උපකාරී - පුණ්‍ය ක්‍රියා බලධාරී
ඥාණ විශේෂ නිවාසී
මාර පරාජිත සෑසී
ශ්‍රී ඝන මෛත්‍රී මූර්ති
ශ්‍රී පද පද්ම නමාමි

පද මාලාව - විමලෙන්ද්‍ර චතුරේගම
සංගීතය - පී. ඩන්ස්ටන්ද සිල්වා
ගායනය - නන්දා මාලනී

# ආදර්ශයෙන් යුතුව කටයුතු කරමු



**අවවාදයට වඩා ආදර්ශය ඉතාමත්ම වටිනා බව අපට බුදුපියාණන් වහන්සේගේ ජීවන චරිතයෙන් අනන්තවත් පිළිඹිබු වේ. උන්වහන්සේ බුදු වී පිරිනිවන් පානා තෙක්ම එනම් හතලිස් පස් වසරක් පුරාම ලෝකයාට කරන ලද අපිරිමිත සේවාව කොතෙක්දැයි කියා අගය කිරීමට තරම් සමතෙක් ලොව තවම පහළ වී නොමැත.**

ඒ තරම්ම උන්වහන්සේගේ ධර්මස්කන්ධය අනන්තයි. අප්‍රමාණයි. ගැඹුරුයි. දෙසූ සෑම දහමක් තුළම උන්වහන්සේගෙන් පිළිබිඹුවුයේ අවවාදයට වඩා ආදර්ශයයි. මුළු ජීවිතය පුරාම උන්වහන්සේ දෙසූ ශ්‍රී සද්ධර්මය පැවිදි ලෞකික සෑම සිත්සතන් කෙරෙහිම අසීමිතව ගලා ගියේ උන්වහන්සේගේ ආදර්ශයෙන් පිරී ජීවන චරිතය නිසාවෙනි.

එසේ නම් උන්වහන්සේ වෙතින් ලොවට දුන් ඒ උතුම් ආදර්ශය අපගේ ලෞකික ජීවිතවලට උකහා ගන්නේ නම් කෙතරම් වැඩදායක වන්නේද? සිතා බලන්න.

අද සමාජය දෙස බලන කල අවවාද දෙන්නෝ අපට අනන්තවත් මුණ ගැසෙති. එනමුදු ආදර්ශයෙන් යුතුව ක්‍රියා කරන්නෝ නම් දකින්ට ලැබෙන්නේ ඉතාමත් අල්ප වශයෙනි. බොහෝවිට මේ අවවාද දෙන්නෝ ළඟ ආදර්ශය දකින්න ලැබෙන්නේ නැත. ඔවුන් තම දරු පවුල් වලට සමාජයට ගමට රටට දෙන්නේ වැරදි ආදර්ශයන්ය. බොරුවෙන් මුවාවී පිටතට පෙන්වන්නේ භික්මුණු, දැහැමි චරිතයන්ය. මෙවන් චරිතයන් පිටතින් පෙන්වා ඔවුන් ගතකරන්නේ වැරදි ආකල්පයන් තුළෙහිය.

ආදර්ශයෙන් තොර වැරදි ක්‍රියා මාර්ගයන් තුළෙහිය. තවත් සමහරෙක් අනුන්ට අවවාද අනුශාසනා දෙමින් පෙනි පෙනී වැරදි වැඩ කරති. බොහෝවිට මෙවන් චරිත දේශපාලන භූමිකාව තුළද, පවුල් සංස්ථාවන් තුළද සුලබව දැකිය හැක. මව, පියා- වැඩිහිටි සහෝදරාදීන්, නැන්දා - මාමා, බාප්පා වැනි පවුලේ ඥාතීන් අතර කොතෙකුත් වැදි ආදර්ශයන් තම දරුවන් ඉදිරියේ සිදුවන අයුරු දැකිය හැක.

ඇතැම් පියවරුන් තම ලාබාල දරුවන් ලවා මත්වතුර බෝතලය ගෙන්වා ගැනීම, කඩ පිලට යවා දුම්වැටි ගෙන්වා ගැනීම වැනි ක්‍රියාවන්හි යෙදෙති. එබඳු අය සිතන්නේ නැහැ තම දරුවාත් යම් කලෙක එම වැරදි ආදර්ශයෙන් ක්‍රියාවට පෙලෙඹෙන බව.ඇතැම් මව්වරුන්ද එලෙසමයි. තම හැදෙන දරුවන් ඉදිරියේ නොයෙකුත් වැරදි ක්‍රියාවනට හුරුවී සිටිති. දරුවනට අසංවර ලෙස කථා බහ කරති. ආදර වදනක් එවන් මව්වරුන් තුළ ඇත්තේම නැත. තම දරුවන් ඉදිරියේ තම ස්වාමිපුරුෂයාට පවා අසංවර ලෙස, අකීකරු ලෙස, කතා බහ කරති. හැසිරෙති. දරුවන්ද අනිවාර්යයෙන්ම ඒ මඟ යන්නාහ. නමුත් මේ මව්වරුනට තම දරුවන්ද කවදා හෝ වැඩිහිටි තත්ත්වයට පත්වූ කාලයක ඔවුන්ද එසේ හැසිරෙන බව ඔවුන් මොහොතකටවත් නොසිතති. ඇතැමුන්ට එසේ සිතීමට පවා මොළයක් ශක්තියක් නැත. නමුත් තම දරුවන් නොහොබිනා අන්දමින් හැසිරෙනු දුටු කල දරුවනට ගහති. බැණ වදිති. මෙය කකුළුවා ඇදයට යමින් තම පැටවුනට කෙළින් යන්ටෙයි කියා අවවාද කරන්නාක් වැනිය.

නමුත් අවවාද දෙමින් සංවරශීලීව හැසිරෙමින් තම දරුවනට ආදරයෙන් කතා බහ කරමින් දරුවන්ව යහමග යවනා සාමකාමී සුන්දර වූ සිතුම් පැතුම් තුළින් පිරිපුන් ආදර්ශයෙහි පිහිටා කටයුතු කරන දෙමාපියන්ද මේ අතර සමාජයේ සිටිනා බව අප අමතක නොකළ යුතුය. එවන් සුපිරි චරිතයන් ගෙන් හෙබි ජීවිතවලට මේ ලියන මාගේ උපහාරය පමණක් නොව සමාජයේද උපහාරය නොඅඩුව ලැබෙනු ඇත.

පවුල් සංස්ථාවන් තුළින් විවිධ දුර්වලතාවන් දකිද්දී සමාජයේ විවිධ තරාතිරමේ උගත්, ප්‍රබුද්ධ අය අතරින්ද යටකී දුර්වල තැන් එමට ඇති බව අත් විදීමෙන්ම කිව හැක. දැකිය හැක. ගුරු දෙවිවරුන් ලෙස සමාජයේ ඉතා ආදරයෙන්, හා ගෞරවයෙන් පිදුම් ලබන, ගෝලබාලයින්ගෙන් වැදුම් පිදුම් ලබන අපගේ ආදරණීය ගුරුමව්වරු ගුරු පියවරු ගැනයි. පාසලෙන් පමණක් නොව විශ්ව විද්‍යාල ආචාර්ය, මහාචාර්යවරුන් අතරින් පවා සුළු පිරිසකගෙන් පමණක් ආදර්ශයෙන් තොර වැරදි ක්‍රියාවන් දැකිය හැක.

එබැවින් මේ සියලු දුසිරිත් හා දුරාචාරයන්ගෙන් මිදී ආදර්ශවත් ජීවිත ගතකරන ලෙස අපි සියලු ශ්‍රී ලාංකිකයන්ගෙන් ඉල්ලා සිටිමු. එවිට අපේ අනාගත පරපුරද ඒ අනුව යලිත් යහපත් ගුණවත් සාරධර්ම අගයන පිරිසක් බවට පත්වේවි. අවවාදයට වඩා ආදර්ශය උතුම්ය යන්න අප සැමගේම තේමා පාඨය බවට පත්කර ගනිමු.

**චන්ද්‍රලතා සුමනසේකර**

# දෙවිවරු පිළිබඳ බෞද්ධ සංකල්පය



බුදු දහමෙහි දේව සංකල්පය සම්පූර්ණයෙන් බැහැර කළ බවක් නොපෙනේ. බුදුදහමට සම්බන්ධ දේවතාවන් ගැන තොරතුරු ඇතුළත් වන අවස්තාවන් අපට දැකගත හැකිය. බුදු දහමට අයත් සූත්‍ර කිහිපයකම දෙවියන් ගැන සඳහන් වී තිබේ. මහා සමය සූත්‍රය මංගල සූත්‍රය කරණීය මෙත්ත සූත්‍රය උදාහරණ වශයෙන් දැක්විය හැකිය. විශේෂයෙන් මහාසමය සූත්‍රයෙන් විස්තර වන්නේ විවිධ දෙවිවරුන්ගේ තොරතුරුය.

බුද්ධ චරිතයෙන්ද දෙවිවරු ගැන තොරතුරු සඳහන් වෙයි. බුද්ධත්වය ලබා සතියක් බෝ මැඩ වැඩ සිටි බුදුරජාණන් වහන්සේ බුදු වී නැත යන සිතුවිල්ලක් දෙවියන්ට ඇතිවූ බවත් එම සිතුවිල්ලට පිළිතුරු වශයෙන් බුදුරජාණන් වහන්සේ දෙවියන් ඉදිරියේ ප්‍රාතිහාර්ය පෑ බව සඳහන් වේ.

බුදුරජාණන් වහන්සේගේ දින චරියාවෙහිද දෙවිවරුන් උදෙසා වේලාවක් වෙන්කර තිබූ බව බුද්ධ චරිතයෙන් පැහැදිළි වෙයි. සාමාන්‍ය ජනයා නිදාගත්තායින් පසු මැදියම් රාත්‍රියෙහි දෙවිවරුන්ට දහම් දෙසීම සිදුකර ඇති බව බුද්ධ චරිතයෙන් පැහැදිළි වෙයි. මංගල සූත්‍රයට හේතු වූ මංගල කරුණු මොනවාද යන්න බුදුරජාණන් වහන්සේගෙන් විමසා දැන ගැනීමට ජේතවනාරාමයට දෙවිවරු පැමිණි බවත් ඒ අනුව මංගල කරුණු බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ බවත් විස්තර වෙයි.

බුදු දහමෙහි දක්වෙන පරිදි අල්පේශාක්‍ය මහේශාක්‍ය වශයෙන් දෙවිවරු කොටස් දෙකකට බෙදේ. පෘථිවිය හා ගස් ගල් පර්වත ආශ්‍රිතව වෙසෙන භූමාටු දෙවිවරු ගැනද සඳහන් වෙයි. ප්‍රධාන දෙවියා වශයෙන් බුදුදහමෙහි සඳහන් වන්නේ ශක්‍රදේවේන්ද්‍රයාය. දෙව් ලොවට අධිපතියා වශයෙන් හඳුන්වා දී තිබේ. දැහැමි ජීවිත ගතකරන මිනිසුන්ට ශක්‍ර දේවේන්ද්‍රයා ගරු කරන බවත් ඔවුන් ආරක්‍ෂා කරන බවත් විස්තර වේ. ඒ බව මෙසේ දක්වේ.

''යෙ ගහට්ඨා පුඤ්ඤකරා - සීලවන්තා උපාසකා
ධම්මෙනදාරං පොසෙන්ති - තං නමස්සාමි''

මාතලී යනුවෙනි.

දෙව් ලොවට අධිපති වූ ශක්‍ර දේවේන්ද්‍රයාගේ පවා වන්දනාවට භාජනය වන දැහැමි මිනිසුන් මනුලොව සිටින බව මෙම විස්තරයෙන් දක්වේ. මෙයින් පැහැදිළි වන වැදගත් කරුණක් වන්නේ දෙවියන්ට වඩා ගුණවත් මිනිසා උතුම්වන බවයි. දෙවියන් ඇදහීම බෞද්ධයාට අයිති දෙයක් නොවන බවත් පුණ්‍ය ක්‍රියාවක් සිදුකොට පිංදීම කළ යුතු බවත් බුදුදහමෙහි සඳහන් වේ. දේව විශ්වාසයන්ට නින්දා කිරීමක් හෝ ගැරහීමක් නොකළ යුතු බවද, බුදු දහමෙහි විස්තර වෙයි.



සතරවරම් දෙවිවරු ගැනද බුදු දහමෙහි තොරතුරු ඇතුළත් වී තිබේ. දැහැමි ජීවිත ගතකරන ජනතාවගේ ආරක්‍ෂාව මෙමගින් සිදුවන බවත් දක්වේ. දුතරාෂ්ඨ, විරූඪ, විරූපාක්‍ෂ, වෛශ්‍රවණ යන දෙවිවරු මෙසේ නම් කර තිබේ. සම්‍යක් දෘෂ්ටික දෙවිවරු වශයෙන් මේ අය හැඳින්වේ. මිථ්‍යාදෘෂ්ටික දෙවිවරු බුදුසමයට අයත් නොවේ. එසේ වුවත් එම දෙවිවරුන් ගැරහීමට භාජනය කර නොමැත. බුදුසමය ආගම් නිදහස මැනවින් ලබාදී තිබේ. බෞද්ධ භික්ෂූන් වහන්සේ ධර්මදේශනාවක් පැවැත්වීමට ප්‍රථම දෙවිවරුන් උදෙසා ආරාධනයක් සිදුකිරීම පැරණි බෞද්ධ චාරිත්‍රයකි.

බුදුරජාණන් වහන්සේ ලංකාවට වැඩි අවස්ථාවේ සුමන සමන් දෙවිඳුන්ගේ ආරාධනයෙන් සමනල පර්වතයෙහි සිරිපා පිහිටවූ බව වංශකථාවල සඳහන් වෙයි. මිහිඳු මහ රහතන් වහන්සේ මිහින්තලා පර්වතයට වැඩි දිනයේ දෙවියන්ට ආරාධනා කළ බව ආරාධනා ගල නමින් උස් පර්වතයක් හඳුන්වාදීමෙන් පැහැදිළි වේ.

දුටුගැමුණු රජතුමා අනුරාධපුර මහමෙව්නා උයනේ තිබූ තෙළඹු ගසක් කැපීමට ගියවිට එහි අරක්ගත් ස්වර්ණමාලී දෙවිදුවක් හඬා වැලපුන බවත් ඇයගේ නම සඳහන් කර ථූපය කරවන්නේනම් එම ස්ථානයෙන් ඉවත්ව යන බවත් ඇය ප්‍රකාශ කළ බව වංශකථාවල සඳහන් වෙයි. ඒ අනුව තෙළඹුගස කපා ඉවත්කර එම ස්ථානයේ ස්වර්ණමාලී නමින් ස්ථූපයක් කරවූ බව වැඩිදුරටත් සඳහන් වේ.

වර්තමානය වන විට ලෝකයේ වෙසෙන දෙවිවරුන්ගේ සංඛ්‍යාව ඉතා විශාලය. විවිධ මත ඔස්සේ බිහිවූ දෙවිවරුන් දැකගත හැකිය. සංඛ්‍යාවක් වශයෙන් වර්ග කිරීම පවා ඉතා අපහසුය. මනුලොව වෙසෙන මිනිසුන්ගේ පිනෙන් යැපෙන පිරිසක් දෙවිවරු හඳුන්වාදී තිබීම සැළකිය යුතු කරුණකි. ඒ අනුව කළයුතුව ඇත්තේ යහපත් ක්‍රියාවන් සිදුකොට (පිංකම්) දෙවිවරුන්ට පිං අනුමෝදන් කරවීමය. එවිට දෙවිවරුන්ගේ ආරක්‍ෂාව නිසිලෙස සිදුවෙන බවත්ය.

දෙවිවරුන්ගේ පිහිට පතා ඒ පසුපස අනවශ්‍ය ලෙස ගමන් කිරීම බලාපොරොත්තු තබාගැනීම අනුවණකමකි. දැහැමි පිළිවෙත් අනුගමනය කරමින් සුචරිතවත්ව කටයුතු කිරීම දෙවිවරුන්ගේ පිහිට ලැබීමට හේතුවන බුදුදහමෙන් පෙන්වා දී තිබේ. උසස් මනසක් ඇති මිනිසා විසින් කළ යුත්තේ එය බව කිවහැකිය.

විජය තලවත්තේගෙදර

# සිතක් යනු පංචඋපාදානස්කන්ධයක්.



සිතක් කියන්නේ ක්‍රියාවක්. එසේ කියන්නේ සිතක් හටගන්නේ නැත්නම් කිසිම ක්‍රියාවක් කරන්න නොහැකිය. මේ සිතට බොහෝ නම් තියෙනවා. සිතක් කිව්වත් එකයි පංචඋපාදානස්කන්ධයක් කිව්වත් එකයි. සිතක් කිව්වත් එකයි ලෝකය කිව්වත් එකයි. සිතක් කිව්වත් එකයි දුකක් කිව්වත් එකයි. සිතක් කිව්වත් එකයි සංඛාරා කිව්වත් එකයි. තව බොහෝ නම් හිතට ධර්මයේ සඳහන් වෙනවා. එසේම මේ හැම නමක්ම යෙදිලා තියෙන්නේ අන්වර්ථ නාම හැටියටයි. හැම නමකම අර්ථයක් ඇතිව යෙදී ඇත.

සතර සති පට්ඨාන දේශනාව අනුව සිතට අනුව බලමින් චිත්තේ චිත්තානු පස්සි විහරති කෙලෙස් තවන වීර්යෙන් ආතාපි සම්පජාණෝ සතිමා සිහියෙන් අභිජ්ඣා දෝමනස්සං ඇලීම ගැටීම විනෙය්‍ය ලෝකේ හිත ඇති නොවීමට කටයුතු කිරීමට සතියෙන් වාසය කිරීම කළ යුතුය.

ඇලීම ගැටීම යනු තණ්හාවයි. තණ්හාව යනු දුකේ හේතුවයි. තණ්හාව හටගන්නේ අභිජ්ජාව නිසා හෙවත් ලෝකයේ හෙවත් හිතේ යථාර්ථය නොදැකීම නිසයි. අවිජ්ජා පච්චයා සංඛාර යනුවෙන් වදාලේ මේ ධර්මතාවයි. සංඛාර හෙවත් කර්ම ඇති නොවීමට නම් හිත තණ්හාවට හා උපාදානයට පත් නොවීමට වගබලා ගතයුතුය. එසේ නම් යෝනිසෝ මනසිකාරයෙන් යථාර්ථය විනිවිද දකිමින් සතියෙන් අප්‍රමාදීව වාසය කිරීම කල යුතුය.

ඒ සඳහා හිතේ යථාර්ථය දැකිය යුතුය. ලෝකයේ යථාර්ථය දැකිය යුතුය. සතර සතිපට්ඨානය ඒ සඳහා නිර්දේශිතයි. කායානුපස්සනාව, වේදනානුපස්සනාව, චිත්තානුපස්සනාව ධම්මනාපස්සනා හතරයි.

ලෝකය නම කණට ඇසෙන විටම අපට මතකය අවදිවන්නේ ඉගෙන කියාගත් සම්මුති ලෝකයයි. එහෙම නැතිනම් විශ්වයටයි. මණ්ඩාකිනියටයි. නව ග්‍රහ වස්තූන්ටය. ඒ සම්මුති ලෝකට වශයෙන් හඳුන්වන්නේ හටගන්නාවූ ලෝක ධර්මයන්ගෙන් පහෙන් එක කොටසකටයි. පංච උපාදානස්තන්ධයෙන් රූප ස්කන්ධයට පමණින් සම්මුති ලෝකය තුල වේදනාවක් සංඥාවක් චේතනාවක් මනසිකාරයක්, විඤ්ඤානයක් හැඟීමක් දැනීමක් පෙන්නුම් නොකරයි. රූපය පමණි. ඒ අපරිපූර්ණ ලෝකයයි. පඨවි අපෝ, තේජෝ, වායෝ, ධාතු හතරක, ශක්ති 4ක සාමූහිකත්වයෙන් ප්‍රකට වන්නාවූ ස්වභාව ධර්මයෙකි. බුද්ධානුමත ලෝකය සිත හා කය දෙකම එකට සම්බන්ධීකරණය වීමෙන් ක්‍රියාත්මක ස්වභාවයක් ප්‍රකට වන්නාවූ ස්ථානයයි. ඒ හිතයි.

ශාන්ති නායකයින් වහන්සේ ගෙනහැර දක්වා පෙන්වා වදාල ලෝකය සිත හා කයයි. මෙම බඹයක් පමණ වු සවිඤ්ඤාණත්වය ප්‍රකට වන් සචේතනිකත්වට ඇති ලෝකට තුළ ලෝකයක් ලෝක සමුදායක් ලෝක නිරෝධයක් ලෝක නිරෝධ ගාමිණී පටිපදාවක් පෙන්වා වදාළහ.

පළමුවෙන්ම සතර සතිපට්ඨානයේ ඉගෙන ගැනීමට අනුදැන වදාළේ කය ඥානය ධාතුන්ගේ සාමූහිත එකතුවකි. ධාතු හතරකි. ශක්ති හතරකි. මේ එම භාව ශක්ති වේගවත් වීම නිසා විද්‍යාමාන වන්නාවූ දේ රූප නම් වේ. එය නිතරම ඇති වෙන්වා නැති වෙනවා. එම නිසා අනිත්‍යයයි. යමක් අනිත්‍ය නම් දුකයි. යමත් දුක නම් අනාත්මයි.

කය සම්බන්ධයෙන් අභ්‍යන්තර රූප විද්‍යමාන වේ. ඒ ස්වභාව ධර්මයකි. ඒවා නම් ඇස, කණ, නාසය, දිව, කය, මන වශයෙනි. කායානුපස්සනාව, සම්බන්ධයෙන් කෙස්, ලෝම, නිය, දත් ආදී වශයෙන් දෙතිස් රූපයක් ගැන සඳහන් වේ. නමුත් මේ අභ්‍යන්තර රූප සඳහන් වන්නේ සිත හෙවත් ලෝකය හටගැනීමේ ධර්මතාවය ගැන සඳහන් කිරිමේදීය. මේ අභ්‍යන්තර රූප වල ඔපවත් ස්වභාව ඇති තවත් රූප හයක් ඇත. ඒවා ප්‍රසාද රූප වශයෙන් හැඳින්වේ. ඒවා නම් චක්ඛු ප්‍රසාද රූපය, සෝත ප්‍රසාද රූපය, ඝාණ ප්‍රසාද රූපය, ජිව්හා ප්‍රසාද රූපය, කාය ප්‍රසාද රූපය, මනෝ ප්‍රසාද රූපය,යි. මේ ප්‍රසාද ගතියට ඔබවත් ස්වභාවයට බාහිරව ඇති වර්ණ රූප, ගන්ධ රූප, රස රූප, පොට්ඨබ්බ රූප, ධම්ම රූප ඇදී පැවතීමත් නිසා රූප දෙකක සම්බන්ධීකරණයක් සිදුවේ. මෙසේ අභ්‍යන්තර රූප, බාහිර රූප එකතුවීමේදි විඤ්ඤාන ධාතුව හටගනී. විඤ්ඤානය යනු ධාතුවක් ශක්තියක්. සිතක් සකස් වීමේ ශක්තියට විඤ්ඤාන ධාතුව නම් වේ. ඇසේ ඔපවත් ස්වභාවයට බාහිරෙන් වර්ණ රූපය ඇදි පැවතීම නිසා හටගන්නේ විඤ්ඤාන ශක්තියයි. ඇස උපකාරී කරගෙන බාහිර වර්ණ රූපය කෙරේ දැනුවත් වීම චක්ඛු විඤ්ඤාන ධාතුව නම් වේ. මෙසේ ඉතිරි ආයතන වල ඔපවත් ස්වභාවයට හෙවත් සෝත ප්‍රසාද රූපය, ඝාණ ප්‍රසාද රූපය වෙත ස්වභාවයෙන් ඇදි පවතින ශබ්ද රූප, ගන්ධ රූප නිසා විඤ්ඤාන ධාතුව හටගන්නා බව පැහැදිලිය. මේ ස්වභාව ධර්මයේ ක්‍රියාකාරිත්වයකි. තමන්ගේ හෝ පුද්ගලයෙකුගේ මෙහෙයවීමෙන් විධානයෙන් කැමැත්තක් මත සිදුවන්නක් නොවේ.

විඤ්ඤානය තනිව හටගන්නේ නැහැ. අවම වශයෙන් නාමධර්ම පහක් සමඟමයි හටගන්නේ. ඒ ඵස්ස වේදනා, සංඥා, චේතනා, මනසිකාර යන පහයි. මේ පහට සබ්බ චිත්ත සාධාරණ චෛතසික නම යෙදේ . හැම සිතක්ම හටගැනීමේදි මේ පහ අත්‍යවශ්‍ය වේ. මෙම නාමධර්ම වල ඵස්සයෙන් කෙරෙන කාර්ය වන්නේ අභ්‍යන්තර රූප, බාහිර රූප එකතුවීමයි. මේ එකතුවීමේදි විඤ්ඤානය හටගන්නවා නාම ධර්ම පහක් සමඟ. මොකද විඤ්ඤානය තනිව හටගන්න බැහැ. නාම රූප පච්චයා විඤ්ඤාණං යනුවෙන් වදාළේ මේ නිසයි. ඵස්සය නම් වූ නාම ධර්ම තුළ රූප විඤ්ඤානය. නාම තැනම විද්‍යමාන වේ. මනසිකාරයෙන් ඉතිරි වේදනා සංඥා චේතනාවලට ඉතිරි නාමධර්ම මතක් කිරීමක් යොමු කිරීමක් අවදි කිරීමක් සිදුවේ. චේචනාවෙන් සම්බන්ධ වෙලා තියෙන රූපය පිළිබඳ කැමැත්ත අකැමැත්ත ප්‍රකාශ වෙනවා. සංඥාවෙන් හඳුනා ගන්නවා. චේතනාවෙන් ක්‍රියාත්ම භාවයක් ප්‍රකට කරනවා. හඳුනා ගත්තේ වර්ණ රූපයක් නම් ඇස උපකාරි කරගෙන බලන සිත ක්‍රියාත්මකයි. හඳුනා ගත්තේ ශබ්ද රූපයක් නම් කණ උපකාරි කරගෙන අහන්නේ සිතෙන් නාම ධර්ම පහ ක්‍රියාත්මකයි. සිතත් වැඩ. බැලීමක් සිදුවීමක් පමණි. කරන්නෙක් මමෙක් සතෙක් පුද්ගලයෙක් නොමැත. සිතක ක්‍රියාකාරිත්වයක් පමණි. ඇස, කණ, නාසය, දිව ආදී දේ උපකරණ පමණි.

සත්වයා සම්බන්ධව ඇති ඇස, කණ, නාසය, දිව, කය, මන ඉන්ද්‍රිය වලට ද්වාර ආයතන ඉන්ද්‍රිය නම යෙදේ. මේ අන්වර්තනාමයි.

ද්වාර යනු දොරටු අර්ථයයි. මේ දොරටු වලින් වර්ණ රූප, ශබ්ද රූප, ගන්ධ රූප, රස රූප, පොට්ඨබ්බ රූප, ධම්ම රූප ඇතුලු වේ. (චක්ඛු ද්වාරයෙන් ඇතුලු වන්නේ වර්ණ රූපයයි) ආයතන යන නම යෙදෙන්නේ යමක් නිපදවන අර්ථයෙනි. චක්ඛු ආයතනයෙන් බලන සිත නම්වූ භාණ්ඩය නිපදවයි. සෝතායතනයෙන් අහන සිත නම් භාණ්ඩය නිපදවයි. ඝාණායතනයෙන් ආඝ්‍රාණය කරන සිත නම් භාණ්ඩය නිපදවයි. මේ නිසා මේවා වලට ආතනය නම යෙදේ. ඒ නිසාම චිත්තායන නම යෙදේ. ඉන්ද්‍රිය නම යෙදී ඇත්තේ නායකත්වය සඳහායි. සිතක් සකස්වීමට ඉන්ද්‍රිය නායකත්වය දෙනු ලැබේ. චක්ඛු ඉන්ද්‍රිය මගින් නිපදවනු ලබන්නේ බලන සිතයි. ඉතිරි ආයතන මේ ආකාරයෙන් දත යුතුය. බලන සිත නැමති භාණ්ඩය නිපදවීමට අමුද්‍රව්‍යය වන්නේ වර්ණ රූපයි. වර්ණ රූප නම් අමුද්‍රව්‍ය බාහිර තිබූ පලියට බලන සිත නම් භාණ්ඩය සකස් වෙන්නේ නිපදවන්නේ නැත. ගෙන්වා ගත යුතුයි. ගෙන්වා ගන්නේ චක්ඛු ප්‍රසාද රූපය මගිනි. චක්ඛු ප්‍රසාද රූපය මගින් බාහිර වර්ණ රූපය ගෙන්වා ගැනිමේදී චක්ඛු විඤ්ඤාන ධාතුව හටගන්නවා. මේ විඤ්ඤාන ධාතුව කර්මාන්ත ශාලාවක ඇති මැෂිම හා සමානයි.

මෙසේ භාණ්ඩයක් එළිදැක්වීමට නිමි භාණ්ඩයක් වශයෙන් අතට පත්වීමට අවස්ථා කීපයක් පසු කර ආ යුතුය. ආයතනයක් තිබිය යුතුය. අමුද්‍රව්‍ය තිබිය යුතුයි. අමුද්‍රව්‍ය කර්මාන්ත ශාලාවට ප්‍රවාහනය කළ යුතුයි. මැෂිමක් උවමනායි. මේ සියල්ලගේ සාමූහික ක්‍රියාකාරිත්වය තුළින් ඉහත නිමි භාණ්ඩයක් දැකිය හැක්කේ.

එසේම බලන සිත නම් නිමි භාණ්ඩය නිපදවීමට චක්ඛු ආයතනය තිබිය යුතුයි. අමුද්‍රව්‍ය වන්නේ වර්ණ රූපයි. වර්ණ රූප බාහිර තිබූ පලියට භාණ්ඩ නිපදවිය නොහැක. ඇතුලට ගෙන්වා ගත යුතුයි. ගෙන්වා ගන්නේ චක්ඛු ප්‍රසාද රූපයෙනි. නිෂ්පාදන ශක්තිය හෙවත් මැෂිම වන්නේ චක්ඛු විඤ්ඤාන ධාතුවයි.

මෙසේ සියලුම ආයතන වල මේ ආකාරයෙන් ස්වභාව ධර්මයේ ක්‍රියාකාරිත්වය බලගන්වන නිසා බලන සිත, අහන සිත, ආඝාණය කරන සිත, රස බලන සිත, පහස ලබන සිත, මෙනෙහි කරන සිත නිපදවන බව වටහා ගත යුතුය.

අභ්‍යන්තර රූපවල ඇති ඔපවත් ස්වභාවය නිසා දීප්තිමත් ස්වභාවය නිසා බාහිර වර්ණ රූප, ශබ්ද රූපාදී බාහිර රූප ඇදී පවතින බව සඳහන් කළා. මේ සම්බන්ධීකරණය වීමේදී වහාම නාම ධර්ම පහ හටගනී.

එම පහ තුළ ක්‍රියාත්මභාවය මෙසේ සඳහන් කළ හැක. ඵස්සයෙන් රූපය ස්පර්ශවීමක් වේදනාවෙන් කැමැත්ත අකැමැත්ත ප්‍රකාශවීමත් සංඥාවෙන් හඳුනාගැනීමත් චේතනාවෙන් ක්‍රියාත්මක භාවයත් මනසිකාරයෙන් සියලුම නාමධර්ම වලට යොමුකිරීමත් සඳහන් කළ හැක.

මෙම නාම ධර්ම පහ තුළින් පංච උපාදානස්කන්ධයක් හටගන්නවා. හෙවත් හිතක් හට ගන්නවා. ඒ රූපස්කන්ධය, වේදනාස්කන්ධය, සංඥාස්කන්ධය, සංඛාරස්කන්ධය, විඤ්ඤානස්කන්ධය යන පංචස්කන්ධයයි. ඒ මෙසේය. රූපස්කන්ධය ප්‍රකාශවීමට ඵස්සය තිබිය යුතුයි. වේදනාවෙන් වේදනාස්කන්ධය ප්‍රකාශ වෙන්වා. සංඥාස්කන්ධයෙන් සංඥාව ප්‍රකාශ වෙනවා. සංඛාර ස්කන්ධය තුළ චේතනාව ප්‍රකාශ වේ. සංඛාර යනු කර්මවේ. චේතනාව වේ. විඤ්ඤානය තුළ සියලුම නාමධර්ම බැසගෙන තියෙනවා. විඤ්ඤානයෙන් තොරව නාමධර්ම හටගන්නේ නැති නිසා. ඒ නිසා සිතකට කියන්නේ පංචඋපාදානස්කන්ධයක් කියලයි. උදාහරණයක් වශයෙන් බලන සිත තුළ පංචඋපාදානස්කන්ධය ප්‍රකට වන්නේ දැයි විමසා බලමු. පින්තූරයක් දිහා බලන්න. මලක් දිහා බලන්න. බලන සිතකි. රූපස්කන්ධය යනු වර්ණ රූපයයි. වේදනාස්කන්ධය යනු ඒ පිංතූරයට හෝ මලට කැමැත්තට ඇලීම හෝ අකමැත්තට ගැටීම නම්වූ විඳීමයි. සංඥාස්කන්ධය යනු වර්ණ රූපයක් යනු වෙන් හඳුනා ගැනීමයි. සංඛාරස්කන්ධය යනු බැලීමක් සිදුවීමක් ස්වභාව ධර්මයේ ක්‍රියාකාරිත්වයක් පමණි. සංකාර යනු කර්මයයි. රහත් නොවූ සෑම සිතක මෙන්ම ඒ සිත තුලත් තණ්හාව තිබෙන නිසා සංඛාර නම යෙදේ. අවිද්‍යාවෙන් තණ්හාවෙන් තෙතමනය වී ඇති බැවිනි. මේ නිසා සිතක් කිව්වත් එකයි පංච උපාදානස්කන්ධයක් කිව්වත් එකයි.

ඉහත සඳහන් කරුණු තහවුරු කර ගැනීමට තවත් ආයතනයක් සම්බන්ධ කරගෙන පංචඋපාදානස්කන්ධයක් සකස් කර ගනිමු. ඔබට අවට සත්තු කෑ ගහනවා ඇහෙනවා. ලේනෙක් හෝ කුරුල්ලෙක් කෑ ගසන හඬ අහන්න. ඔබ අහගෙන ඉන්නවා කියනවා. නමුත් සිතක් ක්‍රියාත්මක භාවයක් නේද? අහන සික කිව්වත් එකයි අහන ක්‍රියාව කිව්වත් එකයි ඒ සිතට කියන්නේ පංචඋපාදානස්කන්ධය කියලා. කෙසේ ද? පංචඋපාදානස්කන්ධයක් ඒ තුල සකස් වෙන්නේ කියලා බලමු. ශබ්දය තුල ඇත්තේ රූපස්කන්ධයයි. වේදනාස්කන්ධය කියන්නේ ඒ ශබ්ද රූපයට ඇලීලා හෝ ගැටිලයි. සංඥාස්කන්ධය කියන්නේ ශබ්ද රූපයක් වශයෙන් හඳුනා ගැනීමයි. සංඛාරස්කන්ධය යනු අසමින් සිටීම. ඒ ඇසීමක්, සිවීමක්. ක්‍රියාත්මක භාවයක් පමණි. විඤ්ඤානස්කන්ධය සෝත විඤ්ඤානයයි. මෙතන ක්‍රියාවක් ඇත. කරන්නෙක් නැත. මේ ධර්මතාවය විනිවිද දැකීමෙන් සක්කාය දිට්ඨිය නැතිවීමට උපකාරී වේ.

පූජ්‍ය පණ්ඩිත ගම්පහ සිරි සීවලී හිමි.


රාධා..
සිත්‍රා දේවිය
..නෝ.. සිත්‍රතුමා වහාම එතුමාව මෙහි ..කැඳවන්න...
සිත්‍රා දේවිය සිත්‍රතුමාව කැඳවා මෙ.. ප්‍රවෘත්ති බහුව සැළු කර සිටියේය
මොනවා.. මෙක මහ බැරෑරුම් ප්‍රශ්ණයක්.. මා.. මේ ගැන.. කුමක් කරන්නද.. සිත්‍රා දේවිය
ඇසුරෙන්
භද්‍රා
කුණ්ඩලකේශී
8
සැකසුම
චිත්‍ර
අප මෙයට කුමක් හෝ කළ යුතුයි.. ස්වාමිනි.... දියණිය හරිම මුරණ්ඩුයි..
ඇය එක හෙලාම.. කියා සිටිනවා සත්තකව.... නොලද හොත්.. මියයන බව
අනේ ඇය එතරම්
භද්‍රා.. මේ අහන්න ..දුව.. සත්තක.. වෛරයෙක් අපි කොහොමද
ඔබට ඔහුව විවාහ කර දෙන්නෙ
අපට රාජ දඩුවම් ..විඳින්ට සිදුවේවි.
එය එසේනම්.. මා.... මෙහිම මියයමි.. පියාණෙනි මා මෙතනින් නොනැගිටිමි..
දියණියෙනි.. මාව.. කෝප නොගන්වනු.. මා කියන දේ අසනු..
බැහැ.. බැහැ.. මට.. මැරෙන්න.. ඉඩ දෙන්න සත්තකව නොලැබුණොත් මා මිය යනවා.. මිය යනවාමයි...
නමුත්.. ඔය හැරුණේ.. නමුද විනාශවී.. අප සියලු දෙනා ද.. විනාශ කරන්වයි.. මේ.. බැඳී සැලුවුවහොත් අප සියලු දෙනා හිස ගසා මරා දමනු.... ඇත... දන්නවා නේද රජතුමාගෙ හැටි.

සුරස අතිරේකය




# සෙත් කවි බිහි කළ කවිවරයාණෙනි.....

දුලානි චම්පිකා ආරියසිංහගේ ප්‍රථම ගීතය වන මෙය ලාල් ආනන්ද අබේධීරයන්ගේ සංගීතයෙන් හා තනුවෙන් ද, ඇනස්ලි නානායක්කාරගේ හඬින් ද ඔපවත්ව නිර්මාණය වූයේ 'රංගිරි රන්සර' සංයුක්ත තැටිය උදෙසා ය. ආධුනික ගීත නිර්මාණකරුවන් කලඑළි බසින්නට අතිපූජ්‍ය ඉනාමළුවේ ශ්‍රී සුමංගල ස්වාමීන්වහන්සේ ලාල් ආනන්ද අබේධීරයන් ඇතුළු රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය විසින් ගත් අපරිමිත උත්සාහය සාර්ථකව ඇති අයුරු මෙවන් ගී නිර්මාණ අසන විට අපට පසක් වේ.

මෙහිදී විශේෂයෙන් කිව යුතු දෙයක් තිබේ. එනම් දුලානි චම්පිකා ආරියසිංහ යනු දෙනෙතින් ලොව දකින්නට වරම් අහිමි වූ කලාකාරිණියක් වීමයි. පාසල් අධ්‍යාපනයක් ලබා නොමැති ඇයගේ තම දැනුම් මුවහත් කර ගත්තේ සමාජයේ ජීවත් වීම තුළින් ලත් අත්දැකීම් මඟිනි.

*ඔරු කඳ පෙරලුණු සසර සාගරේ හබල ඔබයි නිදුකාරණේ!*
*තණ්හා ආශා අඳුරු මාරුතේ දිනිඳු ඔබයි නිදුකාරණේ!*
*කරදර දර මිටි කර පින්නාගෙන දිවි මඟ යන කළ දුක පිරුණ*
*සරතැස නිවමින් භව නෙත සනසයි බුදු ගුණ උල්පත සුව විමන*

*ඔරු කඳ පෙරලුණු සසර සාගරේ.....*

*වල්මත් නොම වී දිවි මඟ සැරුමට දෑස හරින නැණ මිණි පහන*
*සෙත් කවි බිහි කල කවිවරයාණෙනි සාදු ලොවේ සැම හිස නමන*

*ගේය පද - දුලානි චම්පිකා ආරියසිංහ*
*සංගීතය හා තනුව - ලාල් ආනන්ද අබේධීර*
*ගායනය - ඇනස්ලි නානායක්කාර*

සංසාරය යනු ඉමක් කොණක් නොපෙනෙන මහා සයුරකි. නිමක් නැති සංසාරය නම් සයුර තරණය කරන්නට අප බලාපොරොත්තු දල්ලා සිටිමු. එහෙත් එය කවදා නම් තරණය කළ හැකි වේද? සසර සයුරේ යාත්‍රා කරන්නෙකුට උවදුරු අපමණය. සැඩ සුළං, කුණාටු, මහා දිය රැළි කොයි මොහොතේ කඩා වැටේදැයි නිරන්තරයෙන් සැකයෙන් සිටින්නට අපට සිදුවේ. ඉපදීම, මරණය රෝදුක්, ප්‍රිය විප්‍රයෝගය, අප්‍රිය සම්ප්‍රයෝගය ආදී වූ සුළි සුළං හමමින් අපේ ජීවන යාත්‍රාවට බාධා පමුණුවයි. මැරෙමින් යළි උපදිමින් අසීරුවෙන් සසර සයුර තරණය කරන්නට අපි උත්සාහ ගනිමු.

නිමක් නොමැති සසර සයුර තරණය කරන්නට, වල්මත්ව සිටින අපට මඟ පෙන්වන්නාවූ එකම මාර්ගෝපදේශකයා බුදුරජාණන් වහන්සේය. උන්වහන්සේ සසර සයුරේ වල්මත්ව අසීමිත දුක්ඛ දෝමනස්සයන්ට මුහුණ දෙමින් වේදනා විඳින සියලු සත්ත්වයන් වෙනුවෙන් දහම් අලෝකය පතුරුවාලූ සේක. බුදු දහමින් නුවණැස ලබා සසර සයුර තරණය කළෝ අපමණය. එහෙත් සසර සයුරෙහි ගිලෙමින් දුක් පීඩා විඳින්නට ගණන් නිවන් ලැබූවන්ට වඩා සිය දහස් ගුණයකින් වැඩිය. නුවණැස සදන බුදු බණ ඇසෙත්දීත් ඒ සියල්ල පසෙකලා මොහඳුරෙහිම ගිලෙමින් අප සංසාරය තවත් දිගු කරගන්නෙමු.
දුලානි චම්පිකා ආරියසිංහ තම ගේය නිර්මාණයේ අරමුණ වූ බුදු ගුණ වැයුම සාක්ෂාත් කරගන්නේ උපමා රූපක බහුල සුගේය බස් වහරකිනි.

ඇය අසීමිත වූ සසර සයුරකට උපමා කරන්නීය. මේ සයුර තරණය කරන්නට අප සතු එකම සම්පත කුමක්ද? සුපිරි නෞකාවක්ද? නො එසේ නම් අවම වශයෙන් රුවල් නෞකාවක්ද? එහෙත් අප ෂතුව ඇත්තේ කිසිදු සැප පහසුකමක් නැති ලී ඔරුවකි. මේ 'ලී ඔරුව' වචනයේ සංකේතාර්ථය කුමක්ද? එහ මිනිසා සතුව ඇති යහපත අයහපත වෙන්කර හඳුනාගත හැකි තාර්කි ඥානයෙන් හෙබි මනසකි. දුලානි චම්පිකා පවසන්නේ සංසාරය තරණය කරන්නට උපකාරී වන 'ඔරුව' නැමැති 'මනස' ද නොපිට පෙරලී



ඇති බවකි. මෝහයෙන් අන්ධ වූ මනසකට යථාර්ථය නොපෙනෙයි.

ඔරුකඳ පෙරළුණු කළ එයට සවියක් උපකාරයක් වන්නේ හබලයි. මෝහයෙන් අන්ධ වූ මිනිදුනට සසර සයුර තරණය කරන්නට හබලක් ලෙසින් උපකාරයට පැමිණෙන්නේ තිලෝගුරු බුදු රජාණන් වහන්සේය. බුදු දහම නිවැරදිව අවබෝධ කර ගත්තෙකුට 'ඔරුව' නම් වූ මනස නිවැරදි ලෙස සකලා ගෙන, බුදු දහමේ මාර්ගෝලදේශ සහිතව නිවන නම් වූ පාරාදීසයට ලඟා විය හැකියි. එලෙස යන ගමනේ තණ්හා ආශා නම් අඳුරුමාරුතයේ අතරමංවූ විට ආලෝකය විහිදුවා නිසි මඟ පෙන්වන හිරුද බුදුරජාණන් වහන්සේමය.

සංසාරය තරණය කරන්නට සැහැල්ලු සිතින් සැහැල්ලු ගතින් ගමන් කළ හැකි වුවද අපි සැහැල්ලුවෙන් ගමන් නොකරන්නෙමු. සසර තරණය කරන්නට අප සතු එකම සම්පත දුබල ලී ඔරුවකි. එය ද සැහැල්ලුවෙන් තබා ගැනීම පසෙකලා අපි දරමිටි ද එහි ගොඩගසා ගන්නෙමු.

ගේය පද රචිකාවිය පවසන්නේ විසරී ඇති කරදර සියල්ල දරමිටියක් ලෙස එක්කොට බැද ගෙන යන බවය. කියන පරිදිම අප අපේ දුක් දොම්නස් ද අනෙක් අයගේ දුක් දොම්නස්ද සියල්ල උවමනාවෙන්ම කරමත තබා ගෙන යනවා නොවේද? මේ 'කරදර දරමිටි' තෘස්ණාවයි. තෘස්ණාව නිසා පහසුවෙන් සැහැල්ලුවෙන් යා හැකි ගමනට අප විසින්ම බාධක පමුණුවා ගන්නෙමු. එය අනුවනකාරී පෘතග්ජනයන්ගේ ස්වභාවයයි. මේ වෙහෙසකාරී ගමනේදෘ වෙහෙස නිවන, දිය උල්පත් වන්නේ බුදු දහමයි. බුදු දහමෙන් සිත නිවා සනනා ගන්නා ඇතැමුන් තෘස්ණාව නම් දරමිටි වලින් එකක් දෙකක් හෝ ඉවත දමා සසර ගමන සැහැල්ලු කර ගනිති.
ගේය පද රචිකාවිය අවසන පවසන්නේ බුදුරජාණන් වහන්සේ යනු ලොවට සෙත් ශාන්තිය සදාලන්නාවූ සෙත් කවි බිහිකල කවිවරයාණන් බවයි. බුදු මුවෙන් වදාළ ගී සද්ධර්මය සෙත් කවියක් වී මේ විශ්වයේ සැම සියලු සත්ත්වයන්ගේම සිත නිවාලන්නට සමත්විය.
උපමා රූපක බහුලව යොදා ගනිමින් දුලානි චම්පිකා බුදුගුණ වැයුමට ගත් වෑයම සාර්ථක වී ඇති බව ගීතය විමසන්නෙකුට පෙනේ. ඈ සතු ප්‍රතිභා පූර්ණ ලක්ෂණ ගීතය තුළින් ඉස්මතු වේ.

ලාල් ආනන්ද අබේධීරයන්ගේ සුමධුරවූ සංගීතය හා තනුවත් ඇනස්ලි නානායක්කාරගේ සුගායනීය හඬත් අවියෝජනීයව බැඳී මේ ගීතය අප හදවත් සනසාලයි. සිතට ශාන්තියක් ඇති කරලයි.

චාමිකා ජනානිද සිල්වා

# බුදුන් උපන් දේශයේ සිට

## ශ්‍රී ලංකාවේ බුදු දහම පිහිටුවීමට මූලික වූ සාංචි පුදබිම



ඉන්දියාවේ සාංචි පුදබිම පිහිටා තිබෙන්නේ මධ්‍ය ප්‍රදේශයේ බොපාල් අගනගරයේයි. එම පුණ්‍ය භූමිය බෞද්ධ අපට ආගමික හා සංස්කෘතික වශයෙන් වැදගත් ස්ථානයක් ලෙස හැඳින්විය හැක. අග්‍රශ්‍රාවක ධාතූන් වහන්සේ දෙනම චේතියගිරි විහාරයේ වැඩ සිටීම හා එහි ඇති සංස්කෘත වටිනාකම ඉන් පිළිඹිඹු වේ.

මදුරාසියේ සිට කි.මී.1486ක් පමණ ගිය විට බොපාල් ප්‍රධාන නගරය හමුවේ. එහි සිට කි.මී. 45ක් පමණ දුරින් සාංචි පුදබිම පිහිටා තිබේ. බෝපාල් නුවරට ළඟා වීමට සීඝ්‍රගාමී දුම්රියෙන් ගමන් කිරීම වඩාත් පහසුය. අන්ඩමාර් හෝ දාදර් දුම්රියෙන් ගමන් කළහොත් සාංචි දුම්රිය ස්ථානයෙන්ම බැසිය හැක. සාංචි පුදබිම වැඳපුදා ගැනීමට එන ශ්‍රී ලාංකික බෞද්ධ ජනතාවට ශ්‍රී ලංකා මහබෝධි ධර්ම ශාලාවේ නවාතැන් පහසුකම් ලබා ගැනීමට කටයුතු සලසා ඇත.

ලෝක උරුමයක් වූ සාංචි පුදබිම වර්තමානයේ ශ්‍රී ලංකා මහබෝධි සංගමය විසින් පාලනය කෙරේ. චේතියගිරි විහාරස්ථානයේ විහාරාධිපති ලෙස බානගල උපතිස්ස ස්වාමීන් වහන්සේ වැඩ වෙසෙති. ආගමික හා සංස්කෘතික වශයෙන් වැදගත් වන සාංචි පුදබිම ඉන්දියාවේ පුරා විද්‍යා දෙපාර්තමේන්තුව මඟින් ආරක්ෂාව හා නඩත්තු කටයුතු වෙනුවෙන් මහත් කැපවීමක් සිදුකරයි. බුද්ධ කාලයේ පැවති සොලොස් මහජනපද අතරින් අවන්ති දේශය ලෙස හඳුන්වා ඇත්තේ මධ්‍ය දේශයයි. එසමයෙහි මෙහි ධර්ම ප්‍රචාර කටයුතු වල මූලිකත්වය ගෙන කටයුතු කොට ඇත්තේ මහා කච්චායන මහ රහතන්වහන්සේය. මෙහි ප්‍රධාන දායකයා වී ඇත්තේ වේදිස සිටුවරයාය. යුවරජ ලෙෂ අවන්ති දේශයට පැමිණි අශෝක රජතුමා වේදිස සිටුවරයාගේ දියණිය වූ දේවි විවාහ කරගෙන උඩිජේන් ප්‍රදේශයේ පාලනය ගෙන ගොස් ඇත. බින්දුසාර රජතුමාගේ අභාවයෙන් පසු, අශෝක රජතුමා සාංචි ස්ථූපයත්, සංඝාවාසයත් මෙම පුදබිමෙහි ගොඩ නැංවීමට කටයුතු කළේය.

ශ්‍රී ලංකාවේ බුදු දහම පිහිටුවීමට විශාල දායකත්වයක් කළ මිහිදු හිමි සහ සංඝමිත්තා තෙරණිය ඉපිද ඇත්තේ ද මධ්‍ය ප්‍රදේශයේ බව ඉතිහාසය සඳහන් කරයි. වේදිසා දේවිය වෛශ්‍ය කුලයේ කාන්තාවක් හෙයින් අශෝක රජතුමා බුදුදහම ගැන බොහෝ කරුණු ඉගෙන ගත්තේ ද දේවියගෙන් බව ශිලා ලිපි වල සඳහන් වේ.

මෙහිදී අශෝක අධිරාජ්‍යයා වසර ගණනාවක් යුද්ධ කිරීමෙන් පසු ධර්මාශෝක ලෙස අගතැන්පත් වීමෙන් පසු සාංචි පුදබිමට විශේෂ අවධානයක් යොමු කරමින් එහි පුනර්ජීවය සඳහා කටයුතු කිරීම වැදගත්ය. ක්‍රි.පූ. පළමුවෙනි ශතවර්ෂයේ දී ලෝක උරුමක් බවට පත්වූ පසු සාංචි තොරණ නිර්මාණය විය. ඉන්පසු එලැඹෙන ගප්ත රජසමයේ සාංචි තොරණ අසල ප්‍රතිමා සතරක් මහා විහාරය අසල විහාරගෙය හා ගරාදි වැටවල් ඉදිකොට ඇත. ශතවර්ෂ 14-19 අතර කාලවකවානුවේදී සාංචියට එල්ලවුණු සතුරු ආක්‍රමණ ආදිය නිසා පුදබිම කාලයාගේ අවෑමෙන් කැලයෙන් වැසී ගොස් ඇත.

1818 දී බ්‍රිතාන්‍ය ජාතික ජනරාල් ටෙල් මහතාගේ සංචාරයෙන් පසු, සාංචි පුදබිම පුනරුත්ථාපනය කිරීමට කටයුතු සලසා ඇත. 1815 දී පැමිණි බ්‍රිතාන්‍ය ජාතික කනින්පෑම් පුරාවිද්‍යාඥයා විසින් ද මෙහි පුනරුත්ථාපන කටයුතු සිදු කොට ඇත. වර්ෂ 1816 දී ඉන්දියාවේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් පසුව නැවත සාංචි පුදබිම සංරක්ෂණය කරන ලදී.

ශ්‍රී ලංකාවේ බුදු දහම පිහිටුවීමට පදනම දැමූ සාංචි පුදබිම ශ්‍රී ලාංකික බෞද්ධයනට ඉතා වැදගත් වේ. තුන්වන ධර්ම සංගායනාව පවත්වා රටවල් නවයකට ධර්ම ප්‍රචාරය කරන ලදී. එහිදී ශ්‍රී ලංකාවට බුදු දහම වැඩම කිරීම, මිහිඳු නාහිමියන්ගේ මූලිකත්වයෙන් සිදුවිය. ශ්‍රී ලංකාවේ බුදු දහම පිහිටුවීමට විශේෂ දායකත්වයක් සිදු කළ මිහිඳු මහ රහතන් වහන්සේ හා සංඝමිත්තා තෙරණිය ද අවන්ති දේශයේ සිට එම කාර්යයට පැමිණි බව ඉතිහාසයේ සඳහන් වේ.

චවින්ද්‍රා වෛද්‍යරත්න

# නිවන් දැක්ම සඳහා සිව්වනක් පිරිස කළ යුතු බුද්ධ චරියාව



'පඤ්ඤා කාමෙන යහපති අරිය සාවකෙන පඤ්ඤා සංවත්තතිකා පටිපදා පටිපජ්ජී තබබා....
චත්තාරො මෙ භික්ඛවේ ධම්මා භාවිතා බහුලී කතා කථමේ චත්‍තාරෝ''
01. සප්පුරිස සංසේවෝ
02. සද්ධම්ම සංණනං
03.යෝනිසෝ මනසිකාරො
04.ධම්මානු ධම්ම පටිපන්නො

ඉමේ බො චත්‍තාරො ධම්මා භාවිතා බහුලී කතා මහා පඤ්ඤාය සංවත්‍තතීති....

අන්‍යතීර්ථක - අන්‍ය ආගමික පරිබ්‍රාජක ශ්‍රමණ-බ්‍රාහ්මණයන් ඉදින් භික්ෂුවකගෙන් කුමක් සඳහා මහා ශ්‍රමණයන් වහන්සේ වෙත පැවිදි වූයේද? බුද්ධ චීවරය දරා ගත්තේ ද? කියා ඇසූවිට දුර්මුඛ නොවන්න. නොපැකිලව නිර්භීතව සිංහ පැටව්මෙන් බුද්ධ පුත්‍රයන් පැහැදිලි නිරවුල් පිළිතුරක් දීමට හැකි විය යුතුය. ඒ සඳහා මහා පඤ්ඤ සූත්‍රයෙන් මාර්ගඋපදේශ තත්ත්ය ලබාදී ඇත.
පළමුව 'සප්පුරිස සංසේවයය' ධර්මය දූනගත් දූකගත් සප්පුරිසයෙක්ම කෙසේ හෝ මුණ ගැසිය යුතුයි. මිහිපිට පහළ වූ අති ශ්‍රේෂ්ඨ සත්පුරිසයන් වහන්සේගේ ධර්මය අද නිර්මලව පවතී. බුදු පියාණන් වහන්සේගේ කාය දෙකකි. ධර්ම කාය හා පූති කාය වේ.

මෙයින් ධර්ම කාය ජීවමානයි. ඒ ධර්මය අපර මාර්ගඋපදේශකත්වය ලබා දෙයි.

'මයා ධමෙමාච විනයෝච දෙසිතො පඤ්ඤත්තො - සො මමච්චයේන වෝ සත්ථා'

මා ධර්මය දේශනා කරලා තියෙනවා. විනය පනවා තියෙනවා. මගේ ඇවෑමෙන් ඒ ධර්මය, විනය ඔබට මාර්ග උපදේශකත්වය දෙනු ඇත.'

මේ බුදු වදනට අනුව ධර්මය ජීවමානව ඇත. ඒ ජීවමාන ධර්මය ඇත්තේ ධර්මය දූන ගත්තාවූ ආර්යයන් වහන්සේ ළඟය. එනම් සෝවාන්, සකෘදාගාමී-අනාගාමී-අරහත් උත්තමයන් ළඟය. ඒ ආර්ය උත්තමයෝ මාර්ගය වඩා ඵල ලාභීත්වය ඇති කරගත් උත්තමයෝය.

දෙවැනි කාර්ණය වූ ධර්මය ඇසීමට ඒ ආර්ය උත්තමයෙක් මුණ ගැසිය යුතුයි. මොකද? හේතුව, ආර්ය ඵලයකට පත් නොවූ පෘතජ්ජන (පුහුදුන්) අයට ආර්ය මාර්ගය කියා දීමට කෙසේ වත් බැරිය.

මෙහිදී සෝවාන් මාර්ගස්ථයෙක්වත් 'සත්පුරුෂ' සංඛ්‍යාවට අයත් වන්නේ නැත. ඔහු මාර්ගස්ථයෙක් පමණි. මාර්ගස්ථයෙක් ගේන ඵල ලාභීත්වය සඳහා ම කමටහන් (මාර්ග උපදේශකත්වය) ලබා ගත නොහැක.

තෙවන කරුණ එනම් යෝනි සෝ මනසිකාරයයි. දහම හොඳින් අසන්න - සිත්හි දරාගන්න, කියූ පලියට නොපිලිගන්න, සිතන්න-විමසන්න. තමා තුළින් දූනුවත් වන්න. යම් ධර්මයක් යෝනිසෝ මනසිකාරයෙන් අසා - දරා - සිතා - විමසා - බලා තමා තුළින් දූනුවත් වීමේදී රාගය නැතිවී තුනී වී යයි නම් (රාග ක්ඛයෝ නිබ්බාණනං) ද්වේශය නැති වී තුනී වී යයි නම් (රාග ක්ඛයෝ නිබ්බාණනං) මෝහය නැතිවී තුනී වී යයි නම් (රාග ක්ඛයෝ නිබ්බාණනං) ඒ දේශනාව බුද්ධානුමත 'ශ්‍රී සද්ධර්මයම' බව දූනගන්න.

ඒ ආර්ය උත්තමයො තමන් ආර්ය මාර්ගයේ ගමන් කර ඵල ලාභීත්වය ඇති කර ගෙන මහා මෛත්‍රියෙන් මහා කරුණාවෙන් සසරෙහි සැරි සරන අසරණ සත්ත්වයන් සසර දුකින් මුදවා ගැනීම සඳහාම ධර්මය දේශනා කරන සේක. ධර්ම උපදේශකත්වය දෙන සේක.

සසර මහා දුකක්!......

ඒ දුකට මේ සත්ව ප්‍රජාවම පත්ව ඇති බව දූනගත් ඒ ආර්ය උත්තමයෝ මහා කරුණාවෙන් ධර්මය දේශනා කරති. තුන් ලෝකයේ කොතනවත් සැපක් කියා දෙයක් නොදනකින මේ උත්තයෝ ලෝකයෙන් එතරව ලබන නිත්‍ය සුන්දර පරම මංගල නිර්වාණා සම්පත්තියම තම දායකයන්ට ලබා දීමට මහා මෛත්‍රියෙන් ධර්ම දේශනා කරති.

උන්වහන්සේලා ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා කිසිවිටෙකත් බලාපොරොත්තු වන්නේ නැත. ලාභ - සත්කාර, භවභෝග, මිල - මුදල්, කීර්ති - ප්‍රසංසා බලාපොරොත්තුවෙන් ආර්ය උත්තමයන් ධර්මය විකුණා කෑමට කටයුතු කරන්නේම නැත. ඒ සඳහා සූදානම් ද නැත.

මහණෙනි, ලාභ සත්කාර භික්ෂුවට 'හෙණගෙඩි' වේ. (අසනි විචක්ඛනති භික්ඛවේ ලාභ සත්කාර සිලොකස්සේතං අධිවචනං)

මේ බුද්ධාවවාදය දූනගත් බුද්ධිමත් බුද්ධ පුත්‍රයෝ තම බුද්ධ රාජකාරිය මැනවින් සකල ලෝවැසි සත්ත්වයාගේ හිත සුව පිණිසම සිදු කරති. බුදු දරුවෝ 'සබ්බ දුක්ඛ නිස්සරණ නිබ්බාණ සච්ජී කරනත්ථාය....' යන පාඨය සිහිකරමින් බුද්ධ චීවරය ශබ්රය මත දරාගෙන තමන් කළ යුතු 'බුදු කිස' ගැන නැවත නැවතත් මෙනෙහි කරමින් (ප්‍රත්‍යවේක්ෂා කරමින්) තමන් ද ආර්ය ලාභිත්වය ලබාගෙන ඒ ආර්ය ඵල (සෝවාන් - සකෘදාගාමී ආදී) තම ශ්‍රාවකයන්ට ලබාදීම සඳහා අර්ථයෙන් - ධර්මයෙන් අනුශාසනා කරති.

පූජ්‍ය පණ්ඩිත ගම්පහ සිරි සීවලී හිමි

# කර්ම බලවේගය හා ප්‍රතිසන්ධි විපාකය



පළමුව අප වටහා ගත යුත්තේ කර්ම බලවේගය යනු කුමක්ද? යන්න පිළිබඳවයි. ඇත්තෙන්ම සාමාන්‍ය ජීවිතයේදී කර්මය යනු ක්‍රියාවයි. භාෂාවක් හරහා වාක්‍යයක් නිර්මාණය කිරීමේදී ද කර්තෘ, කර්ම ක්‍රියා යනුවෙන් දක්වා තිබීමෙන්ද කර්මයක් පිළිබඳව සඳහන් වේ. එහිදී තේරුම් ගත යුත්තේ කර්තෘ විසින් කරනු ලබන ක්‍රියාවට යටත් වන්නේ කර්මය බවයි. මෙම කර්ම බලවේගය අචින්ත්‍යය වූවක් බැවින් සරල භාවය හරහා එහි ගැඹුරට යා යුතුව ඇත.

පාලි භාෂාවේ කම්ම ලෙස ද සංස්කෘත භාෂාවේ කර්ම ලෙස ද මෙම පදය විග්‍රහ වී ඇත. එය කර (කිරීමේ) ධාතුවෙන් සැදුම් ලත් පදයකි. අප බොහෝ දුරට ක්‍රියාව වශයෙන් හඳුන්වන්නේ කයෙන් පමණක් වන දේවල් හරහාය. එය සාමාන්‍ය අවබෝධයක් තුළ පවතින වැටහීමකි. මෙම අදහසට ප්‍රතිවිරුද්ධ කරුණු තහවුරු කෙරෙන තැනක් ලෙස සුත්ත නිපාතයේ ""වාසෙට්ට සූත්‍රය" පෙන්වා දිය හැකිය. එහිදී ජාති ප්‍රශ්නය සාකච්ඡා කෙරෙන තැන් වලදී පුද්ගලයා විසින් කරනු ලබන කාර්යයන්ට (කර්මයට) අනුරූපව නම් ගොත් භාවිතා කර ඇත. කස්සක, සිප්පික, වාණිජ යන නම් භාවිතය ද බ්‍රහ්මණ, වාසල ආදියෙහි ආරම්භය උපත්තියෙන් සිදුවන ආකාරය ද යන මත කණ්ඩනය කිරීමට සූත්‍ර භාවිතය වැදගත් වී ඇත.

මෙවැනි සරල ක්‍රමයකට හිතන, පතන පුහුදුන් වැසියාට කර්ම බලවේගය පිළිබඳව අවබෝධ කර දීම පහසු කාර්යක් නොවන බව අපි දනිමු. එසේ වුවද අපට හැගෙන දැනෙන අයුරින් බුදු රජාණන් වහන්සේ කර්ම බලවේගය පසක්කර දුන් ආකාරය පිළිබඳව අප විමසා බලමු.ඇත්තෙන්ම බුදු දහම තුළ කර්මය යනු ඉහතින් සඳහන් කළ සාමාන්‍ය, සරල අර්ථයක් දෙන ඉගැන්වීමක් නොවේ. එය ඉතා ගැඹුරු වූත්, සංකීර්ණ වූත් ඉගැන්වීමකි. ප්‍රඥාවෙන්ම නොදැක මසැසින්ම බැලීමෙන් එය ගෝචර නොවන්නකි.

මෙහිදී අපට හොඳම පාඨයක් ලෙස අ.නි සත්තක නිපාතයේ නිබ්බිදික සූත්‍රයේ හැඳින්වෙන පාඨය දැක්වීමට පුළුවන. එනම් "චේතනාහං භික්ඛවෙ කම්මං වදාමි චේතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා වා" (මහණෙනි, මම චේතනාව කර්මය යයි කියමි. සිතින් සිතා කයින් හෝ වචනයෙන්, හෝ සිතින් හෝ කර්ම සිදු කරයි.)

මෙහි කර්මය යනු සචේතනික ක්‍රියාවකි. ලෝභය, ද්වේශය, මෝහය, ඊර්ෂ්‍යාව, මසුරුකම ආදී අකුසල චේතනාවේ. ඒවා මුල් කර ගෙන කළ ක්‍රියා අකුසල කර්ම බවට පත්වේ. අලෝභ, අදෝස, අමෝහ ආදිය කුසල චේතනාය. ඒවා මුල් කර ගෙන සිදු කළ ක්‍රියා අකුසල කර්ම බවට පත්වේ. තවත් පැහැදිළි කලොත් කර්මය යනු චේතනා චෛතසිකයි. කායික, වාචසික හා මානසික සියළු කාර්යයන්හිදී චේතනාව මුල් වු පමණට ඒවා වගකීම් සහිත කාර්යන් බවට පත්වේ.

මෙහිදී අප නොදැනුවත්ම සිදුවන දේවල් කර්මයක් හැටියට නොගැනේ. සිත, කය, වචනය මුල් වී දෛනික සිදුවන එවැනි දේවල් බොහෝ ඇත. එවැනි නොදැනුවත්ම සිදුවන ක්‍රියා අචෛතනික යනුවෙන් හඳුන්වා ඇත. ඒවා කුසල හෝ අකුසල ක්‍රියා ගණයට නොවැටේ. තෙල්, මල්, පහන් රැගෙන විහාරයට යන පින්වතෙකුගේ පයට පෑගී මිය යන කුරා කුහුඹුවන් සංඛ්‍යාව ඉතා විශාලය. එසේ වුවද එම පින්වතාගේ අරමුණ (චේතනාව) සතුන් මැරීම නොව, හොඳ පින්කමක් කිරීමේ චේතනාව ඇති බැවින් අකුසලයක් සිදු නොවේ.

එසේම යම් කිසි වෛද්‍යවරයෙක් ලෙඩෙකු බේරා ගන්නා අදහසින් සැත්කමක් කරන කල එම රෝගියා මිය ගියහොත් එය අකුසලයක් ද නොවේ. එයට හේතුව සැත්කම කරන ලද්දේ රෝගියා මරා දැමීමේ අදහසින් නොවන බැවිනි. ඒ අනුව ජෛන ආදී වෙනත් සමයන්තරයන්ට වඩා බුදු දහම වෙනස් වන්නේ ද අන්තද්වයට නොවැටී මධ්‍යම ප්‍රතිපදාවේ සිටින බැවිනි. නිඝණ්ඨනාථ පුත්ත වැනි ශාස්තෘවරුන්ගේ ඉගැන්වීම් දෙස බලන කල්හි ද බුදු දහම කර්ම නියාය පිළිබඳව දේශනාකර ඇත්තේ කාටත් පිළිගත හැකි සර්ව සාධාරණ ඉගැන්වීමක් තුළ ඉඳගෙන බව ප්‍රකට වේ.

කර්මයේදී ඉතා වැදගත් වන්නේ චේතනාව බව හැම විග්‍රහයකදීම පැහැදිළි වන්නකි. ඒ අනුව විමසා බැලීමේදී පුංචි කතාවක් උදාහරණයක් ලෙස පෙන්වා දීමට පුළුවන. සැවැත්නුවර විසූ එක්තරා දඩයක්කරුවකු ගේ බිරිඳ සෝවාන් වු බිරිඳක් විය. නමුත් ඇය දිනපතා තම ස්වාමියාට දඩයම් කිරීම සඳහා යාමට අවශ්‍ය ආම්පන්න සූදානම් කර දීම සිදු කරනු ඇත. මෙම කාරණය සම්බන්ධයෙන් භික්ෂුන් වහන්සේලා තුළ මෙය ප්‍රාණඝාතයක් නොවන්නේ ද යන සැකය පහල විය. එම කරුණ බුදුරජාණන් වහන්සේට සැලකිරීමෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කලේ අත්ලේ තුවාලයක් නැත්නම් කවර විසක් අතින් ගත්තත් සිරුරට නොවදින බවයි. එලෙසම අකුසල චේතනාවක් නැත්නම් ක්‍රියාවක් අකුසලයක් නොවන බවද දේශනා කළහ.

කර්මය නොදැනුවත්ම සිදු වීමෙන් කුසලයක් හෝ අකුසලයක් සිදු නොවන බව ඉහත කතා පුවතින් පැහැදිළි වේ. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා උදෙසා පනවන ලද භික්ෂු විනයේදී ඉතා බරපතල වැරදි ලෙස ගැනෙන පාරාජික ආපත්ති පවා සිදු වීමෙන් සමහර පිරිස් වෙතට ඇවැතක් සිදු නොවන බව දේශනා කළහ. ඒ අතර සමාජයේ කොටස් කළ පිරිස් අතර

උම්මත්ත (උමතු)
වික්ඛිත්ත චිත්ත (සිහි විකල්)
වේදනට්ඨ (වේදනාවෙන් පීඩිත) ආදී පිරිස් ඒ අතර වැදගත් වේ.

කර්ම න්‍යාය පිළිබඳව බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත්තේ අචින්ත්‍ය දෙයක් වශයෙනි. එයට හේතුව එය සිතා අවසන් කළ නොහැකි තරමට ගැඹුරුය. සාමාන්‍ය පුහුදුන් වැසියාගේ ප්‍රඥාවට ගෝචර නොවන තරමට ගැඹුරු දර්ශනයක් ලෙස බුදු දහම කර්ම විෂය පෙන්වා දී ඇත.

සමහරු කර්ම න්‍යාය පිළිබඳව සුළුවෙන් සිතීමට චින්තනයක් ගොඩනැගී තිබීම කණගාටුවට හේතුවකි. එයට හේතුව මුළු බුදු දහමම ආවරණය කර ඇත්තේ කර්ම බලවේගය විසින් කීවොත් නිවැරදිය. කර්ම න්‍යායන් බුදු දහමේ උගන්වා නොතිබුනා නම් මීට වඩා පාප ක්‍රියා වැඩි වී පුද්ගල සන්තානය අගාධයට යෑමට ඉඩ තිබුණි. මෙහි විපාකය පිළිබඳ සමහරුන් තුළ අඩු තක්සේරුවක් හා එය නොවේය යන මිථ්‍යා දෘෂ්ඨික අදහස් ද ඇත. එයට කිව යුත්තේ මෙම උදාහරණයයි. මිලිදු රජු සැරියුත් හිමිගෙන් කර්මය කොහි ඇද්ද යනුවෙන් ප්‍රශ්න කළ කල්හි, සැරියුත් හිමි එය කීමට අපහසු බවත් උපමාවකින් දක්වන්නේ නම් එල හට නොගත් ගස්වල එල එහෙ මෙහෙ ඇද්ද කීමට අපහසු වන්නාක් ආදී වශයෙනි.

මගේ අදහසක් අනුව එය පැහැදිළි කලොත් යම් කිසි කෙනෙක් තම අතේ ෆෝන් එකකින් තවත් කෙනෙකුට එස්.එම්. එස් එකක් යැවීමටත්. එම අවස්ථාවේ ෆෝන් එක වසා තැබීමක් හෝ සිග්නල් නොමැතිව එස්. එම්. එස් එක නොලැබුනොත් සුළු වෙලාවකින් ඒවා සම්පූර්ණ වන විට එස්. එම්. එස් ලැබෙනු ඇත. එලෙසම කර්මයේ විපාකද ලැබීම ප්‍රමාද වූවා කියා එයට අඩු තක්සේරුවක් හෝ එය සුළුවෙන් සැලකීම නුසුදුසුය.

ඒ අනුව කර්මය ප්‍රතිසන්ධි වශයෙන් විපාක දෙන ක්‍රම හතරක් පිළිබඳව බුදු හිමි පෙන්වා වදාළහ. එනම් ජනක කර්ම වශයෙන් දුගතියට ප්‍රතිසන්ධි ලබා දී එයට අනුව විපාක ලබාදීම.

උපතම්භක කර්ම වශයෙන් ඒවාට ප්‍රතිසන්ධි විපාක දීමට ශක්තියක් නැතත් වෙනත් ජනක කර්මයක් එකතු වී විපාකය දීමට හැකියාවක් ඇත. එය මේ ආත්මයේදී කළ හෝ පෙර ආත්ම භවයකදී කළ හෝ එකක් වීමට ද පුළුවන.

උපපීඩිත කර්ම වශයෙන් ජනක කර්මයෙන් ලැබෙන විපාක එක දිගට විදීමට ඉඩ නොදී ඊට බාධා පමුණු වීම මෙහි ස්වභාවයයි. එයට ද අතීත වර්තමාන දෙකොටසෙහිම කර්ම බලපානු ඇත.

උපඝාතක කර්ම වශයෙන් දුර්වල වු ජනක කර්මයේ ශක්තිය සහමුලින්ම නසා දමා විපාක දීමයි. ඒවාද අතීත වර්තමාන වශයෙන් සම්බන්ධ වේ.

15 පිටුවට.....

පූජ්‍ය ගලගෙදර රතනවංශ හිමි



# කාලිංග දේශයෙන් සිරිලකට වැඩම වූ ඇසිරිමත් දන්ත ධාතූන් වහන්සේ

තුන්ලෝකාග්‍ර වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ සියලු බුදු කිස නිමකොට ආයු සංස්කාරය අතහැර කුසිනාරා නුවර මල්ල රජදරුවන්ගේ උපවත්තනම් සල් වනයෙහි ''වෙසක් පොහෝද'' පිරිනිවන් පා වදාළ සේක. මෙම සිද්ධිය සැලවීමෙන් පසු කුසිනාරා නුවරට රැස් වූ මල්ල රජදරුවන් රාජකීය පිරිස එවකට ශාසන භාරධාරීව සිටි මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේ උපදෙස් පරිදි විශේෂ සඳුන් දර සෑයක් මත ශ්‍රී දේහය තැන්පත් කොට ආදාහන කටයුතු කළහ.

ඉන්පසු ඉතිරි වූ ධාතූන් වහන්සේලා බෙදා ගැනීම සඳහා දිව්‍ය, බ්‍රහ්ම, ශාක්‍ය, ක්‍ෂත්‍රිය, කෝලිය, මල්ලව, ලිච්ඡවී යන විවිධ පිරිස් ඒකරාශී වූහ. මේ නිසාම මෙම පිරිස අතර ගැටුමක් නිර්මාණය විය. මේ අවස්ථාවේ ඉදිරිපත් වූ ද්‍රෝණ බමුණා ධාතු කොටස් නැලි අටකට බෙදා වෙන් කළේය. එයින් එක් දළදාවක් දෙවියන්ටද, ගණ්ධාරයට එක් දළදාවක්ද නා ලොවට එක් දළදාවක්ද , කාලිංග තවත් දළදාවක් ද වශයෙන් සතර දළදාවක් බෙදා දුණි.

ලක්දිව රජකළ මහසෙන් රජතුමා, කාලිංග දේශයේ ගුහසීව රජු සමග දැඩි මිත්‍රත්වයක් පවත්වාගෙන ගියේ ය. පාඨලී පුත්‍ර නගරයේ විසූ පණ්ඩු රජු ගුහසීව රජුට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කළේය. මෙම අවස්ථාවේ තම අමාත්‍ය මණ්ඩලය රැස්කොට, දන්ත ධාතූන් වහන්සේ ආරක්‍ෂා කරගැනීම සඳහා සාකච්චා කළහ. අවසානයේ තීරණය වූයේ දන්ත ධාතූන් වහන්සේ (තම්බපණ්ණි) යැවීමටය.

මේ සඳහා මෞර්ය වංශික කුමාරයෙකු වන දන්ත කුමරුද, තම දියණිය වූ හේමමාලා කුමරිය ද සූදානම් කරවීය. මදක් වක්‍රාකාරව රන් කරඬුවක් සකස් කොට දන්ත ධාතූන් වහන්සේ, එහි තැන්පත් කොට හේමමාලා කුමරියගේ කේශ කලාපයේ සැඟවීය. දෙදෙනාටම අවශ්‍ය ආරක්‍ෂාවට පිරිසක්ද මාර්ගෝපකරණ ද ලබා දී රුවල් නැවකින් සිරිලකට පිටත් කර හැරියේය. කුණාටුවකට හසු වූ මෙම රුවල් නැව දකුණුලක වාලුකා තීර්ථය නම් තොටුපලකට සේන්දු විය. වැලි සහිත භූමි භාගයක් වූ මෙම ස්ථානය ''කීර වාළුකා'' යන නමින් හැඳින්විය. රුවල් නැවෙන් බැසගත් මෙම පිරිස, එහි නවාතැන් ගත්හ. වර්තමානයේ ''වැලිඕවිට'' යනුවෙන් හඳුවන ස්ථානයක කුඩා ස්තූපයක් කරවා දන්ත ධාතූන් වහන්සේ තැන්පත් කොට පුදපූජා පැවැත් විය. වර්තමානයේ ''ලංකා පටුන'' ටන නමින් හැඳින්වෙන ප්‍රදේශයේ හේමමාලා කුමරිය, දන්ත කුමරු පිරිස ප්‍රධාන පිරිස පදිංචි විය.

ක්‍රි.ව.305 දී මෙරට රජකළ කිත්සිරි මෙවන් රජතුමා දන්ත ධාතූන් වහන්සේ පිළිබඳ තොරතුරු දැනගෙන, එම ස්ථානයට පිරිවර සහිත ගොස් දන්ත ධාතූන් වහන්සේ පිළිගෙන, අභයගිරි විහාරයට මහපෙරහැරින් වැඩම කරවා විශේෂයෙන් සාධන ලද මණ්ඩපයක තැන්පත් කොට පුදපූජා විධි පැවැත්වීය. මෙම තොරතුරු දළඳා වංශයෙහි විස්තර කර දක්වා තිබේ. දන්තධාතූන් වහන්සේ, ආරක්‍ෂා කරන තැනැත්තා රාජ්‍යයේ උරුමකරු ලෙස සැළකීමද මෙතැන් සිට සිදුවිය. දළදා වහන්සේ ආරක්‍ෂා කිරීම දිවි දෙවැනි කොට සැළකූ රජවරු තම රාජමාළිගය අසළම දළදා මන්දිරයදව සෑද වීය.පස්වෙනි මිහිඳු රජු දවස සිදු වූ චෝල ආක්‍රමණය නිසා දන්තධාතූන් වහන්සේගේ ආරක්‍ෂාව සඳහා රුහුණු ප්‍රදේශයට වැඩම කරවන ලදි.

පොළොන්නරු රජකළ මහ පැරකුම්බා රජතුමා දළදා මාළිගාවක් සාදවා එහි තැන්පත් කොට පුද පූජා පැවැත්විය. කාලයක් ගතවීමෙන් පසු පොළොන්නරු රාජධානියට එල්ල වූ සොළී ආක්‍රමණ නිසා එතැනින් කොත්මලේ ''සුපුල් පිටිය'' විහාරයට වැඩම කරවූ දළදා වහන්සේ එහි කාලයක් වැඩ විසීය. තුන්වන විජය බා රජතුමා දඹදිව රාජ්‍ය ආරම්භ කිරීමෙන් පසු, දන්ත ධාතූන් වහන්සේ තම රාජ්‍යයට වැඩම කරවාගෙන පූජා විධි පැවැත්විය. කලක් ගතවීමෙන් පසු, පළමුවන බුවනෙකබා රජතුමා යාපහු රාජධානිය නිර්මාණය කර එහි විශේෂ දළදා මන්දිරයක් සාදවා පෙරහරින් දන්තධාතූන් වහන්සේ වැඩම කරවා පෙරහැර පැවැත්විණි.

දෙවන බුවනෙකබාහු රජතුමා දන්ත ධාතූන් වහන්සේ කුරුණෑගල රාජධානියට වැඩම කරවා පූජාවිධි පැවැත්විය. ඉන්පසුව, හතරවන බුවනෙකබා රජතුමා ගම්පළ රාජධානියට දන්ත ධාතූන් වහන්සේ වැඩම කරවා පෙරහැර පවත්වා ගෞරව දැක්වීය.

කෝට්ටේ රජකළ වීර අලකේශ්වර රජු කෝට්ටේ රාජධානියට පෙරහරින් දන්ත ධාතූන් වහන්සේ වැඩම කොට පූජාවිධි පැවැත්විය. හත්වන බුවනෙකබා රජු දක්වා දන්ත ධාතූන් වහන්සේ කෝට්ටේ රාජ්‍යයේ වැඩ විසූහ. කෝට්ටේ රාජධානියේ ඇති වූ ආරවුලක් නිසා දන්ත ධාතූන් වහන්සේ රට මැදට වැඩම කරවීමට, රජුට සිදුවිය. (කෝට්ටේ කලාලේ, දත මැද ගන්න රාළේ..) යන ප්‍රකාශයෙන් පෙනී යන්නේ ධාතූන් වහන්සේගේ ආරක්‍ෂාව සඳහා දළදා වහන්සේ රට මැදට වැඩම කළ බවයි. සබරගමුවේ දෙනගමු විහාරයේ වැඩ සිටි දන්ත ධාතූන් වහන්සේ සෙංකඩගල රජවූ විමලධර්මසූරිය රජතුමා, තම රාජ්‍යයට (කන්ද උඩරටට) වැඩම කරවූ බවයි. වංශ කතාවල සඳහන් වන්නේ, දන්ත ධාතූන් වහන්සේට පෞරාණික රාජනියමයන්ට අනුව පුදපූජා පෙරහැ පැවැත්වීම සිදු කරනු ලබයි.

දන්ත ධාතූන් වහන්සේ නිසා හෙළ සංස්කෘතියත්, සාහිත්‍යයත් පෝෂණය වූ බව නොරහසකි. සංස්කෘතික අංගවලින් සමන්විත වන අභිමානවත් දළදා පෙරහැර දෙස් විදෙස් සුපතළ වූවකි. ලොව පිළිගත් කලා මංගල්‍යයක් ලෙසට '' දළදා පෙරහැර'' පරිවර්තනය වී තිබීම ලාංකික බෞද්ධ ජනතාවට අභිමානයක් ඇති කරවයි. ලංකාවේ ප්‍රධාන නගර හා විහාරස්ථාන කේන්ද්‍ර කරගෙන පෙරහැර පැවැත්වෙන්නේද, දන්ත ධාතූන් වහන්සේට උපහාර පිදීම සඳහාය. ජීවමාන බුදුරජාණන් වහන්සේ ලෙෂ සැළකෙන දන්ත ධාතූන් වහන්සේගේ තොරතුරු ධාතුවංශය, දළදා සිරිත,දළදාවත,දළදාහටන, යන හෙළ ග්‍රන්ථ වලින් තොරතුරු මනාකොට විස්තර කර තිබේ. හෙළ බෞද්ධ උරුමය ලෝ පැතිරේවා යනු පැතුම වේ.

**ඇම්.ඩී.විජයවර්ධන**

**09 පිටුවෙන්.....**

2 එම හිතකර දේවල්හි පමණ දැනගත යුතුය.

3 නියමිත වේලාවට බෙහෙත් පාවිච්චි කළ යුතුය.

4 රෝගයෙහි නියම තත්වය උපස්ථායකයාට දැන්විය යුතුය.

5 දුක් වේදනා විඳ ගැනීමට ධෛර්යය උපදවා ගත යුතුය.

බුදුරදුන් යනු මෙලොව පහළ වූ අති ශ්‍රේෂ්ඨතර මානසික වෛද්‍යවරයාණෝය. ශ්‍රේෂ්ඨ වූ පරිසර වේදියාණෝ ය. උන්වහන්සේගේ බුදු මුවින් දෙසා වදාළ කායික හා මානසික නිරෝගී සුවය සඳහා අදාළ වන ප්‍රතිකර්ම පිළිවෙත් අපි ඉදිරි කළාප වලදී හඳුනා ගනිමු.

**06 පිටුවෙන්....**

බුද්ධ ධර්මය බොරු යැයි සිතුවහොත් වහාම හෝ ප්‍රමාද වීමෙන් එහි ප්‍රතිඵල ඔබගේ ජීවිත කාලයෙහි ලැබේවි.ඔබ දහම් කරුණු පතුරුවා හරී නම් මතු උපදින ආත්මයෙන් ආත්මය ඔබට නුවණ හා ඥාණය ලැබේවි.

ඔබ මේ ජීවිත කාලයේ දී ධර්මයට නින්දා කළහොත් ඊළඟ ආත්මයේ දී ඔබ තිරිසන් කෙනෙකු වේවි. ඔබ ධර්මය පිටපත් කරයි නම් ඊළඟ ආත්මයේ දී ඔබෙන් පැවතෙන්නන් ට හොඳ අධ්‍යාපනයක් ලබා සතුටින් ජීවත් විය හැක.

ඔබ ධර්මය කියවා පිළිපැදියහොත් ඔබ කරන සෑම ක්‍රියාවකටම බුදුසරණ ලැබෙනු ඇත. ඔබ බුද්ධ ධර්මයේ හරය ගැන නිතර සැක සිතන්නේ නම් මුගලන් රහතන් වහන්සේගේ මව දුකින් මුදා ගත් සැටි මෙනෙහි කරන්න.

මේ ධර්මය පිළිබඳ ලියා අවසන් කළ නොහැක. හොඳ ක්‍රියාවන්හී හොඳ ප්‍රතිඵල යථා කාලයෙහි ලැබේවි.

ඔබ බුද්ධ ධර්මය තදින්ම විශ්වාස කළහොත් අවසානයේදී ඔබට නිවන් මඟට ළඟාවිය හැක.

හේතුව හා ඵලය ඔබ ඉහත ආත්මයේ දී කළ යහපත් ක්‍රියා ඊළඟ ආත්මය ගොඩ නැඟීම සඳහා ඉවහල් වනු ඇත. ඔබ මේ ආත්මයේ දී රෝපණය කරන්නාවූ හොඳ බීජ තුළින් ඊළඟ ආත්මයේ හොඳ ඵල ලබාගත හැක.

**iii පිටුවෙන්....**

අපට පෙනෙන මෙම ලෝකයේ මිනිස් විෂමතාවය පිළිබඳ කරුණු පැහැදලි කරන බුදුරජාණන් වහන්සේ මඃනිඃ චූල්ල කම්ම විභංග සූත්‍රයේදි "කම්මස්සකා මානව සත්තා කම්ම යොනි කම්ම බන්ධු කම්ම පටිසරණා කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතාය" (මානවකය සත්වයෝ කර්මය ස්වකීය කොට ඇත්තාහුය. කර්මය පිළිසරණ කොට ඇත්තාහුය. කර්මය සත්වයා උස් පහත් වශයෙන් බෙදන්නේය.) ආදී වශයෙන් දේශනා කළහ.

එනම් අපේ ජීවිත වල තීරණය නොහොත් අඩුපාඩු හා විෂමතාවය සිදු කරනු ලබන්නේ කර්ම න්‍යාමය විසිනි. එබැවින් කර්මය පිළිබඳව අඩු තක්සේරුවක් නොකළ යුතුය. බුදු රජාණන් වහන්සේ තවත් තැනක කර්ම පිළබඳව සත්වයාගේ උස් පහත් ස්වභාවය පෙන්වාදීමේදී මෙලෙස දේශනා කොට ඇත.

නජච්චා වසලෝ ලොති
නජච්චා හෝති බ්‍රාහ්මණෝ
කම්මනා වසලෝ හෝති
කම්මනා හෝති බ්‍රාහ්මණෝ

ජාතියෙන් වසලයෙක් හෝ බ්‍රාහ්මණයෙක් නොවන බවත් කරන කර්මයට අනුව වසලයෙක් හෝ බ්‍රාහ්මණයෙක් වන බවත් දේශනා කළසේක.

මේ ආදී වශයෙන් කර්ම බලවේගය හා එහි ප්‍රතිසන්ධි විපාක පිළිබඳව තරමක අවබොධයක් අපට ලබා ගැනීමට පුළුවන. අද බහුතරයක් අකුසල් සිදු කරන්නේ කර්මය පිළිබඳ ගැඹුරු අවබෝධයක් නොතිබීම හේතුවෙනි. කර්මය ඒ විගසම විපාක නොදීමත්, එය පෙනෙන දෙයක් නොවීමත් නිසා සමහර දෙනෙකුට එහි විපාකය දැක ගැනීමට තරම් විඤ්ඤාන ශක්තියක් නොතිබීම එයට ප්‍රධාන වේ. නමුත් අපට නොපෙනෙන තරමටම, ස්පර්ශ කිරීමට නොහැකි තරමටම යම් යම් දේවල් අඩු තක්සේරුවක් නොසිතිය යුතුය. අපේ ඉන්ද්‍රියන් වලට ගෝචර නොවන බොහෝ දේවල් අඩු තක්සේරුවක් නොසිතිය යුතුය. අපේ ඉන්ද්‍රියන් වලට ගෝචර නොවන බොහෝ දේවල් මේ විශ්වය තුළ ඇත. ප්‍රඥාවටම මුල් තැන දී ගවේෂණය කර අවබෝධ කරගන්නවා හැර සාමාන්‍ය බුද්ධි මට්ටමකට එම බලවේග හසු නොවේ.

ඉහතින් සඳහන් කරන ලද කර්මය සතු බලවේග තිබුනද සෑම කර්මයක්ම එක ලෙස විපාක දීමක් සිදු නොවේ. ඒ අනුව

1. දිට්ඨ ධම්ම වේදනීය (එම ජීවිතයේදීම විපාක දෙන)

2.උපපජ්ජ වේදනීය (ඊළඟ භවයේ විපාක දීම) පංචානන්තරිය කර්ම, ප්‍රථම ධ්‍යානදී කුසල කර්මත් එයට හසු වේ.

3. අපරාපරිය (ප්‍රබල නොවූ කර්ම සත්වයාගේ කර්ම ශක්තියට එකතු වී සසර කවදා හෝ විපාක දීම)

4 අහෝසි කම්ම (ඉහත සඳහන් කළ අවස්ථා තුනේදී විපාක දීමට තිබී යම් හේතුවකින් විපාක නොදුන් කර්ම බොහෝ දුරට නැවත විපාක නොදීමට පුළුවන.)

විශේෂයෙන් බෞද්ධයන් වශයෙන් අපි සැම දෙනෙක්ම මෙම කර්ම බලවේගය හා ප්‍රතිසන්ධි විපාකය මීට වඩා හැදෑරිය යුතු අතර, කුසල කර්ම තව තවත් කිරීමටත් අකුසල කර්ම දුරින්ම දුරු කිරීමටත් වග බලා ගත යුතුය. චුති චිත්තයට අනුව අපේ ඊළඟ භවය කුමන පැත්තකට යොමු වෙයිදැයි කීම අවිනිශ්චිතය. මෙලොවදී සැප සම්පත් ඇතිව නිල බල මත ජීවත් වුවද නැවතත් එම සැප සම්පත් ඇතිව එම ජීවිතයම ලැබේයයි සිතීමට අපහසුය.

බුදු රජාණන් වහන්සේ සඃනිඃ බ්‍රහ්මණ සංයුත්තයෙ උදය සූත්‍රය තුළින් දේශනා කර ඇත්තේ,

පුනප්පුනං ජායති මීයතීච -
පුනප්පුනං සීවථිකං හරන්ති
මග්ගඤ්ච ලද්ධා අපුනබ්භවාය - න
පුනප්පුනං ජායති භූරි පඤ්ඤෝ වශයෙනි.

සත්වයා නැවත නැවත උපදී. නැවත නැවත මිය යයි. නැවත නැවත සොහොනට ගෙන යති. නිවන් ලැබූ නුවණැත්තා නැවත නූපදිය.

ඒ අනුව නැවත නැවත උපදින වාර අපට කීමට අපහසු වුවද ඒ උපදින ආත්ම භාවයන්හි සතර අපායන්හි නොඉපදීමටත් මනුෂ්‍ය, දිව්‍ය ආත්ම ලබා ගැනීමටත් උත්සාවන්ත විය යුතුය. ඒ සියලුම ලෞකික සැපයන් අත් හැර නැවත නොඉපදෙන තැනට වැඩ කටයුතු කර ගැනීමට තම තම ඥාන පමණින් වග බලා ගත යුතුය. ඒ සඳහා කර්ම බලවේගය හා ප්‍රතිසන්ධි විපාක පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කර තම විමුක්තිය තමා විසින්ම සිද්ධ කර ගැනීමට සැමට ප්‍රඥා ඇස පහල වේවා යන්න මගේ ප්‍රාර්ථනයයි.

## සියලු දේ අනිත්‍යයි

පවත්නා යමක් වේ ද? එය වෙනස් වන සුලු ය. නොවෙනස් වන සුලු යමක් වේ ද එය දැනට නොපවත්නා දෙයකි.

ජීවිතය දෙස බලන අපට එය වෙනස් වන ආකාරයත් නිරන්තරයෙන් කිසියම් අන්තයන් හා අසමානකම් අතර සිදුවන චංචලභාවයත් පෙනේ. ඒ අනුව අපි නැගීම් බැසීම් ජය පරාජය ලාභ අලාභ ගෞරවය ප්‍රශංසා නින්දා ආදිය දනිමු. එමෙන්ම අප හද තුළ පහත පෙනෙ අවස්ථාවල ඇතිවන ප්‍රතිචාරයන් සතුට අසතුට සොම්නස දොම්නස තෘප්තිය කල කිරීම, බලාපොරොත්තුව හා බිය පිළිබඳ වින්දනයන් ද දනිමු. මේ ප්‍රබල අවේග සෝ රළ අප ඉහළට ගෙන ගොස් පහලට හෙලති. යළි වෙනත් රළ පෙළක ප්‍රවාහයට අසුවී ඇදී යයි. එසේ නම් එවන් රළ පෙළක බව සයුරක නිරන්තර කැලඹිලි මධ්‍යයේ අපි ජීවිතය නැමැති ගොඩනැගිල්ල කොතැනක ගොඩනැගිය යුතු ද?.

මේ ලෝකය කෙබඳුද? කිවහොත් කිසියම් සත්ත්වයෙකුට ලැබෙන සුළු සතුටක් ප්‍රමෝදයක් වුවද ලබාගත හැක්කේ නොයෙක් බලාපොරොත්තු සුන්වීම අසමත් වීම් හා පරාජයන්ගෙන් පසුවයි. මේ ලෝකයේ අල්ප වූ ප්‍රීතියක් වුව ද වැඩෙන්නේ ලෙඩ රෝග, කලබල මරණ ආදිය මද්දෙහි ය. මොහොතකට පෙර අප හා එක්ව කරුණා හරිතව තුටු පහටු වූ ඇතැම් අයෙක් ඊළඟ මොහොතේ දී අපගේ කරුණාව අපේක්ෂා කරන්නේය. ඒ මේ ලෝකයේ ආකාරයයි. එබඳු ලෝකයකට උපේක්ෂාව අවශ්‍යයි. අප ජීවත් වන ලෝකයේ ස්වභාවය කෙසේ දැයි කිවහොත් අද කුළුපග මිතුරන් සේ අප සමග ජීවත් වන්නන් ඊළඟ දවසේ අපේ පරම හතුරන් විය හැකි ය. බුදුරජාණන් වහන්සේ විසින් මෙලොව විස්තර කරන ලද්දේ අනවරාග්‍ර සංසාරය වශයෙනි. සියල්ල වෙනස් වන සුලුය. නිරතුරුවම විවිධ ස්වරූප ඇතිවන්නේ ය. නිමක් නොමැති විපර්යාසයන් සහිත ගලායන දිය දහරක් බඳුය. සියල්ල ඇති වීමත් නැතිවීමත් නොනැවතී මාරුවෙන් මාරුවට සිදු වෙයි.

සියල්ලෝම ඉපදීමේ සිට මරණය දක්වා දිවෙති. ජීවිතය මරණය දෙසට නොනැවතී යන විපර්යාසවලියකි. ජීවිතය සැදුම් ලද ද්‍රව්‍යමය හා ද්‍රව්‍යමය නොවූ ආකෘතීන් අතොරක් නොමැතිව වෙනස් වෙමින් ජරාව දෙසට යයි. මේ අනිත්‍ය ස්වභාව ධර්මය බුදුසමයේ මධ්‍ය කූටයන්ගෙන් එකකි. මේ පොළොව මත පිහිටි කිසිවක් පරම සත්‍යයේ ලක්ෂණ ප්‍රතිග්‍රහණය නොකරයි. ඉපදුණු යමෙකුට නොමැරී සිටිය නොහැකිය. හටගත් සියල්ල වැනසීමට යටත් වේ. වෙනස් වීම සත්‍යයේ නියම අංගයක් වේ. බුදුරදුන් අනිත්‍ය සිද්ධාන්තය පිළිගත් අතර ස්ථිර පැවැත්මක් ඇති ද්‍රව්‍ය මූලයක් නැතැයි දේශනා කොට ඇත.

බුදුරදුන් අනාවරණය කරනු ලැබූ වෙනම් වීම න්‍යාය අද විද්‍යාඥයෝ පිළිගනිති. ඔවුන්ගේ නිගමනය වන්නේ මෙලොව කිසිවක් ස්ථිර සාර හෝ ස්තබ්ද හෝ ස්පර්ශ කළ හැකි නොවන බවය. සියල්ල බලවත් සුළියක් බඳුය. මොහොතක් පාසා එකම ආකාරයෙන් නොපවතී. මුළුමහත් ලෝකයම වෙනස් වීම නැමැති කැරකෙන සුළියට මැදි වී ඇත. විද්‍යාඥයන් තීරණය කර ඇති තවත් නිගමනයක් නම් සූර්යයාගේ විනාශය හෝ මරණින් පසු සියල්ල අවසන සීතලී කරණයට ඉඩ ඇති බවය. එබඳු බලාපොරොත්තුවකින් බෞද්ධයෝ උකටලී නොවෙති. බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇති පරිදි විශ්වය හෙවත් සියලු ලෝකාවාටයන් ඉපදීම නැතිවීම ආශ්‍රිත අනන්ත ක්‍රියාවලිවය අයත් වන බවය. හැම කෙනෙකුගේම ජීවිතය එබඳු වේ. අප සිටින ලෝකය නියත වශයෙන්ම අවසාන වන්නේ ය. පූර්වයෙහි පැවති ලෝක ද එවැනි තත්ත්වයට පත් වී ඇත. යළිත් එය එසේ ම සිදුවන්නේ ය.

ලෝකය නික්මීම ස්වභාව කොට ඇත්තේ ය. අප සියලු දෙනාම කාලයට අයත් වන්නේය. සියලු ලිඛිත පද-සෙල් ලිපි-ආලේඛිත චිත්‍ර ශිෂ්ටාචාරයේ ව්‍යුහය හා සියලු මානව පරම්පරාත් ග්‍රීෂ්මකාලයේ දී වියලී හැලී අමතක වී යන්නේ ය. මල් කොළ සේ නොපෙනී යන්නේ ය. එබැවින් පවතින සියලු දේ වෙනස්වන සුළුය. වෙනස් නොවන කිසිදු දෙයක් පවත්නේ නැත. ඒ අනුව දෙවියන් - මිනිසුන් සිවුපාවුන් හා රූපකායන් ආදී මේ විශ්වයේ ඇති සියලු දේ අනිත්‍ය න්‍යායයට යටත් බැව් බුදු සමය අපට උගන්වයි.

සිරුර පෙන පිඩක් සේ ,හැඟුම දිය බුබුලක් සේ, සඟැනුම මිරිඟුවක් වේ,චෙතනාරැස රඹ තුරක් සේ,සිහිනුවණ ඉන්ද්‍රජාලයක් බඳුය.

සංයුක්ත නිකාය (පොතපත ඇසුරිනි)

මහේෂ් සේනාධීර

# දුක පංචස්කන්ධය නොව පංච උපාදානස්කන්ධයයි



පංචස්කන්ධය සහ පංච උපාදානස්කන්ධය මූලික බුදු සමයේ විග්‍රහ වන ගැඹුරු සංකල්ප දෙකකි. පුහුදුන් සත්වයින්ට නිවැරදිව තේරුම් ගැනීමට ඉතා අපහසු ධර්මතාවයකි. බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම දහම දෙසුම වූ ධම්මචක්කපවත්තන සූත්‍රයෙහි දක්වා ඇත්තේ කෙටියෙන් ම කියතොත් පංච උපාදානස්කන්ධයම දුකයි යනුවෙනි. එසේම ඛන්ධ සූත්‍රයෙහි දුක නම් පංච උපාදානස්කන්ධය මැයි සඳහන් වේ. බුදුදහම තුළ මෙවන් පසුබිමක් ඇති පංචඋපාදානස්කන්ධය සහ පංචඋපාදානස්කන්ධය පිළිබඳ යථා අවබෝධය අතිශයින් වැදගත් වූවකි.

වරක් මාරයාගේ පැණයකට පිළිතුරු දෙන වජිරා තෙරණියෝ මෙසේ පැවසූහ. සත්වයෙකැයි ඇදහීම මාර දෘෂ්ටියකි. මෙහි ඇත්තේ සංස්කාර පිණ්ඩයකි. අවයව සමූහය හේතු කොට ගෙන රථයයැයි කියන්නා සේ පංචඋපාදානස්කන්ධය ඇති කළ සත්වයා යන ව්‍යවහාරය ඇතිවේ.

මෙම ප්‍රකාශයට අනුව පැහැදිලි වන්නේ සත්ත්වයා පුද්ගලයා මිනිසා මම යන සංකල්ප ලෝක ව්‍යවහාර ඇතිව තිබෙන්නේ ස්කන්ධ එකට එකතු වී පැවතීම නිසාය. සත්ත්වයා පිළිබඳ තත්වූ පරිද්දෙන් අවබෝධ වීම පිණිස බුදුසමය සකන්ධ විශ්ලේෂණය කොට දක්වා ඇත. සමස්තය දැකීමේ දි ඇති වන මුලාවන් විශ්ලේෂණය කර බැලීමෙ දී ඇති නොවේ.

**01. රූප ස්කන්ධය**

රුප්පතීති බෝ භික්ඛවේ තස්මා රූපංති වුච්චති

ස්වාභාවික හේතුන් මත එසේම බාහිර උවදුරු මත සිඳ බිඳී යාමේ ස්වභාවය කොට ඇත්තේ රූපයයි. රූපය යනු සත්ත්ව ශරිරයයි.

**02. වේදනා ස්කන්ධය**

වේදයතීති බෝ භික්ඛවේ තස්මා දේවනාති වුච්චතී

වේදනාව යනු විඳ දරා ගැනීමය. එම විඳ දරා ගැනීමේ ක්‍රියාවලිය සුඛ, දුක්ඛ, උපේක්ෂා යනුවෙන් ත්‍රිවිධ වේ.

**03. සඤ්ඤා ස්කන්ධය**

සංජානාති බෝ භික්ඛවේ තස්මා සඤ්ඤාති වුච්චති

සංඥා යනු හඳුනා ගැනීමයි. මෙම හඳුනා ගැනීම ගොඩනැගෙන්නේ පුද්ගලයා විඳිනු ලබන වින්දනයට අනුවය.

**04. සංස්කාර ස්කන්ධය**

සංස්කාර යනු මානසික කරන සකස් කර ගැනීමයි.

**05. විජානාතීති බෝ භික්ඛවේ තස්මා විඤ්ඤානන්ති වච්චති**

දැන ගැනීම සිදුකරන බැවින් විඤ්ඤාණ නම් වේ. එනම් ඉන්ද්‍රියනුසාරීව ලබන දැනීම් විශේෂයයි.

මෙම පංචස්කන්ධය තනි තනිව නොපවතියි. මේවා අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධව පවතී. එසේ පැවතිමට සත්වයා පුද්ගලයා මම යන ව්‍යවහාර භාවිත වෙයි.

මෙම ස්කන්ධ ධර්මවලට මනසින් දැඩිසේ බැදීම, දැඩි සේ අල්වා ගැනීම, උපාදානය යනුවෙන් හැඳින්වේ. ඒ අනුව බුදුදහම දුක යනුවෙන් හඳුන්වන්නේ රූප ස්කන්ධය නොව රූප දැඩි සේ අල්වා ගැනීම හෙවත් රූප උපාදානයයි. එසේම වෙදනාව නොව සඤ්ඤා නොව සඤ්ඤා උපාදානය දුක් වෙයි. වේදනා උපාදානය දුක්වෙයි. සඤ්ඤා නොව සඤ්ඤා උපාදානය දක් වෙයි. විඤ්ඤාණ නොව විඤ්ඤාණ උපාදානය දැක්වෙයි. මෙසේ පංචස්කන්ධය නොව පංච උපාදානස්කන්ධය දුක් වෙයි.

හුදු ස්කන්ධ වශයෙන් පමණක් මේවා පවතී නම් අධ්‍යාත්මික වශයෙන් ගැටලුවක් නොමැත. සසර පැවැත්මට ශක්තියක් නොවේ. උපාදානය නැමැති ක්‍රියාවලිය හා සම්බන්ධ වීමෙන් සංසාර වශයෙන් පැවැත්ම ඇති කරවන ශක්තියක් බවට පත්වේ. මෙම උපාදානස්කන්ධ පෝෂණය සිදුවන්නේ පුද්ගලයා විසින් ඉන්ද්‍රියානුසාරිව දනීම් හේතුවෙනි.

පුද්ගලයා ඉන්ද්‍රියානුසාරව ලබන අරමුණු කෙරෙහි ලොල්වීම නිසා, බැදීම නිසා නිරන්තරයෙන් මෙම උපාදානස්කන්ධ පෝෂණය වේ. මජ්ඣිම නිකායේ මහා හත්ථිපදෝපම සූත්‍රයෙහි ඉන්ද්‍රිය ඥාණය පහළවීම පිළිබඳ සඳහන් වේ. ඉන්ද්‍රිය හා බාහිර අරමුණු තිබුණු පමණින් උපාදානස්කන්ධ පෝෂණය සිදු නොවේ. ඒ සඳහා පුද්ගලයාගේ මානසික අවධානය අවශ්‍ය වේ. යම් රූපයක් ඇසට ගෝචර වී චක්ඛු විඤ්ඤාණඛයක් පහළ වීමට පහත සඳහන් කරුණු සම්පූර්ණ විය යුතුය.

**මනා ලෙස ක්‍රියාකාරි ඇසක් තිබිය යුතුය (චක්ඛු අපරිභින්නං හොති)**
**බාහිර වශයෙන් රූප අරමුණක් තිබිය යුතුය (බාහිරා රූපං ආපාථං ආගච්ඡති)**
**මානසික වශයෙන් අවධානය යොමු වීම. (තජ්ජෝ සමන්නාහාරෝ හොති)**

ඉහත සඳහන් කාරණා තුන සම්පූර්ණ වීමෙන් චක්ඛු විඤ්ඤාණයක් පහල වේ. යම්කිසි රූපයකි යන දැනීම ඇති වේ.

1. ඒ රූපය රූප උපාදානස්කන්ධයෙහි සංග්‍රහ වෙයි.

2. ඒ රූප උපාදානය නිසා ලැබෙන වින්දන වේදනා උපාදානස්කන්ධයෙහි සංග්‍රහ වෙයි.

3. ඒ වින්දන උපාදානය නිසා ලැබෙන හැදින්වීම් සඤ්ඤා උපාදානස්කන්ධයෙහි සංග්‍රහ වෙයි.

4. ඒ හැඳිවීම් උපාදානය නිසා අරමුණු පිළිබඳව ඇති කරගන්නා අභිසංස්කණයන් සංඛාරූපාදාන ස්කන්ධයෙහි සංග්‍රහ වෙයි.

5. ඒ අනුව නැවත නැවත ලබන අරමුණු දැනීම් පිළිබඳ උපාදානය විඤ්ඤාණ උපාදානස්කන්ධයෙහි සංග්‍රහ වෙයි.

මේ ආකාරයෙන් පංච ඉන්ද්‍රියයන් ම අනුසාරයෙන් ලබන අත්දැකීම් මගින් පංච උපාදානස්කන්ධ පෝෂණය කරගැනීම් සිදුවේ. අශ්‍රිතවත් පුහුදුන් පුද්ගලයා කණුවක බඳනා ලද සුනඛයෙකු කණුව වටා දුවටෙන්නා සේ මමය. මාගේය, මම වෙමි, යන සංකල්පයෙන් උපාදානස්කන්ධවල ම දුවටෙන බව සද්ධර්මයේ සඳහන් වේ. මෙහිදී සිදුවන්නේ උපාදානස්කන්ධ තණ්හා, මාන, දිට්ඨි වශයෙන් ගැනීමයි.

1. එතං මම (එය මාගේය) - තණ්හා

2. එසෝ අහං අස්මි (ඒම ම වෙමි) - මාන

3. එසො මෙ අත්තා (ඒ මගේ ආත්මයයි) - දිට්ඨි

මේ ආකාරයට ස්කන්ධ ක්‍රියාකාරිත්වය උපාදානය කරයි. උපාදානය නොමැති තැන රූප වේදනාදිය ස්කන්ධ වශයෙන් පවතී. පංචස්කන්ධය කෙරෙහි ඇල්ම ආශාව බැඳීම නැති වූ විට පංච ස්කන්ධ සංඛ්‍යාත මහා දුක්ඛස්කන්ධයෙන් මිදුනේ යන මහානුවණ යථාවබෝධය ඇති වෙයි. මෙම තත්වය පිණිස ශ්‍රැතවත් ශ්‍රාවකයා පංච ස්කන්ධය දෙස අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් මෙනෙහි කරමින් විදර්ශනා ඥානයෙන් නිවන් පසක් කරයි.

පූජ්‍ය උල්පතේගම අනුරුද්ධ හිමි